ISSN 2279-2120

# ප්‍රලේඛා

3 වෙළුම 3 කලාපය 2014 ජූලි - සැප්තැම්බර් ත්‍රෛමාසිකය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

අධ්‍යාපන සේවා අමාත්‍යාංශය

# ප්‍රලේඛා

03 වන වෙළුම - 03 කලාපය

**ISSN 2279-2120**

උපදේශකත්වය
**මහාචාර්ය සෝමරත්න බාලසූරිය**
සභාපති

සංස්කරණය
**මාලිනි ගෝවින්නගේ**

සම්බන්ධීකරණය
**මෛත්‍රී ජයසුන්දර**
සහකාර අධ්‍යක්ෂ

පිටු සැලසුම හා කවර නිර්මාණය
**ප්‍රේම් දිසානායක**
ෆාස්ට් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ප්‍රකාශනය
**ව්‍යාප්ති සේවා**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන: 011-2687583, 011-2698847-283
ෆැක්ස්: 011-2674387
ඊ මේල්: pub@mail.natlib.lk
වෙබ් අඩවිය: www.natlib.lk

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

කලාපයක මිල: රු. 100.00
වාර්ෂික දායකත්වය: රු. 400.00

චෙක්පත් හා මුදල් ඇණවුම්:
සභාපති, ජාතික පුස්තකාල හා
ප්‍රලේඛන සේවා මණ්ඩලය,
නමට යොමු කරන්න.

මුද්‍රණය:
ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10.

අපේ ලිපිනය:
ප්‍රලේඛා
ව්‍යාප්ති සේවා අංශය,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.

## සංස්කාරක සටහන

පුවත්පත් වාර්තාකරුවකු ලෙස වෘත්තීය ජීවිතය ඇරඹූ ගබ්රියෙල් ගර්සියා මර්කෙස් (ස්පාඤ්ඤ උච්චාරණය) කෙටිකතා රචනයට ද, ඉක්බිති චිත්‍රපට විචාරයට හා තිරපිටපත් රචනයට ද, ඉන් පසු නවකතාකරණයට ද පිවිසියේය. සියවසක් හුදකලාවෙ නමින් සිංහලට නැඟී ඇති Cien anos de soledad කෘතිය සඳහා 1982 දී ඔහුට සාහිත්‍යය සඳහා පිදෙන නොබෙල් සම්මානය ලැබුණේය. 'ඉන්ද්‍රජාලික යථාර්ථවාදය' නම් රචනා රීතිය ජනප්‍රියත්වයට පත් කළ ලේඛකයා ලෙස බටහිර විචාරකයෝ ඔහු හඳුන්වති. ඒ අනුව යන අපේ ඇතැම් විචාරකයන් හා සාහිත්‍යවේදීහු ද නොසොයා නොසිතා එයම ප්‍රකාශ කරති. "මර්කෙස් පරිකල්පනය උන්මාද ලෝකයක් මවයි. එය ඉන්ද්‍රජාලික යථාර්ථයකි." ඔවුහු කියති. ඉන්ද්‍රජාලිකයා යනු විජ්ජාකාරයාය. සැබැවින්ම, මර්කෙස් ලේඛකයා අමුතු මැවීමක් කළේ ද? නැත.

ජනතාව අතරට ගොස් ඔවුන්ගෙන් කරුණු විමසා දැන සිය වාර්තාව සකස් කරන පුවත්පත් වාර්තාකරුවකු සේ ඔහු සිය දේශයේ ඓතිහාසික සමාජ, සංස්කෘතික වියමන, එහි රටාව සහ පැහැයන් හඳුනා ගත්තේය. (මේ රටාව හා වර්ණ අඩු වැඩි වශයෙන් සමස්ත ලතින් ඇමෙරිකාවටම පොදුය.) පුස්තකාලයකට වී සැප පහසුවේ හිඳිමින් මනඃකල්පිත ප්‍රබන්ධ නොකළ ඔහු කළේ සත්‍ය වාර්තා ප්‍රබන්ධගත කිරීමය. මෙසේ ඔහු 'සියවසක් හුදෙකලාවේ' කෘතියේ දී දේශයක (කොළොම්බියාවේ) එක්තරා යුගයක වංශකතා ඉතිහාසය ලියයි. ලතින් ඇමෙරිකානු ජනතාව ඔහු හඳුනා ගන්නේ සිය මහාද්වීපයෙහි යථාර්ථය හඳුනා ගත් ලේඛකයා ලෙසය. මර්කෙස්ගේ අභාවයත් සමඟම කොළොම්බියාවේ, මැක්සිකෝවේ පමණක් නොව, සෙසු බොහෝ ලතින් ඇමෙරිකානු රටවල ද පුවත්පත්වල මුල් පිටුව 'ගබෝ' ගේ රුවෙන් ද ඔහු පිළිබඳ තතුවලින් ද පිරුණේය. ඇතැම් පුවත්පත් මුළුමනින්ම ගබෝගේ පුවත් සඳහා කැපකොට තිබිණි. ඔහු මියගිය සතියේ ලතින් ඇමෙරිකානුවනට වැදගත් වූයේ අවශේෂ ලෝකය නොව, ගබෝම පමණි. මන්ද, ඔහු ඔවුන් හඳුනාගෙන සිටියේය. ඔහු ඔවුන් මවා නොපෙන්නුවේය. තරුණ මැක්සිකානු ලේඛකයකු, විචාරකයකු මෙන්ම මර්කෙස්ගේ මිතුරකු වන එමිලියෝ ලෙසාමා සිය ජොෂ්ඨ සගයා පිළිබඳව දරන අදහස් කිහිපයක් මා උපුටා දක්වන්නේ මර්කෙස් පිළිබඳව අපේ ලේඛක, පාඨක සමාජය තුළ පවත්නා දුර්මත බැහැර කිරීමේ අභිලාෂයෙනි.

ලෙසාමා මෙසේ කියයි. "සියවසක් හුදෙකලාවේ පොත ලිවීමෙන් ඔහු සමස්ත ලතින් ඇමෙරිකාව සඳහාම 'උත්පත්ති කතාවක්' (genesis) නිර්මාණය කළේය. ඒ උත්පත්ති කතාවේ නිජබිම සියවසක් හුදකලාවේ පොතෙහි සඳහන් මැකොන්ඩෝවයි. මර්කෙස් විබුද්ධයකු වන්නේ, ඔහුගේ පරිකල්පනයේ උන්මාදය හෝ ඉන්ද්‍රජාලිකය නිසා හෝ නොවේ; ලතින් ඇමරිකාවේ වියමනෙහි නූල ඔහු තෝරාබේරා හඳුනා ගත් බැවිනි." ඔහු මෙසේ ද සඳහන් කරයි. "බුවෙන්දියාගේ නිවෙස ගැන කියවූ අපි අපේ ආච්චි අම්මාගේ නිවෙස දුටුවෙමු. ෆ්ලොරන්තිනා අරියෝ, ෆර්මිනා ඩාසා අත්පත් කර ගැනීමට වෙහෙසෙනු කියවූ විට දුටුවේ අපේ මංමුළා සහගත පෙම් සබඳතාවන්ය. 'වංකගිරියෙ ජනරාල්' කියවද්දී අපේ බිහිසුණු ප්‍රජාතන්ත්‍රවාදයන් දුටිමු." යථාර්ථය මතුපිටින් ඇති ප්‍රබන්ධය විනිවිද දකිමින්, මර්කෙස් ඉන්ද්‍රජාලිකයකු නොවන බව සිත් තබාගෙන අපි මර්කෙස් කියවමු.

මෙහි පළවන ලිපි පිළිබඳ වගකීම අදාල ලේඛකයින් සතු වේ.

# අත්වැල

**ගබ්රියෙල් ගර්සියා මර්කෙස්** 3

**සියවසක හුදකලාව** 5
පරිවර්තනය : ජයසුමන දිසානායක

**ඉඳුදැල විනිවිද... මර්කෙස් කියවීමක්** 11
කැත්ලීන් ජයවර්ධන

**මහා අම්මාගේ මළගම** 18
පරිවර්තනය: ජයසුමන දිසානායක

**කීර්තියේ හුදකලාවත් බලයේ හුදකලාව වගෙයි** 33
පරිවර්තනය : ධම්මික සෙනෙවිරත්න

**මගේ සීයාගේ නිවෙස** 52
පරිවර්තනය: මන්තිකා

**සයිබර් අවකාශයේ අපේ කවිය** 68
හිනිදුම සුනිල් සෙනෙවි

**ලංකා පොකුණ (පද්‍යය)** 72
සුමින්ද කිත්සිරි ගුණරත්න

**ජඩ සාහිත්‍යය හා සම්භාව්‍ය සාහිත්‍යය** 73
කොලට් සේනානායක

**අසිරිමත් කළු කිවිඳිය** 76

**කලාවට නිදහස (විදෙස් පැදිය)** 81

**පොතක වත** 82




**ගබ්රියෙල් ගර්සියා මර්කෙස්**

(1927. 03. 06 - 2014. 04. 17)

කොළොම්බියානු මාධ්‍යවේදියෙකි. නවකතා හා කෙටිකතා රචකයෙකි.

උපත: කොළොම්බියාවේ අරකටාකා නුවර

අධ්‍යාපනය: කොළොම්බියාවේ ජාතික විශ්වවිද්‍යාලය

විවාහය හා දරුවෝ: මර්සිඩිස් බර්චා පාර්දෝ (බිරිඳ)

රොඩ්රිගෝ ගාර්සියා - පුතා

(රූපවාහිනී හා චිත්‍රපට අධ්‍යක්ෂ)

ගොන්සාලෝ - පුතා

(ග්‍රැෆික් චිත්‍රශිල්පී)

පොත්: (ගර්සියා මර්කෙස් ලේඛනයෙහි යෙදුණේ ස්පාඤ්ඤ භාෂාවෙනි. මේ වන විට ඔහුගේ කෘති බොහොමයක් ඉංග්‍රීසියට හා ලොව වෙනත් භාෂා රැසකට පරිවර්තනය වී ඇත.)

In Evil Hour
One Hundred Years of Solitude
The Autumn of the Patriarch
Love in the time of Cholera
The General in his Labrynth
Of Love and other Demons
Leaf Storm
No one Writes to the Colonel
Chronicles of a death forehold
Memories of my Meloncholy whores

කෙටිකතා එකතු: (මෙහි සඳහන්වන්නේ කිහිපයක් පමණි)

Eyes of a blue dog
Big Mama's funeral
The incredible and sad tale of
Erendira and her heartless grandmother

ඔහු විසින් රචිත ප්‍රබන්ධ නොවන කෘති රැසකි. ඔහුගේ කෙටිකතා හා කෙටි නවකතා බටහිර මෙන්ම ලතින් අමෙරිකානු හා ආසියානු සිනමාකරුවන් කිහිපදෙනෙක් සිය චිත්‍රපට සඳහා පදනම්කරගෙන ඇත.

ගබ්රියෙල් ගර්සියා මර්කෙස්ගේ කෙටිකතා හා නවකතා කිහිපයක්ම සිංහලට නැගී තිබේ.

සිය 'රාග රිද්ම' පරිවර්තන කෙටිකතා සංග්‍රහයේ ඇය ආ හෝරාව නමින් පළකරන ලද කෙටිකතාවෙන් ගාමිණී වියන්ගොඩ මර්කෙස් සිංහල පාඨකයාට හඳුන්වා දුන්නේය.

One Hundred Years of Solitude කෘතියෙහි සිංහල පරිවර්තන දෙකකි.

1. සිය වසරක හුදකලාව
   සාගර විජේරත්න

2. සියක් වසරක හුදකලාව
   අභය දිසානායක
   පසන් කොඩිකාර

Love in the Time of Cholera

කොළරා කාලේ ආලේ

Chronicles of a Death Foretold

කරුමක්කාර කතාවක්

ගාමිණී වියන්ගොඩ

No One Writes to the Colonel

කිසිවෙකු කර්නල්ට නොලියනු ඇත.

The Incredible sad tale of
Erendira and her heartless Grandmother

අහිංසක එරෙන්දිරා සහ හදවතක් නැති ඇගේ අත්තම්මාගේ කතාව

ජනක ඉණිමංකඩ

News of Kidnapping

පැහැර යාමක් පිළිබඳ ආරංචිය

පද්මා ගුණසේකර

Story of a Shipwrecked Sailor

මුහුදුබත් වූ සේලරුවකුගේ කතාව

පියල් කුමාර ජයරත්න

අනුෂා කොල්ලුරේ

ගර්සියා මර්කෙස් සහ ඔහුගේ නිර්මාණ මැයෙන් මර්කෙස්ගේ සංක්ෂිප්ත ජීවන චරිතය හා මර්කෙස්ගේ කෙටිකතා රසක පර්වතනයක්ද ටෙනිසන් පෙරේරා විසින් පළකොට තිබේ.





# සියවසක හුදකලාව

1982 දී සාහිත්‍යය සඳහා වූ නොබෙල් ත්‍යාගය දිනූ ගබ්‍රියෙල් ගර්සියා මර්කෙස් එම ප්‍රදානය ලත් අවස්ථාවේ දී කළ කතාව.

මුල් වරට ලොව වටා චාරිකාවක් යෙදුණ මැගලන්ගේ එක් සහයකයකු වූයේ ඉතාලියේ ෆ්ලොරන්ස් නුවර වැසි නාවික යාත්‍රිකයකු වූ අන්තෝනියෝ පිගෆෙටා (Antonio Pigafetta) ය. එම මුහුදු තරණයේ දී ඔහු දුටු අපගේ දකුණු ඇමෙරිකානු ගම්බිම් ගැන අපූරු විස්තරයක් ලියා ඇත. ඉතා නිවැරැදි වර්ණනයක් වුව එක් අතකින් එය සමාන වන්නේ මනඃකල්පිත දේශයක් පිළිබඳ විස්තර කිරීමකටය. එම විස්තරයට අනුව ඔහු දුටු සමහර සූකරයන්ගේ නාභිය පිහිටා තිබුණේ ඔවුන්ගේ පශ්චාත්භාගයේය. පහුරු ගෑමට නිය නැති දෙපාවලින් යුත් කිරිල්ලියෝ ඔවුන්ගේ පිරිමි සතුන්ගේ පිට මත බිජුලති. හැඳි වැනි හොට ඇති වෙනත් පක්ෂීහු දිව නැති පෙලිකන් කුරුල්ලන් මෙන් නිහඬව පසු වූහ. අඟපසඟ කලවම් වී උපන් අරුම පුදුම සත්වයකු දුටු බව ද ඔහු සඳහන් කරයි. හේ කොටළුවකුගේ හිස හා කන් ද, ඔටුවකුගේ සිරුර වැනි සිරුරකින් ද සැදි, මුවෙකුගේ පාදවලින් ගමන් කරමින් අශ්වයකු මෙන් හේෂාරවය නඟන්නෙකි. මීට අමතරව මෙම යාත්‍රිකයන්ට මුලින්ම හමු වූ ස්වදේශිකයා ගැන ද සඳහනක් ඇතුළත්ය. හේ ඉන් පෙර කැඩපතක් දැක නැත්තෙකි. එහෙයින් කැඩපතෙහි සිය ආරෝහ පරිණාහ දේහය දකින ඔහු, ඒ හා සමඟ අරෝවක් ඇති කර ගන්නට තැත් කළේ තමන් ඉදිරියෙහි සතුරෙකු සිටිතියි යන අනුමානයෙනි.

මෙම කෙටි හා සිත් අලවනසුලු කෘතිය අද දවසේ ලියවෙන ප්‍රබන්ධ කතාවට මූලබීජ සැපයූ එක් අවස්ථාවක් ලෙස මම දකිමි. නිසැකවම එය එම යුගයේ වූ අපගේ යථාර්ථය පිළිබඳව ලියවුණ විස්මය එලවන විස්තරයකි. ඉන්දියානුවන් අපට ඉතිරි කර ගිය පුරාවෘත්තයන් අනෙකුත් එබඳු නිම කළ නොහැකි වටිනාකමින්

යුත් ඒවාය. රත්රනින් පිරී ඇතැයි අප මහත් ගිජු ලෙස සිතූ මනඃකල්පිත දේශය හෙවත් එල් ඩොරාඩෝව පිහිටි තැන බොහෝ සිතියම්හි සටහන්ව තිබිණි. සිතියම් ශිල්පීන්ගේ හිතලුවලට අනුව විටින් විට එය පිහිටි තැන හා හැඩය වෙනස් විය. පැන් සැනහූ විට සදාකාලික තාරුණ්‍යය ගෙන එතියි ජනශ්‍රැතියෙහි සඳහන් වූ දිය උල්පත සොයා තුනේස් කැබේසා ද වකා අට වසරක් තිස්සේ මුළු මැක්සිකෝව පීරුවේය. ඔහු හා ගිය හයසියයක් පමණ පිරිස එකිනෙකා පරයා දිනන්නට තැත් දරමින් ඔවුනොවුන් වනසා ගත් බැවින් නැවත ආපසු පැමිණියේ පස්දෙනෙකු පමණි. අතාහුවල් හට පුද පඩුරු වශයෙන්, එක් දිනක්, එක කොටළුවකු මත රත්රන් රාත්තල් සියයක් බැගින් පැටවූ කොටළුවන් එකළොස් දහසක් කුස්කෝ නුවරින් පිටත් වූ නමුත්, උන්ට සිදු වූ දෙයක් හෝ උන් ආගිය අතක් ගැන හෝ තොරතුරු නැති වීම තවමත් අබිරහසකි. අනතුරුව කර්ත ජෙනාහි දියළු පස් සහිත බිම්වල ඇති කළ කිකිළියන්ගේ ගොජුරුවල පුංචි රත්තරන් ගුළි වූ බවත්, උන් යටත්විජිත සමයේ දී ඉහළ මිලකට අලෙවි කළ බවත් සඳහන්ය. රත්රන් සොයා ගත්තවුන්ගේ ඊට ඇති තණ්හාව මැඩලන, අපගේ හිතට වධ දෙන සිදුවීමක් ගැන ද සඳහන්ය.

මෑත කාලයේ දී එනම් පසුගිය ශත වර්ෂයේ දී පැනමාවේ දෙපස ජලාශයන්ගෙන් යා වූ පටු බිම් තීරයක් ප්‍රධාන ගොඩබිමට යා කිරීම සඳහා දුම්රිය මාර්ගයක් තැනීම ගැන ශක්‍යතා අධ්‍යයනයක් සඳහා පත් කළ ජර්මානු විශේෂඥයන් පිරිසක් නිගමනය කළේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැක්කේ එක් කොන්දේසියකට යටත්ව පමණක් බවය. එම කොන්දේසිය වූයේ මෙම කලාපයේ යකඩ හිඟ බැවින් එය යකඩින් නිම නොකළ යුතු අතර, එය රත්රනින් තැනිය යුතු බවය.

ස්පාඤ්ඤ ආධිපත්‍යයෙන් මිදී අප ලබා ගත් නිදහස අපගේ උමතුව වැඩි කළා මිස අඩු වීමක් වූයේ නැත. තෙවරක් ඒකාධිපති පාලනයක් ගෙන ගිය ජනරාල් ලෝපේස් ද සන්තානා (Lopez de Santana) ඊනියා යුද්ධයේ දී අහිමි වූ සිය කකුල වෙනුවෙන් අති විශාල අවමංගල උත්සවයක් පැවැත්වීය. ඉක්වදෝරයේ දහසය වසරක් පරම අධිපතියකු ලෙස පාලනය කළ ජනරාල් ගබ්‍රියෙල් ගර්සියා මොරෙන්ඤෝ (Gabriel Garicia Moreno) මියගිය කල්හි ඔහුගේ මෘත දේහය, පූර්ණ නිල ඇඳුමෙන් හා සර්වාභරණයෙන් ද සරසා, ජීවත්ව සිටිය දී ඔහු පැළැඳි සියලු පදක්කම් පලඳවා ඔහු භාවිත කළ ජනාධිපති සිහසුනේ තැබීමට ද කටයුතු කළේය. එල්සැල්වදෝරයේ, පරම විඥානික, හිතුවක්කාර ඒකාධිපතියකු වූ ජනරාල් මැක්සිමිලියානෝ හෙර්නැන්ඩේස් මාර්ටිනස් (Maximilliano Hernandz Martinez) සිදු කළ තිරිසන් සමූල ඝාතනයක දී ගැමියන් තිස් දහසක් අමු අමුවේ මරා දැමිණි. සිය ආරක්ෂාව ගැන නිරන්තර සැකයෙන් පසු වූ හේ සිය ආහාර බඳුනෙහි වසක් විසක් ඇත්දැයි පිරික්සීමට පැද්දෙන බට්ටෙක් වැනි පෙන්ඩියුලමක් නිර්මාණය කරන්නට වෑයම් කළේය. බැක්ටීරියාවක් හේතුවෙන් බෝවෙන ස්කාලට් ෆීවර් උණ රෝගය වළක්වන්නට නගරයේ වීදි ලාම්පු රත් පැහැ තෙල් කඩදාසියෙන් ආවරණය කරන්නට ද නියෝග කළේය. ටෙගුසිගල්පා ප්‍රධාන චතුරස්‍රයේ ඉදි කළ ජනරාල් ප්‍රැන්සිස්කෝ මොරැස් එන්ගේ ප්‍රතිමාව පැරීසියේ පුරාණ භාණ්ඩ අලෙවිසලකින් මිල දී ගත් එකකි. එය මාර්ෂල් නේගේ පිළිරුවකියි පසුව අනාවරණය විය.

සුදීප්තිමත් පද්‍ය රචකයකු වූ පැබ්ලො නෙරූඩා, මීට වසර එකොළහකට පෙර ඔහුගේ අමිල වදනින් මෙම සභාව සැරසූ වග ඔබට මතක ඇති. එවක් පටන් හොඳ අරමුණින් - සමහර විට නරක අරමුණින් - යුතු යුරෝපීයයෝ, ලතින් ඇමෙරිකාව හොල්මන් කරන මිනිසුන්ගෙන් ගැහැනුන්ගෙන් සැදුණ

දේශයක්, ඔවුන්ගේ නිමාවක් නැති ගුප්ත හැසිරීම් නිසා විවිධ ප්‍රවාදවලට පණ ලැබෙන මඟක් ලෙස ඉතා බලවත් ලෙස දුර්මත පළ කළහ. ඔවුන්ගේ චිත්‍රණය අනුව ලතින් ඇමෙරිකාව හොල්මන්කාර ගැහැනුන්ගෙන් හා පිරිමින්ගෙන් සමන්විත වූ අද්භූත, හිතුවක්කාර දේශයකි. මෙවන් දේ නිසා අපට හුස්ම ගන්නටවත් මොහොතක ඉඩක් නොලැබිණ. ප්‍රොමිතියස් දෙවියන් වැනි හිතුමතයේ ක්‍රියා කළ ජනාධිපතිවරයෙක් රැකවල් තරකොට තිබූ සිය මාලිගාව ගිනි ගෙන දැවෙන විටත්, මුළු හමුදාවක් සමඟ තනිවම සටන් වැද මිය ගියේය. සැක කටයුතු ලෙස ගුවන් යානා දෙකක් අනතුරට පත් විය. ඒ ගැන තවමත් කිසිම තොරතුරක් නොමැත. ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් ගැන ඔවුන් දැනුවත් කළ ජනතා හිතවාදී අයිතීන් සුරක්ෂිත කළ සොල්දාදුවකු වූ ජනාධිපතිවරයකුගේ දිවි අහිමි විය. යුද්ධ පහක් හා හමුදා කුමන්ත්‍රණ දාහතක් සිදු විය. දෙවියන්වහන්සේගේ නියමය පරිදි කටයුතු කරන්නේ යයි අඟවමින් බලයට ආ සැහැසි ඒකාධිපතියෙක් අපේ යුගයේ, ප්‍රථම ලතින් ඇමෙරිකානු ජනවාර්ගික සංහාරය කළේය. ඒ හා සමඟම වසය අවුරුද්දකට වඩා අඩු වූ ලතින් ඇමෙරිකානු ළදරුවෝ විසි ලක්ෂයකට වඩා මිය ගියහ. මෙය 1970 පටන් මේ දක්වාම මුළු යුරෝපයේම සිදු වූ ළදරු උපත්වලටත් වඩා වැඩිය.

වෙනත් මතයන් දැරූ නිසා සිදු වූ මර්දනකාරී පහර දීම්වලින් අතුරුදහන් වූ සංඛ්‍යාව එක්ලක්ෂ විසිදහස ද ඉක්මවීය. එය හරියටම මුළු උප්සලාවේම ජනගහනයට කුමක් වීදැයි නොදන්නා පරිදි අතුරුදහන් වූවාට සමානය. අත්අඩංගුවට පත් විශාල කාන්තා පිරිසක් අතර සිටි ගැබිනි මාතාවෝ බොහෝ දෙනෙක් ආර්ජන්ටිනියානු සිර ගෙවල සිය දරුවන් බිහි කළහ. එම දරුවන් කොහේ සිටිත්දැයි හෝ ඔවුන්ගේ අනන්‍යතාව කවරේදැයි හෝ කිසිවෙක් නොදත්හ. හමුදා අධිකාරීන්ගේ අණ පරිදි ඔවුන් හදා වඩා ගන්නට දුන් අයගේ තොරතුරු හෝ අනාථ නිවාසවලට යැවුණ ළදරුවන් පිළිබඳව කිසිදු පැහැදිලි තොරතුරක් හෝ නොමැත. පවතින තත්ත්වය වෙනස් කිරීමට තැත් දැරීමේ හේතුවෙන් මුළු මහාද්වීපයේම දෙලක්ෂයකට ආසන්න ස්ත්‍රී පුරුෂයන් සංඛ්‍යාවකගේ ජීවිත නැති වූ අතර, මධ්‍යම ඇමෙරිකාවේ කුඩා රටවල් වූ නිකරගුවා, එල්සැල්වදෝර් සහ ගුවාතමාලාවේ ලක්ෂයකට වඩා ජීවිත වනසා දැමීය. මෙය ඇමෙරිකානු එක්සත් ජනපදයේ සිදු වී නම් සමානුරූපී සංඛ්‍යාව දස වසරක් තුළ දහසය ලක්ෂයක ප්‍රචණ්ඩ මරණවලට ආසන්නය.

සාම්ප්‍රදායික ආගන්තුක සත්කාරයට නම ගිය රටක් වූ චිලි දේශයේ දශ ලක්ෂයකට ආසන්න පිරිසක්, රට හැර දමා පලා ගියහ. එය සමස්ත ජනගහනයෙන් සියයට දහයකි. උරුගුවේ පුංචි රටකි. එහි ජනගහනය ලක්ෂ විසිපහකට වඩා නැත. මුළු මහාද්වීපයේම වඩාත්ම ශික්ෂණයෙන් යුත් ජනයා නිවසන දේශයකි. එරට ජනගහනයෙන් ද පහෙන් එකක් සියරට හැර ගොස්ය. එල් සැල්වදෝරයේ ඇති වූ සිවිල් යුද්ධ නිසා හැම විනාඩි විස්සකටම එක් සරණාගතයෙක් බැගින් බිහි වෙයි. එසේ රටවල් හැර ගිය හා බලහත්කාරයෙන් පලවා හැරිය සංඛ්‍යාව හා සැසඳූ විට නෝර්වේ රාජ්‍යයේ නිවසන මුළු ජන සංඛ්‍යාව ද අධික වෙයි.

ස්වීඩන අධ්‍යයන ශාස්ත්‍රාලයේ අවධානය යොමුවිය යුත්තේ නිකම්ම මේ රටවල සාහිත්‍යමය ප්‍රකාශනවලට පමණක් නොව, මෙම බිහිසුණු, පමණ ඉක්මවූ යථාර්ථය වටහා ගැනීමට බැව් සිතීමට පවා මම බිය වෙමි. මෙම යථාර්ථය හුදු ග්‍රන්ථකරණයක් නොව, අප තුළ ජීවත් වන හැම මොහොතකම, ගිණිය නොහැකි පරිදි අප හඹා එන මරණය පිළිබඳ වූවකි. වේදනාවෙන් සුන්දරත්වයෙන් සපිරුණ නිර්මාණ උත්පාදනයට නිර්මාණ ශිල්පීන්ට

ඒවා අසීමිත මූලාශ්‍රයන් වීම වෙනත් කරුණකි. හිතේ සංකාවෙන් එහෙ මෙහෙ සැරිසරමින් සිටි, හුදු වාසනාව විසින්ම ඔසවා තබනු ලැබූ මෙම කොළොම්බියානුවා එබඳු අයගෙන් එක් නොවටිනා අයෙක් පමණි. කවීන්, යාචකයන්, සංගීතවේදීන්, අනාගත වක්තෘන්, රණශූරයන් සහ තක්කඩීන් ආදි යථාර්ථ සීමා අතික්‍රමණය කළ අසංරෝධිතයන් වැනි අප විමසිය යුතු කරුණක් ඇත. එය අපගේ ජීවිත පිළිගත හැකි අන්දමට සැලකීමට සාම්ප්‍රදායික මාර්ග යන් යොදා ගැනීමට ඇති අපහසුතාව ගැනය. මිත්‍රවරුනි, අපගේ හුදකලාව පිළිබඳ ගැටලුවේ මූලික කරුණ එයයි.

අප හැම අත්විඳින මෙම දුෂ්කරතාවන් අපට බාධා පමුණුවන හේතුවක් අපට වටහා ගත හැකිය. මෙම කලාපයේ රටවල ලේඛකයන් ඔවුන්ගේ සංස්කෘතීන් අවලෝකනයෙන් නිපදවා ගත් විචාරශීලී ප්‍රතිභාවන් නිසි පරිදි ඇගයීමට ලක් කිරීමට නිසි පිළිවෙළක් නොමැති බවයි, ඒ. යුරෝපීයයන් ඔවුන්ගේ කෘතීන් විමසීමට නිපදවා ගත් මිනුම් දඬුවලින් අප විනිශ්චය කිරීමට තැත් කිරීම ස්වාභාවිකය. එහෙත්, එය ප්‍රමාණවත් නොවේ. ජීවිත විනාශය සියල්ලන්ටම එක සමාන නොවන බව ඔවුන් අමතක කිරීම ඊට හේතුවයි. අපට අපගේම අනන්‍යතාවක් ඇති කර ගැනීමට ඇති ඇඩි අවශ්‍යතාව දුෂ්කර මෙන්ම ලෙයින් නැහැවෙන කටයුත්තකි. කලෙක එය ඔවුනට ද එසේම විය. අපගේ යථාර්ථය අපට ආගන්තුක හැඩතලවලින් හැඳින්වීමට යාමෙන් සිදු වන්නේ අප වඩ වඩාත් හඳුනා ගැනීම දුෂ්කර වීමත්, වඩ වඩාත් නිවහල් නොවීමත්, වඩ වඩාත් හුදකලා වීමත් පමණි. ගෞරවනීය යුරෝපය ඔවුන්ගේම පැරැණි අතීතය දකිමින් අප දෙස බැලීමට තැත් කළහොත් සමහර විට නිවැරැදි දැක්මක් ලද හැකිය. ලන්ඩනයට එහි නගර ප්‍රාකාරය ගොඩනැඟීමට වසර තුන්සියයක් ගත වූ බව අප සිහිකළමනාය.

බිෂොප්තුමකු පත් කර ගැනීමට තවත් වසර තුන්සියයක් බලා සිටින්නට සිදු විය. රෝමය අවුරුදු විස්සකටත් වැඩි කාලයක් අඳුරු පටලයක ගැලී සිටින විට ඉන් එය මුදා ඉතිහාසයේ නමක් සනිටුහන් කරන ලද්දේ එට්රුස්කාන් රජෙකු විසිනි. අද අප ප්‍රණීත චීස්වලින් සතපාලන, උදාසීන ලෙසින් හෙමිහිට දුවන ඔරලෝසු නිපදවන, සන්සුන් සාමකාමී ස්විස්ටර්ලන්තයේ සොල්දාදුවෝ එදා අන් රටවල ධනය පැහැර ගැනීම සඳහා යුරෝපය ලෙයින් නැහැවූවෝය. ඊට අමතරව පුනරුද සමයේ අග දී අධිරාජ්‍යවාදීන්ගේ හමුදාවන්හි සේවය කළ පනස් දහසක් පමණ බැළ සෙබළු රෝමය සූරා කා වනසා එහි පුරවැසියන් අටදහසක් කඩු මුණතෙහි ඇමුණූහ.

අවුරුදු පනස් තුනකට පෙර තොමස් මාන් (Thomas Mann) අනුදත්, සදාචාරාත්මක උතුර හා ආවේගශීලී දකුණ යා කිරීමෙහි මුළාවේ සිහින දකින, ටෝනියෝ ක්‍රොග ර්ගේ (Tonio Kroger) වෑයම ඔසවා තබන්නට කිසිසේත් අදහස් නොකරමි. එහෙත්, සාධාරණ වූත්, මානුෂික වූත් මාතෘ භූමියක් තනන්නට මෙහි හා වෙනත් තන්හිත් වෑයම් කරන ෂැහැදිලි දැක්මක් ඇති ඇතැම් යුරෝපීයයන්ගේ ව්‍යායාමය වඩාත් අර්ථවත් වනුයේ ඔවුන් අප දෙස බලන ආකාරය ගැන නැවත සලකා බැලුවහොත් පමණක් යයි මම විශ්වාස කරමි. අපගේ හුදකලාව අවම කරන්නටත්, අපගේ සිහිනයන් ජය ගන්නටත් සහයෝගිතාව දැක්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙම ලෝක ධාතුවෙහි තමන්ගේම යන ජීවිත පැවැත්මක් අපේක්ෂා කරන සියලුම ජනයාගේ ප්‍රාර්ථනා ඉටු වෙන අන්දමේ නිශ්චිත ක්‍රියාදාමයකට පරිවර්තනය කිරීමෙන් තොර සහයෝගිතාව පලක් නැත.

---

ලතින් ඇමෙරිකාවට ස්ව කැමැත්තෙන් තොරව කිසිවකුගේ ඉත්තෙකු වීමට කිසිදු අවශ්‍යතාවක් නැත. එසේ වීමට කිසිදු



තම ආදරණීය සහෘදයාට අවසන් බුහුමන් දැක්වීමට මැක්සිකෝ නුවර ලලිත කලා මාලිගය අසලට අසලට රැස්වූ ජනයා.

හේතුවක් ද නැත. එහි නිදහස හා ස්වීයත්වය පිළිබඳ සංකල්පය හා අභිලාෂය බටහිර පදනම් කොට වීම හුදෙක් හැඟීම් පදනම් වූ අතාර්කික සිතුවිල්ලක් නොවේ. කෙසේ වුව ද, නාවික යාත්‍රාකරණයේ අතිමහත් වර්ධනය හේතුවෙන් අපගේ ඇමෙරිකාව හා යුරෝපය අතර දුරස්ථ භාවය බෙහෙවින් පටු වී ඇතත්, ඊට ප්‍රතිවිරුද්ධ ලෙස අපගේ සංස්කෘතික හුදකලාවන් වඩාත් පුළුල් වී ඇති බව පෙනේ. සාහිත්‍යයේ දී කැමැත්තෙන්ම අප වෙත ලබා දුන් ස්වීයත්වය, සමාජ වෙනස් කිරීමේ අපගේ දුෂ්කර ප්‍රයත්නයහි දී සැක උපදන පරිදි අප වළක්වාලූයේ මන්ද? සමාජ සාධාරණය ඔවුන්ගේ රටවලට අපේක්ෂා කළ ප්‍රගතිශීලී යුරෝපීයයන් අසමාන තත්ත්වයන්ට යෝග්‍ය වෙනස් ක්‍රමවේදයෙන් යුත් ලතින් ඇමෙරිකාවට අයෝග්‍යයයි කල්පනා කරන්නේ මන්ද? අපගේ ඉතිහාසය පුරා අත්විඳි අසීමිත ප්‍රචණ්ඩත්වය සහ වේදනාවන් දීර්ඝ කාලයක් පුරා පැවත ආ අසමානතාත් කිව නොහැකි තරම් අප්‍රසන්නතාත්හි ප්‍රතිඵලයන් නිසා මිස අප භූමියේ සිට සැතැපුම් තුන්දහසකට දුරක සිට කළ කුමන්ත්‍රණයක හේතුවෙන් නොවේ. එහෙත්, සමහර නායකයෝත් චින්තකයෝත් එය එසේ යයි සිතති. ලෝකයේ බලවත් මහා හාම්පුතුන් දෙදෙනකුගේ හව්හරණයේ යැපෙනු විනා වෙනත් දෛවයක් ගැන සිතිය නොහැකි මෙම යල් පැන ගිය අය සිතන්නේ ඔවුන්ගේ යෞවන වියේ සිදු වූ බිහිසුණු අපරාධයන් ගැන අමතක කිරීමෙනි. මිත්‍රවරුනි! අපගේ හුදකලාවට මූලිකම හේතුවත් මෙයයි.

මීට අමතරව දේපොළ කොල්ලකෑමට සහ කොන් කිරීම්වලට හා මර්දනයට භාජනය වූ අප ඒවාට ප්‍රතිචාර දක්වා ඇත්තේ ජීවිතවලිනි. ජල ගැලීම්, වසංගත, සාගතය හෝ භෞතික විනාශයන්ට හෝ ශතවර්ෂයෙන් ශතවර්ෂයට ඇති වූ සදාකාලික යුද්ධයන්ට මරණය අභිභවා ජීවිතය රැඳෙන්නට කරන නොනවතින අරගලය නවත්වන්නට හැකි වී නොමැත. එම වාසිදායක තත්ත්වය දිගටම වර්ධනය වෙයි. කඩිනම් වෙයි. හැම අවුරුද්දකම මරණ සංඛ්‍යාව අභිභවා මිලියන හැත්තෑ හතරක උපත් සිදු වෙයි. එය වර්ධනයේ ප්‍රමාණවත් සංඛ්‍යාවකි. හැම වසරකම නිව්යෝර්ක් නගරයේ ජනගහනය හත් ගුණයකින් වැඩි වෙයි. එහෙත්,

මෙම උපත්වලින් බොහොමයක් සිදු වන්නේ ආර්ථික සම්පත්වලින් ඌන රටවලය. ලතින් ඇමෙරිකාව ඊට නිසැකයෙන්ම ඇතුළත් වෙයි. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ රටවල් විනාශකාරී බලවේගයන් ඒකරාශී කරන අටියෙන් අවි ආයුධවලින් වඩ වඩාත් සන්නද්ධ වෙයි. මෙතෙක් බිහිවූ සියලුම ජීවීන් සිය ගුණයකට වඩා විනාශ කිරීමට පමණක් නොව, ආරම්භයේ සිට මේ දක්වා මෙම අවාසනාවන්ත ග්‍රහලෝකයේ හුස්ම වැටුණ සියලුම ජීවීන් විනාශ කර දැමීමට වුව එම ආයුධ පොහොසත්ය.

මා ගුරු තන්හිලා සලකන විලියම් ෆෝක්නර් (William Faulkner) මෙවන්ම දිනයක කීවේ "මිනිසාගේ අවසානයක් ගැන පිළිගන්නට මම සූදානම් නෙවෙමි" යනුවෙනි. වසර තිස් දෙකකට පෙර ඔහු පිළිගන්නට ප්‍රතික්ෂේප කළ මෙම මහා ඛේදවාචකය ගැන මා හොඳින්ම වටහා නොගන්නේ නම් අද දින මෙහි මා රැඳී සිටීම නොවටනේය. අද දින මෙම විනාශකාරී බලවේගයන්ට මුළුමහත් ජීවීන්වම විනාශ කර දැමීමට අවශ්‍ය වන්නේ ඉතාම සුළු විද්‍යාත්මක ක්‍රියාවලියක් පමණි. එය සමස්ත මානව වර්ග යාගේ ආරම්භයේ සිට ප්‍රථම වතාවට කැරුණ සොයා ගැනීමකි. මෙම බිහිසුණු යථාර්ථය අභිමුව සිටින අප මෙතුවක් කලක් සිතුවේ, මානව ඉතිහාසයේ මෙය හුදු මනඃකල්පිතයක් ලෙසිනි. ඕනෑම දෙයක් පිළිගෙන අදහන්නන් වශයෙන් හා කථාන්දර නිර්මාණය කරන්නන් ලෙස අපට, මීට සපුරාම වෙනස් කල්පිත ලෝකයක් ගැන විශ්වාස කිරීමට තවමත් පමා වී නැත. එය නවතම වූත් විශ්වය පුරා පතළා වූ ජීවිතය අගයන කල්පිත ලෝකයක් විය යුතුය. එය අන් අය මරණයට පත් විය යුත්තේ කුමන ආකාරයටදැයි වෙනත් කිසිවකු විසින් තීරණ ගනු නොලබන්නා වූත්, ආදරය සත්‍යයක් ලෙස පිළිගත හැකි හා සංතෘප්තිය යථාවත් වූත්, අවුරුදු සියයක හුදකලාවෙන් පීඩාවට පත් ජාතීන්ට මේ මහ පොළොව මත විසීමට තවත් අවස්ථාවක් පාදා දෙන්නා වූත් එකක් විය යුතුය.



පරිවර්තනය

**ජයසුමන දිසානායක**

*ප්‍රවීණ කලා විචාරකයෙක් හා පරිවර්තකයෙකි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු උසස් පරිපාලන නිලධාරියෙකි. සාහිත්‍ය අනුමණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකි.*

**කිසිවෙකුට ඔබගේ කඳුළු නොවටී. එහෙත්, ඔබේ කඳුළු වටිනා යමෙකු වෙත්ද, ඒ තැනැත්තා ඔබ නොහඬවයි.**

-ගබ්රියෙල් ගර්සියා මර්කෙස්-



# මර්කෙස් ඉඳුදැල විනිවිද...

උපදේශ කතා, ප්‍රස්තාව පිරුළු, ජනකවි, ජනකතා මෙන් ම අද්භූත කතා ද අපට ආගන්තුක නැත. දශක තුන හතරකට පෙර මේ රටේ විසූ මවුවරුන්, නැන්දණියන්, මිත්තණියන් බොහෝ දෙනා මේ අපූරු ජනශ්‍රැති, මිථ්‍යා කතා (මේවා මිථ්‍යා කතා ම දැයි නොදනිමු) බොහොමයක් දැන සිටි අතර, ඉතා නිර්ලෝභී ලෙස ඒවා සියලු දරුවන්ට බෙදා හදා දීමට ද උත්සුක වූහ. ඇසින් නුදුටුව ද, කනින් නෑසුව ද ඔවුන් ඒවා රස කර කීවේ අපූරු සත්‍යයක් ප්‍රකට කෙරෙන ලෙස ය. පණ පිහිටුවා ය. බොහෝ විට ඒවායේ චරිත බවට පත් වූයේ භූතයන්, පිසාචයන්, යක්ෂයන් හා දෙවියන් ය. කුඩා කල දෑත් දෙපා හකුළුවාගෙන මේ භයංකර කතා ඇසූ දරුවෝ අඳුරට බිය වූහ. වැඩිහිටියන් වූ පසු ව ද ඔවුනගේ හදගැස්මේ ශේෂයක් ඒ සිත්සතන් තුළ රැඳී පැවැතුණේ ය. එහෙත්, මේවා අපූර්වාකාරයෙන් ප්‍රතිනිර්මාණය කොට තවත් පරපුරකට තිළිණ කිරීමේ ශක්‍යතාව, කුසලතාව ඒ වැඩිදෙනෙකුන් සතු වූයේ නැත. කාලය විසින් අකා මකා දමනු ලැබූ එවැනි අපූරු අද්භූත කතා රැසක් මේ වන විට අපගේ ඉතිහාසයේ, කතාසරිත් සාගරයේ සොහොන්කොත් බවට පත් වී තිබේ.

එහෙත්, මේ අපූරු කතාවස්තු කපා කොටා, පිරිපහදු කොට ප්‍රතිනිර්මාණය කර දේශ සීමාමාඉම්වලින් තොර ව සමස්ත ලෝකයට ම තිළිණ කළ ලේඛකයෝ අතළොස්සක් ද ලොවෙහි වෙති. මේ අතළොස්ස අතරේ ද පෙරමුණේ ම සිටි ලේඛකයකු ලෙස නම් කළ හැකි වන්නේ මුළුමහත් ලෝකයේ ම සාහිත්‍යකාමීන්ගේ හදවත් කුහරයෙහි භූමිකම්පාවක් ජනනය කළ ගබ්රියෙල් ගර්සියා මර්කෙස් නම් වූ අපූරු ලේඛකයා ය.

ගබ්රියෙල් ගාර්සියා මාර්කේස් ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතිය අනුදත් ලේඛකයෙකි යි කියැවේ. ඇතැම්විට මින් අදහස් වන්නේ ඔහු නවකතාවට අතපොත් තැබුවේ ඉන්ද්‍රජාලික රීතිය ගුරු කොට ගනිමින් ය යන්න විය හැකියි. මගේ අදහසට අනුව නම් ඔහු නිදහසේ ලියාගෙන ගිය නවකතාවේ රීතිය පසු ව හඳුනාගත්තේ - එය ඉන්ද්‍රජාලික යථාර්ථවාදය හෝ මායා යථාර්ථවාදය ලෙස නම් කළේ

විචාරකයා මිස ඔහු නොවේ. ඔහු ඉන්ද්‍රජාලික යථාර්ථවාදී ලේඛකයකු ලෙස නිර්වචනය කළ හැකි නම්, ඉන්ද්‍රජාලික කතාන්දර ඔහුට කියා දුන් ඔහුගේ මිත්තණියන්, නැන්දණියන් ඉන්ද්‍රජාලයේ නිර්මාතෘන්, ඉන්ද්‍රජාලිකයන් වශයෙන් නම් කිරීමට ද බැරි නැත. කෙසේ වුව ද ඉන්ද්‍රජාලය, ඉන්ද්‍රජාලයක් වන්නේ නරඹන්නාට ය. ඇස් බැඳ ඇත්තේ නරඹන්නාගේ ය. ඉන්ද්‍රජාලිකයාට එය යථාර්ථයකි. තමාගේ සන්දර්ශනයේ ගැඹුරු පත්ලෙහි වන යථාව ඔහු හඳුනයි.

විශිෂ්ට ලේඛකයා ලියන්නේ පශ්චාත් නව්‍යවාදී, අධියථාර්ථවාදී හෝ මායා යථාර්ථවාදී නවකතාවක් නොවේ. විශිෂ්ට ලේඛකයා යනු සාහිත්‍ය විචාරයේ මිනුම්දඬු, නිර්ණායක, නව සාහිත්‍ය විචාර සංකල්ප සොයමින්, ඒවා තම නිර්මාණය සමඟ කොතෙක් දුරට යා වෙන්නේ දැයි සසඳමින් ළතැවෙන්නා ද නොවේ.

'පශ්චාත් නව්‍යවාදය' නම් වූ විචාරවාදය ප්‍රචලිත ව ඇති ලෝකය තුළ ගර්සියා මර්කෙස්ගේ කෘතිවලට පාදක වී ඇත්තේ ඉන්ද්‍රජාලික යථාර්ථවාදී රීතියකැයි බොහෝ දෙනා පිළිගනිති. කෙසේ වුව ද 'පශ්චාත් නව්‍යවාදය' යනු යුරෝපීය චින්තන සම්ප්‍රදාය තුළින් බිහිවූ යුරෝපා කේන්ද්‍රීය සංකල්පයක් වීම හේතුවෙන් ම එය හුදු විලාසිතාවක් ලෙස බැහැර කරන්නෝ ද වෙති. ගාර්සියා මර්කෙස්ලා, පාඖලෝ කොයියෝලා, හරුකි මුරකමිලා අපට මොකටදැයි අසන්නන් ද මේ අතර වෙයි. කෙසේ වුව ද පශ්චාත් නව්‍යවාදී ලේඛකයන් වශයෙන් පොදුවේ පිළිගැනෙන ජර්මනියේ ගුන්තර් ග්‍රාස්, අමෙරිකාවේ ටෝනි මොරිසන්, ජපානයේ හරුකි මුරකමි වැනි ලේඛකයන්ගේ නවකතාවල දී හමුවන චරිත ඉතා පහසුවෙන් හඳුනා ගත හැකි නැත. ඔවුහු බොහෝ විට සිය කල්පිත විජිතයන්හි හිතුමතේ සැරිසරන්නෝ වෙති. මේ ඇතැම් කතාවක සත්තු කතා කරති. මළ මිනිස්සු අවදි වෙති. මාවතේ දැන්වීම් පුවරුවකින් නැඟී සිටින චිත්‍රයකට, රූපයකට හදිසියේ පණ උපදී.

මේ අතිගූර පරිකල්පනයන්හි ගැඹුරු සමාජ කියවීම, ජීවිත විමර්ශනය ස්පර්ශ කිරීමට සරල කියවීමක් නොසෑහෙයි. මාක්ස්වාදය මෙන් ම බුදු දහම ද ඉතා පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි නොවන බව අපි දනිමු. හුදෙක් කාලය ගත කිරීම සඳහා පමණක් පොත් කියවන පාඨකයාට මෙවැනි කෘතියක් නීරස ලෙස දැනී යාමේ සම්භාවිතාව ඉහළ මට්ටමක පවතින්නේ ද එහෙයිනි. මේ කෘතීන් සිංහල භාෂාවට හෝ වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීමේ දී පරිවර්තකයා කෙබඳු දුෂ්කරතාවනට මුහුණ දෙනු ඇද්ද යන්න වෙනම ම සලකා බැලිය යුත්තකි. විද්‍යාගාරයක් තුළ සිදුකෙරෙනු පර්යේෂණාත්මක ප්‍රයත්නයකට නොදෙවෙනි මේ ප්‍රයත්නයෙහි ප්‍රතිඵල නෙළා ගැනීම ඉතා පහසු වන්නේ සූක්ෂ්මාත්මතාවෙන් යුතු පාඨකයාට ය. මේ ගැන විචාර, විමර්ශන ඉදිරිපත් කළ හැකිවන්නේ සාහිත්‍යය මෙන් ම ජීවිතය ද අතිසියුම් ලෙස හඳුනා ගත් විමර්ශකයාට ය.

එහෙත්, එකක් නම් කිව යුතු ය. ඒ මෙවැනි අපූර්වාකාරයේ පරිකල්පනයන් මුදා හැරීමට මේ රට තුළ කවර නම් අවකාශයක් විවර ව ඇත්තේ ද යන්න පිළිබඳ ව ය. ලේඛකයකුගේ - විශේෂයෙන් ම ආධුනික ලේඛකයකුගේ එවැනි අපූර්වාකාර පරිකල්පනයක් හඳුනා ගැනීමට, ඉව කිරීමට මේ රටේ නිල විචාරකයන්, සාහිත්‍ය විනිසුරන් කොතෙක් දුරට පොහොසත් ව සිටින්නේ ද යන්න බරපතළ ප්‍රශ්නයක් ව පවතී. අංකුර නවකතාකරුවකුගේ එවැනි ශක්‍යතාවන් එක පැන් පහරකින් නිෂේධනය කිරීමට මේ රට තුළ ඇති ඉඩකඩ අනල්ප ය. එහි ලා ප්‍රමුඛ කාරණා වන්නේ සාම්ප්‍රදායික විචාර රීතීන් ගුරු කොට ගැනීමේ ස්වභාවයත් නව මානයක් හඳුනාගැනීමේ නොහැකියාවත් ය. ඉහතින් පෙන්වා දුන් ආකාරයේ අන්තර්ගතයකින් යුතු වූ

කෘතියක් සාහිත්‍ය තරගවල දී මුල් වටයෙන් ම කැපී යාමට වැඩි ඉඩකඩක් පවතින්නේ ද එහෙයිනි. දශක ගණනාවකට පෙර ඩබ්.ඒ. සිල්වාගේ ('ලක්ෂ්මී' වැනි) නවකතාවලට යොමු වූ විචාර, විවේචන ප්‍රහාර මෙකල ද ඒ ආකාරයෙන් ම බලාත්මක ව ඇති ආකාරය අපි කොතෙකුත් දැක ඇත්තෙමු. ඒ අනුව කල්පනා කර බලන විට අපට සිතෙන්නේ මාර්කේස් වැනි ලේඛකයන් එදා මෙහි නූපන්නේත් මතු නූපදින්නේත් වාසනාව නිසා ම යැයි කියා ය.

ගබ්රියෙල් ගර්සියා මර්කෙස් උපත ලැබුයේ 1928 මාර්තු 23 වන දා ය. ඒ, උතුරු කොළොම්බියාවේ කැරේබියන් කඳු වැටි හා සාගරය අතර පිහිටි 'අරකටාකා' නම් වූ කුඩා නගරයේ ය. (ස්පාඤ්ඤයේ යටත්විජිතයක්ව පැවැති කොළොම්බියාව නිදහස ලබා ගත්තේ 1810 දී නැපෝලියන් විසින් ස්පාඤ්ඤ රජු පලවා හැරීමෙන් අනතුරු ව ය.)

බහුජාතික සමාගම් විසින් කෙසෙල් වගා කරනු ලැබූ නගරයක් වූ මෙහි ජීවත් වූ ජනතාව හැඳින්වුණේ මුහුදුබඩ පහතරටියන් ලෙසිනි යි ප්‍රකට ය. සෙසු ජනතාව හැඳින්වුණේ මධ්‍යම කඳුකරයේ උඩරටියන් ලෙස ය. මේ උඩ-පහත භේදය ඉඳකොට්ඨාසයටම බලපෑම් කළේ තමන් උසස් ලෙස ද සෙස්සන් පහත් කොට ද සැලකීමට ය. මුහුදුබඩ පහතරටියන් සහ කඳුකර උඩරටියන් අතරේ පැවැති ප්‍රතිවිරෝධතා මෙන් ම ඒ හේතුවෙන් හටගත් ව්‍යාකූලතා හා ආතතීන් ද ගර්සියා මර්කෙස්ගේ කෘතිවලින් විශේෂයෙන් ONE HUNDRED YEARS OF SOLITUDE ('හුදෙකලාවේ සියවසරක්' මැයෙන් මෙය සාගර විජේසේන විසින් සිංහලට පරිවර්තනය කරනු ලැබ තිබේ) අපූර්වාකාරයෙන් ප්‍රකට වෙයි.

විවිධාකාරයේ මිථ්‍යාමතවලට නිජබිමක් වූ මුහුදුබඩ පහතරටියන් අතරේ උපත ලද ගර්සියා මර්කෙස්ගේ ළමා විය ගෙවුණේ සිය මුත්තණුවන්, මිත්තණිය හා නැන්දණියන් ද සමඟිනි. අවතාර, හොල්මන්, පෙරනිමිති, අනාවැකි පිළිබඳ රසකතා ගුලාවක් වැනි වූ ඔහුගේ මිත්තණියත් හමුදා කර්නල්වරයකුව සිට තරුණ කල ද්වන්ද්ව යුද්ධයක දී මිනිසකු මරා දමනු ලැබූ ඔහුගේ මුත්තණුවනුත් කුඩා මර්කෙස්ගේ අංකුර චින්තනයට කෙබඳු සාරවත් පොහොර දිය බෙදා දෙන්නට ඇත්තේ ද යන්නත්, ඒ සරු අස්වනු නෙළා ගන්නට සහෘද රසිකයනට කොතරම් ඉඩ අවකාශයක් විවර කර දී තිබේ ද යන්නත් දැන හඳුනා ගැනීමට මාර්කේස්ගේ නිර්මාණවලින් මහත් වූ අවකාශයක් සැලසෙයි. සෑම වසරක ම පාහේ සර්කස් සන්දර්ශන නැරඹීමටත්, අයිස් පෙන්වීමටත් කුඩා මාර්කේස් රැගෙන ගියේ මේ මුත්තණුවන් ය. මේ සිද්ධි සමුදාය දිදුලන ආභරණවලින් විභූෂිත රූපකායක් ලෙසින් ඔහුගේ කෘතීන් තුළින් ද මතුවෙයි.

'හුදෙකලාවේ සිය වසරක්' නවකතාව මෙසේ ආරම්භ වන්නේ මේ අනුව ය.

වසර බොහෝ ගණනකට පසු වෙඩික්කරුවන්ට මුහුණ දී සිටිය දී සිය පියා අයිස් සොයා ගැනීම සඳහා තමන් කැටුව ගිය ඒ දුරස්ථ සන්ධ්‍යාව කර්නල් අවුරේලියානෝ බුඑන්ඩියාට සිහි විය. එකල මැකොන්ඩෝව ආදිකල්පිත බිත්තර බඳු, සුදු පැහැ, සුවිසල්, ඔපවැටුණු ගල් ඇතිරුණු පත්ලක් මතින් ගලා ගිය පැහැදිලි දියෙන් යුතු ගං ඉවුරක ඉදිකළ මැටි පිරියම් කළ ගෙවල් විස්සකින් යුතු ගම්මානයක් විය. ලෝකය කෙතරම් අලුත් වී ද යත් බොහෝ දේවලට නම් නොතිබුණු අතර, ඒවා ගැන සඳහන් කිරීමට සිදුවූයේ ඒවා දෙසට ඇඟිලි දිගු කරමිනි. සෑම වසරක ම මාර්තු මාසයේ වැරහැලි ඇඳගත් ජිප්සීන් කණ්ඩායමක් ගම අසල තම කුඩාරම් ගසාගෙන නළා හා දවුල්වලින් නඟන උස් ඝෝෂාවත් සමඟ නව සොයා ගැනීම් ප්‍රදර්ශනය කළහ. පළමු ව ඔවුහු කාන්දම රැගෙන ආහ. මෙල්ක්වේඩ්ස් ලෙසින් තමන් ව හඳුන්වාගත් අකීකරු රැවුලක් හා ගේ

කුරුලු අත් ඇති බරැති ජිප්සි ගෝත්‍රිකයෙක් ඔහු මැසිඩෝනියාවේ උගත් ඇල්කෙමිස්ට්වරුන්ගේ අටවෙනි පුදුමය ලෙසින් හැඳින්වූ එය නිර්භීත මහජන ප්‍රදර්ශනයකට තැබුවේ ය.

(හුදෙකලාවේ සියවසරක් - 1 පිටුව)

ළදරු මර්කෙස් ලෝකය දුටුවේ ද විද්‍යාව, තාක්ෂණය පිනුම් ගැසූ යුගයක නොවේ.

විද්‍යාව, තාක්ෂණය ලෝකයේ අබිරහස් සොයමින් අහුමුලු අතගා බලන්නට බොහෝ කලකට පෙර මිනිසුන් ජීවත්වූයේ අබිරහස් පිළිබඳ කුතුහලයෙන් පිරුණු මනස්වලින් යුක්ත ව ය. මේ කුහුල ඇතැම් විට ඔවුනට සෞන්දර්යාත්මක චින්තනයට ද ඉඩකඩ පාදා දී තිබිණ. ලෝකය සියලු අබිරහස්වලින් තොර වූ දාට, විද්‍යාව සියල්ල නිරාකරණය කර දුන් දාට, මිනිසාට අභ්‍යන්තර හිස්කමක්, පාළුවක් දැනී යනු ඇතැයි ද ඔහුගේ කවීත්වය, කලා රසාස්වාදය ඒ සමඟ අහෝසි වී යා හැකි යැයි ද බොහෝ දෙනා සැක පහළ කරති. රූමත් ලලනාවකගේ මුහුණට 'සඳ' උපමා කරන්නේ කවියා ය. විද්‍යාඥයාට එය ආවාටවලින් පිරී ගිය ශුෂ්ක භූමියකි. මිනිසාගේ මනෝභාවයන් පිළිබඳ යම් සත්‍යයක් හෙළිදරව් කළ හැකි වන්නේ නොදියුණු මිනිසුන්ගේ හා දියුණු මිනිසුන්ගේ මානසික සන්තුෂ්ටියෙහි දිග, පළල හා ගැඹුර පිළිබඳ විධිමත් පර්යේෂණයක් දියත් වූ දිනෙක ය.

කෙසේ වුව ද 1967 දී පළ වූ ONE HUNDRED YEARS OF SOLITUDE නවකතාව සාහිත්‍ය ලෝකයෙහි භූමි කම්පාවක් බවට පත් ව තිබිණ. මේ නවකතාවට මුල් වන්නේ එක් පවුලක් හා සම්බන්ධ පරම්පරා පහක් පිළිබඳ කතා පුවතකි. හෝසේ ආකේඩියෝ බුවෙන්ඩියා සහ ඔහුගේ භාර්යාව වන උර්සුලා මේ නවකතාවේ සුවිශේෂ චරිත බවට පත්ව සිටිති. දහනව වන සියවස මුල් භාගයේ දකුණු අමෙරිකාව හරහා ගලා බසින ගංගාවක් අසබඩ 'මැකොන්ඩො' නම් වූ ගම්මානය පිහිටුවන්නේ ඔවුන් ය. මේ නිර්මාණය අපට සංඥා සපයන්නේ අනාගත විදර්ශනාවන් මතුකර දෙන්නේ පුරාකථා ඔස්සේ කොළොම්බියාවේ හරස්කඩක් දැක ගැනීමට ය.

හුදෙකලාවේ සිය වසරක් කෘතියේ උර්සුලා භයානක සොයා ගැනීම් පිළිබඳ ව පසුවන්නේ මහත් බියකිනි. 'ලෝකෙ ගෝලාකාරයි. හරියට දොඩම් ගෙඩියක් වගේ' යනුවෙන් වරක් ප්‍රකාශයට පත් වන තැන දී ඒ නව සොයා ගැනීම් සම්බන්ධයෙන් ඇය ප්‍රතිචාර දක්වන්නේ මෙසේ ය:

"ඔහේට පිස්සු හදාගන්ඩ ඕනෑ නම් කරුණාකරල තනියම ඒක හදාගන්ඩ" යි ඇය බෙරිහන් දෙයි. ඒ, කෝපයෙන් හා නොරිස්සුමෙන් යුතු ව ය.

"ඒත් ඔයාගෙ ඔය අභිගුණ්ඨික අදහස් ළමයින්ගේ ඔළුගෙඩිවලට දාන්න එපා."

උර්සුලාට සිය ජීවිත කාලය තුළ සන්ත්‍රාසය ගෙන එන දේවල් වරින් වර දක්නට ලැබෙයි. මැකොන්ඩෝව ප්‍රාතිහාර්යාත්මක සමෘද්ධියක ගොහොරුවේ ගිලී යද්දී මැටි ගැසූ ගෙවල් වෙනුවට ලී ජනේල සහිත් සිමෙන්ති පොළොව සහිත නිවාස ඉදි වේ. මැකොන්ඩෝවේ ගැමියන්ට නව ආම්පන්න, ලෝකයේ නව සොයාගැනීම් හඳුන්වා දෙන්නේ ජිප්සීන් ය. ඔවුහු විවිධ බඩුභාණ්ඩ, සත්ව විශේෂ මැකොන්ඩෝවට ගෙන එති. විවිධ වර්ණයෙන් පාට කළ ගිරවුන්, ටැම්බොරිනයේ නාදයට රන් බිජු සීයක් දමන කිකිළියන්, හිත් කියවීමට පුහුණු කළ වඳුරන්, බොත්තම් ඇල්ලීමට මෙන් ම උණ බැස්සවීමට ද එකවිට යොදාගත හැකි බහුකාර්ය යන්ත්‍ර, තමන්ගේ අමිහිරි මතකයන් අමතක කරලීම සඳහා යොදාගත හැකි උපකරණ, කැඩපත්, විශාලන කාච ආදී සියල්ල මේ අතර වෙයි.

ලෝකය අලුත් වීම ද සමඟින් මිනිස් ජීවිත සියල්ලෙහි අපමණ වූ වෙනස්කම් සිදුවෙයි. බොහෝ දේවල් උඩු යටිකුරු වී දෙකොන මාරු වී යයි. වසර සියයකට පෙර ඒ පවුලේ ඉතිහාසය ලේඛනගත ව තිබූ ආකාරය කතාව අවසානයේ දී අවධාරණය කෙරෙන්නේ මෙසේ ය:

එය සැබෑ කාලයට අවුරුදු සියයකට පෙර මෙල්ක්වේඩස් (ජිප්සියා) විසින් ඉතා නොවැදගත් විස්තර පවා ඇතුළත් ව ලියනු ලැබූ පවුලේ ඉතිහාසය විය. ඔහු තම මවු භාෂාව වූ සංස්කෘත භාෂාවෙන් ලියා තිබුණු එහි ඉරට්ටේ පේළි ඔගස්ටස් අධිරාජ්‍යයාගේ පුද්ගලික රහස් සංකේතවලට සහ ඔත්තේ පේළි මැසිඩෝනියානු යුද සංකේතවලට හරවා තිබුණි. අමරන්තා උර්සුලාගේ ආදරයෙන් තමන්ව ව්‍යාකූල කර ඇමීමට තමන් ම ඉඩ දෙද්දී ඔහු යාන්තමින් දැකීමට පටන්ගෙන තිබූ අවසන් ආරක්ෂාව පදනම් වී තිබුණේ මෙල්ක්වේඩස් මිනිසාගේ සාම්ප්‍රදායික කාල පටිපාටියට සිදුවීම් ඉදිරිපත් නොකර ශත වර්ෂයක දෛනික සිදුවීම් එක මොහොතක පවතින සේ සංකේන්ද්‍රණය කිරීම මත ය. සොයා ගැන්මෙන් මෝහනය වූ අවුරේලියානෝ මඟ හරින්නේ නැති ව මෙල්ක්වේඩස් ම ආකේඩියෝට අසා සිටීමට සලස්වා මැතිරූ සහ ඇත්තෙන් ම ඔහුගේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අනාවැකි වූ නිවේදනයන් උස් හඬින් කියවූ අතර, ස්වර්ගය කරා පණපිටින් ඉහළට යන ලෝකයේ වඩාත් ම රූමත් ගැහැනියගේ උප්පත්තිය පිළිබඳ නිවේදනය සහ හම් පත්ඉරුවල තේරුම නිර්ණය කිරීම හුදෙක්ම නොහැකියාව සහ උද්යෝගයෙන් තොරවීම නිසා ම නොව, එම උත්සාහයන් නියමිත කාලයට පෙර සිදුවීම නිසා අතහැර දැමූ ඔවුන්ගේ පියාගේ මරණයට පසු උපන් නිඹුල්ලුන්ගේ මූලාරම්භය ඔහු සොයා ගත්තේ ය. ඒ මොහොතේ දී තම සම්භවය පිළිබඳ ව දැන ගැනීමට නොඉවසිලිමත් වූ අවුරේලියානෝ පිටු මඟහැර ඉදිරියට ගියේ ය. ඒ මඟ උණුසුම්, මූලාරම්භක, අතීතයේ කටහඬවල්වලින් පුරාතන ජෙරේනියම් ගස්වල මුනුමුනුවෙන්, මුළාවෙන් මිදීමේ සුසුම්වලින් පිරුණු වඩාත් ම අනවරත අතීත කාමයට පූර්වගාමී වූ සුළඟ ආරම්භ විය.

(හුදෙකලාවේ සියවසරක් - 457-458 පිටු)

මේ නම් ඉන්ද්‍රජාලික යථාර්ථවාදය ම නොවන්නේ දැයි මෙය කියවන පාඨකයාට සිතෙයි. ඉන්ද්‍රජාලය හා යථාර්ථය අතර කවර නම් සහසම්බන්ධයක්, ඒකමිතියක් පවතින්නේ දැයි අනෙක් අතට ප්‍රශ්නයක් ද නැඟෙයි. (ඉන්ද්‍රජාලය හා යථාර්ථය යනු දෙකක් ම වන හෙයිනි) කෙසේ වුව ද ඉකුත් දශක තුනක පමණ කාලය තුළ පෙරපර දෙදිග බොහෝ රටවල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි මහත් වූ විපර්යාසයන් සිදු වූ බව අපි දනිමු. නවීන චින්තන විප්ලවයෙහි ප්‍රතිඵල වශයෙන් ඇතැම් සාහිත්‍ය විචාරකයන් 'චිර සම්භාව්‍ය', 'පරම සම්භාව්‍ය' වශයෙන් එතෙක් පිළිගැනුණු සාහිත්‍ය නිර්මාණ පවා ප්‍රත්‍යවේක්ෂණය කිරීමට යොමු වූයේ මෙකල ය. පරම සම්භාව්‍යත්වය යනු කුමක්ද? එහි සීමා මායිම් කවරේ ද? භාරතයෙහි කාලිදාස, එංගලන්තයේ ශේක්ස්පියර් වැනි සුවිශේෂ නිර්මාණකරුවන්ගේ කෘතිවල පවත්නා සාර්වත්‍රිකභාවය හා සර්වකාලීනභාවය පවා විනිවිද දකිමින් රචනා වූ විශ්ලේෂණ ග්‍රන්ථ බොහෝ ගණනාවක් ද මේ කාලය තුළ පළ වී තිබේ. සාහිත්‍ය කෘතියකට රේඛීය ආඛ්‍යානයක් අනිවාර්ය නොවන බව ද අද දවසේ දී පිළිගැනෙයි.

1946 වසරේ දී පාසලට සමු දෙන මාර්කේස් 1948 වසරේ බොගෝටා විශ්වවිද්‍යාලයේ නීති අංශයට ඇතුළු වෙයි. එහෙත්, ස්වකීය හැදෑරීම් පිළිබඳ ප්‍රාමාණික උද්‍යෝගයක් මුල් කාලයේ දී ඔහු තුළ හට



නොගනී. ලියන්නට පෙලඹවීමක් ඔහු තුළ ජනිත වන්නේ පන්ති අතපසු කරමින් අසම්මත ජීවිත ගෙවූ ලේඛකයන්, පුවත්පත් කලාවේදීන් ඇසුරු කරමින් ගත කරන කිසියම් ගන්ධබ්බ කාලසීමාවක් අතරතුර ය. ඔහුගේ මුල් ම කෙටිකතාව (ලා තෙර්සෙරා රෙසිග්නයියොන්) පුවත්පතක පළ වන්නේ ද මෙකල ය. (මගේ මතකය නිවැරැදි නම් සිංහලට පරිවර්තනය වූ මාර්කේස්ගේ මුල් ම කෙටිකතාව මෙරට පාඨකයා අත පත්වන්නේ 1990 වසරේ ය. 'ඇය ආ හෝරාව' නම් වූ මේ කෙටිකතාව අන්තර්ගත වන්නේ ගාමිණී වියන්ගොඩ පරිවර්තනය කළ 'රාගරිද්ම' කෙටිකතා සංග්‍රහයේ ය.)

ගර්සියා මර්කෙස්ගේ 'නපුරු පැය' නම් වූ ප්‍රථම නවකතාව කලඑළි දකින්නේ 1957 වසරේ ය. අනතුරු ව පුවත්පත් කලාවේදියෙක්, චිත්‍රපට විචාරකයෙක් වශයෙන් නමක් දිනාගන්නා ඔහුට කියුබානු රජය විසින් ලතින් ඇමෙරිකානු මාධ්‍ය ව්‍යාපාරයේ සභාපතිත්වය පිරිනමනු ලබන්නේ ෆිදෙල් කැස්ත්‍රෝගේ ජයග්‍රහණයෙන් අනතුරු ව ය. 'නපුරු පැය' නවකතාව වෙනුවෙන් සාහිත්‍ය ත්‍යාගයකින් පිදුම් ලබන මාර්කේස්, ජගත් කීර්තියට පත්වන්නේ 'සියවසරක හුදෙකලාව' 1967 වසරේ දී පළ වීම ද සමඟිනි. 1969 වසරේ දී මේ පොත සඳහා 'හොඳ ම විදේශ කෘතිය' ට හිමි ත්‍යාගය පිරිනමන්නේ ප්‍රංශයේ සාහිත්‍ය ඇකඩමියයි. ලෝක සාහිත්‍යයට සිදු කළ අනුපමේය වූ මෙහෙවර වෙනුවෙන් මාකේස් නොබෙල් ත්‍යාගයෙන් සිදුම් ලබන්නේ 1982 වසරේ දී ය.

ෆ්‍රාන්ස් කෆ්කාගේ 'රූපාන්තරණය' කෘතිය කියවීමට ලද අවස්ථාව සිය ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක් වූ බව මාකේස් කියයි. පෙර නොවූ විරූ නිදහසක් අත්විඳිමින් සාම්ප්‍රදායික ආඛ්‍යාන රටා අතික්‍රමණය කෙරෙමින් ලියැවුණ රූපාන්තරණය නවකතාව සාහිත්‍ය කෘතියකට රේඛීය ආඛ්‍යානයක් තිබිය යුතු ද යන මාර්කේස්ගේ ගැටලුවට අපූරු පිළිතුරක් සපයා දෙයි. මිත්තණියගේත්, නැන්දණියන්ගේත් අද්භූත කතා, පුරාකතා, මිථ්‍යාකතා, අනාවැකි සියල්ල පුරවා අගුළු ලා තිබූ ඔහුගේ ස්මරණ

ගබඩාවට ගිනි ඇවිළ යන්නේ මෙතැන දී ය. ක්ෂණික විදුලි කෙටීමක් වැනි වූ අලුත් නිර්මාණාවේශයක් ඔහු තුළ හට ගන්වන්නේ එයයි.

"එක පාරට ම - මං දන්නෙ නැහැ ඇයි කියල - පොත ලියන්න ඕනැ කොහොමද කියල මට තේරුණා. මා තුළ ඒක මුළුමනින් ම පෙළගැහිල ආව. ඕනැනම් මට තිබ්බ එතන ම ඉඳන් මුල් පරිච්ඡේදෙ වචනෙන් වචනෙට යතුරු ලේඛිකාවකට කියන්න."

ඔහු පසු ව මෙසේ පැහැදිලි කළේ ය: "අවසානයේ දී හුදෙකලාවේ සියවසරක්හි මා යොදාගත් ස්වරය මගේ මිත්තණිය කතාන්දර කියූ ආකාරය මත පදනම් විය. ඇය අද්භූත හා මායාකාරී දේවල් කියූ මුත් ඈ ඒවා සම්පූර්ණ ස්වාභාවික ආකාරයකින් කීවා ය. වඩාත් ම වැදගත් දෙය වූයේ ඇගේ මුහුණේ ස්වරූපයයි. කතාන්දර කියද්දී ඇය තම බැල්ම කොහෙත්ම වෙනස් නොකළ අතර ඉන් සියලු දෙනා ම මවිතයට පත්වූහ."

(හුදෙකලාවේ සියවසරක් - පෙරවදනින්)

පාඨක ලෝකයේ ඇඩි අවධානයට ලක් වූ මාර්කේස්ගේ අනෙක් කෘතිය ලෙස නම් කළ හැකිවන්නේ Love in the Time of Cholera (කොලරා කාලේ ආලේ) නම් වූ කෘතියයි (මෙහි සිංහල පරිවර්තනය කර ඇත්තේ ද ගාමිණී වියන්ගොඩයි). ජීවිතයේ අවර භාගයේ දී සිය කුලුඳුල් ප්‍රේමය පිදූ ගැහැනිය සමඟ තනිවන මහලු මිනිසෙකු (ෆ්ලොරෙන්තිනෝ අරීසා) තුළ හට ගන්නා ආහ්ලාදය මේ පොත අවසානයේ වචන කිහිපයකට හකුළුවා ඇත්තේ මෙසේ ය:

"අසීමිත වන්නේ මරණයට වඩා ජීවිතයයි."

මර්කෙස්ගේ බොහෝ නිර්මාණ පාඨකයාට උත්තේජනය සපයන්නේ ජීවිතයට පෙම් බඳින්නට ය. ඔහු ප්‍රතිනිර්මාණය කළ මනුෂ්‍යත්වයේ පරම වූ සංධ්වනිය පාඨකයාගේ සිත්සතන් තුළ තවමත් ධ්වනි නංවමින් පවතින්නේ ඒ නිසා ය. වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම විශිෂ්ට ලේඛකයකු වූ මර්කෙස් වෙතින් (ඔහුගේ චරිතාපදානයෙන්) අපගේ එක්තරා පැනයකට කිසියම් පිළිතුරක් සැපයී ඇති බව ද සිතෙයි. මේ පැනය නම් 'සැබෑ ලේඛකයා යනු කවරෙක් ද?' යන්නයි.

මේ ඊට මර්කෙස් දෙන පිළිතුරයි.

තමාගේ පාවහන් හිල් වී තිබුණත්
තමාගේ පොත් නොවිකිණී තිබුණත්
හොඳ ලේඛකයා දිගට ම ලියයි.



**කැත්ලීන් ජයවර්ධන**

*කෙටිකතා හා නවකතා කතුවරියකි. ප්‍රවීණ ගුවන්විදුලි නාට්‍ය ලේඛිකාවකි. සාහිත්‍ය තීරු ලිපි ලේඛිකාවක් සහ සාහිත්‍ය විචාරිකාවකි.*

ඔහු සිය නිර්මාණවලින් ලතින් ඇමෙරිකාව ගැන ලෝකයාට කිව්වේය. අප කවුදැයි හඳුන්වා දුන්නේය. එම පොත් අපට අපගේ හැඩ රුව බලාගැනීමට හැකි කැඩපත් බඳුය.

**චිලී ජාතික ලේඛිකා**
**ඉසබෙල් අයියෙන්දේ**

# මහා අම්මාගේ මළගම

## ගබ්රියෙල් ගර්සියා මර්කෙස්

මැකොන්ඩෝ රාජ්‍යයේ රැජින ලෙස පරමාධිපත්‍යය දැරූ මහා අම්මා අවුරුදු අනූ දෙකක් ආයු වළඳා පූජනීයත්වයේ රස් විහිදුවමින් පසුගිය සැප්තැම්බර් මාසයේ එක්තරා අඟහරුවාදා දිනයක මිය ගියාය. අවමඟුල් මෙහෙයට පාප්වහන්සේද සහභාගි විය. ඈ පිළිබඳව මෙම සත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්නේ මුළු ලෝකයේම සිටින, ඇති තතු නොඅදහන්නන්ගේ දැන ගැනීම පිණිසය.

මුළු ජාතියේම ජීවය සසල කළ මේ සිදුවීමෙන් පසු දැන් යළි සියල්ල සමතාවකට පැමිණ ඇත. මෙතුවක් කලක් මහත් සෝදිසියෙන්, සීරුමාරුවෙන් සිටි, සැන් ජසින්තෝහි බෑග් පයිපර් සංගීත කණ්ඩායම්, ගුවාජිරාහි හොර ජාවාරම්කාරයෝ, සිනුහි වී ගොවිතැන් කරන්නෝ, කොකාමයාල් හි වෛශ්‍යාවෝ, සිර්පිහි විජ්ජාකාරයෝ අරකටාකාහී කෙසෙල් වවන්නෝ ඇතුළු සියල්ලෝම, සිය මඩු කුඩාරම් අකුළා දමා සැනසුම් සුසුම් හෙළූහ. ජනතාව පමණක් නොව නොයෙකුත් අධිබලවේග නියෝජනය කරන ජනරජයේ ජනාධිපති, මැති, ඇමතිවරු ඇතුළත් සෙසු නියෝජිතවරුන් ඉතිහාසයේ සනිටුහන් කළ මෙම මහාර්ඝ අවමංගල්‍ය උත්සවයෙන් පසු තම තමන්ගේ දේපළවල පාලනය යළි සියතට ගත්හ. ශුද්ධෝත්තම පාප්වහන්සේත් සිය කය හා ආත්මයත් සමඟම ස්වර්ග රාජ්‍යයට එසවී ගොස්ය. එනමුත් මැකොන්ඩෝ පෙදෙසෙහි කෙනෙකුට ඇවිද යන්නට හැකියාවක් නැත. හේතුව භූමදානයට සහභාගිවීමට පැමිණි ජනයා විසින් ඉවත දමන ලද බෝතල්, සිගරැට් කොට, සූප්පු කරන ලද මස්කටු, හිස් ටින්, කඩමලු පමණක් නොව, පහ කරන ලද මළමුත්‍රවලින් ද ගහන වී තිබීම නිසාය. ඒ නිසා ඉතිහාස රචකයන්ගේ ආගමනයට පෙර ඉදිරි දොරටු බංකුවක් තබා තරකොට මෙම ජාතික ව්‍යසනය ගැන සියලුම විස්තර කියා පෑමට කදිම අවස්ථාව මෙයයි.

බඳින ලද කෙළවරක් නැති පත්තු, අලවන ලද අබ පැලැස්තර සහ කූඩැල්ලන් ලවා විස ඇද්දවීම් ඈ ප්‍රතිකාරවලින් සුවයක් නොලත් තැන මරණ වේදනාවෙන් පීඩිත වූ මහා අම්මා සති දහහතරකට පෙර, ඇගේ අන්තිම කැමති කටයුතු සඳහන් කරන්නට සිතුවාය. ඒ සඳහා

ඇය ඇගේ පැරණි වැල් කැඩුණ පැද්දෙන වේවැල් පුටුවේ හිඳුවන ලෙස නියම කළාය.

මිය යාමට පෙර ඇයට කරන්නට අවශ්‍ය වූ එකම දෙය එයයි. එදින උදේ වරුවේ ඇන්තනී ඉසබෙල් පියතුමාගේ ආධාරයෙන් ඇය ඇයගේ ආත්මය ගැලවීම සම්බන්ධ කටයුතු පිළිවෙළක් කරගෙන තිබිණි. දැන් ඇයට අවශ්‍යව ඇත්තේ ඇගේ ලෞකික කටයුතු නිසි පිළිවෙළක් කර ගැන්මයි.

ඒ සඳහා ඇගේ දේපලවලට එකම උරුමක්කරුවන් වූ ඥාති පුත්තු හා දියණියෝ නව දෙනෙක් ඇගේ ඇඳවටා කැඳවනු ලැබ සිටියහ. සිය සියවන උපන් දිනය පැමිණෙන්නට ආසන්නයේ සිටි පූජකතුමා තමන්ටම කිසිවක් මුමුනමින් කාමරයේම රැඳී සිටියේය. ඉහළ මාලයේ වූ මහා අම්මාගේ නිදන කාමරයට පියතුමා ඔසවාගෙන ඒම සඳහා මිනිසුන් දහ දෙනෙකු සොයා ගැනීමට සිදුවිය. ඒ නිසාම කාමරයේ නැවතී සිටිනු මිස නැවත පහත මාළයට ඔසවා ගෙන නොයාමට තීරණය කරන ලද්දේ එසේ වුවහොත් අන්තිම මොහොතේ නැවතත් ඔසවාගෙන ඒමට සිදුවන බැවිනි.

නිකනෝර්, ඛාකි ඇඳුමකින් හා අසරුවන් පළඳින බූට් සපත්තු යුගලකින් සැරසුණ යෝධ හා දරුණු පෙනුමක් සහිත තැනැත්තා වැඩිමහල්ම ඥාති පුත්‍රයා විය. කොපුවෙහි ලන ලද 38 රිවොල්වරයක් සිය කමිසය තුළ රුවා ගෙන සිටි ඔහු නොතාරිස්වරයා කැඳවනු පිණිස පිටතට ගියේය. අති විශාල අඳුරු කාමරවලින් යුත් දෙමහල් මන්දිරයේ නොයකුත් අල්මාරි හා වෙනත් ලට්ට ලොට්ටවලින් පිරී, තිබුණු අතර, පරම්පරා හතරක කාලයක් ඇවෑමෙන් දූහුවිල්ලෙන් ගහනව පැවතිණ. ඉන් එක්තරා විදියක ඉක්ෂුපාක මත්පැනක හා ශාක වර්ගයක සුවඳක් විහිදිණි. ඒ මොහොත අපේක්ෂාවෙන් සිටි නිසා සතියකට පෙර සිටම මන්දිරයේ කටයුතු අඩපණ වී තිබුණේය.

දික් මැද ශාලාවේ ගොවිපළේ කම්කරුවෝ ගොවි උපකරණ මතත්, ලුණු ගෝණි මතත් ඇලව සිටියෝ කොයි මොහොතේ වුව මෙම අසුබ ආරංචිය ලත් වහාම කොටළුවන් සූදානම් කරගෙන දිගන්තය තෙක් පැතිර ඇති ගොවිපළේ සතර අතටම ගොස් එය සැලකිරීමට ය. මෙම මැද ශාලාව කලකට පෙර යොදාගත්තේ මස් කරන ලද ඌරන් බිත්තියේ සවිකර තිබූ කොකුවල එල්ලා තැබීමටත්, අලස ඉරු දිනයන්හි මුවන් මස් කිරීමටත්ය. පවුලේ අනෙකුත් අය ශාලයෙහි සිටියහ. උරුම කටයුතු දිග්ගැස්සීම නිසාත් නිදිමරා සිටි නිසාත් ගැහැනු උදවිය කොරගසමින්, උන්හ. ඔව්හු සිටියෝ ශෝකය පළ කරන ලීලාවෙනි. ඔවුන්ගේ එම ශෝක ලීලාව වෙනත් බොහෝ නොමිණිය හැකි ශෝක ලීලාවන්ගේ සම්මිශ්‍රණයෙන් සැදුණක් මෙන් පෙනිණ. මහා අම්මාගේ මාතෘමූලික දෘඪතාව ඇගේ සියලුම දේපළ හා වස්තූන් වටා ඒකරාශීව තිබුණ අතර, ඇගේ නම ආගමික චාරිත්‍ර වාරිත්‍ර ආලේපනය වූ වැටකින් වටවී ඇත්තා සේ වීය. ඒ නිසාම මාමාවරු ඔවුන්ගේ ලේලියන්ගේ දුහිතෘවරුන් විවාහකරගත්හ. ඥාති පුත්තු ඔවුන්ගේ නැන්දණියන් විවාහයට තෝරා ගත්හ. සහෝදරයෝ ඔවුන්ගේ නෑනාවරුන් කරකාරයට ගත්හ. එය නැවතුණේ ලේ ඥාතිත්වය ඇත්තවුන්ගේ ආවාහ විවාහ හේතුවෙන් හටගත් පටලැවිලි ජාලය දරුවන් බිහිවීම නිසා මතු කළ ගැටලු නිසා මේ ක්‍රියා දාමය විෂම චක්‍රයක් බව පෙනී යාමෙනි. ළාබාලම ඥාති දියණිය මග්දලේනා පමණක් මෙයින් ගැලවී ගත්තාය. සිතින් මවාගත් මෙම භ්‍රාන්තියෙන් ඇය දිස්ත්‍රික් පූජක පුහුණු ආශ්‍රමයේදී ඇන්තනී ඉසබෙල් පියනම ලවා තමන්ටත් වැහී ඇති භූතාත්මය පලවා හැරීමට ක්‍රියා කළාය. එසේම ඇගේ හිස මුඩු කරවා ගත්තාය. සියලුම ලෞකික සුදීප්තිමත් අවස්ථාවන් හා හිස් නිසරු වටිනාකම් ඇති දේ අත්හැර දැමුවාය.

ප්‍රධාන නීත්‍යානුකූල පවුල හැරුණුවිට මහා අම්මාගේ රැකවරණය යටතේ සිටි තවත් පිරිසක් වූහ. ඒ තමන්ගේ බල පරාක්‍රමය හේතුවෙන්, ප්‍රධාන පවුලේ පිරිමින් විසින්, සත්ව ගොවිපළවල, අතුරු මං වල පුංචි ගම්මානවල ගැහැනුන් වසඟයට ගැනීමෙන් බිහිකර ඇති අවජාතක දරුවෝය. ඔවුහු නිසි පිය උරුමයක්, වාසගමක් නැති දේව දරුවන්, සේවකයන් හා හිතෛෂීන් වශයෙන් ප්‍රධාන පවුලේ රැකවරණය ලැබූහ. කොයි මොහොතේ වුව සිදුවීමට ඇති ඇගේ මරණය ඔවුන්ගේ බලාරොත්තු කළඹවාලීය. මියයාමට ආසන්නව සිටි කාන්තාවගේ කටහඬ කලින් නම් මහත් පූජනීත්වයක් හා කීකරු ලෙස සියල්ලන් කැඳවනු ලබන අති ප්‍රබල වූවකි. දැන් ඇගේ හඬ කාමරය තුළට පමණක් ඇසෙන්නේ සියුම් නළා හඬක් පරිද්දෙනි. එහෙත්, ඒ හඬ මහා විශාල ගොවිපළේ අස්සක් මුල්ලක් නැර දෝංකාර දෙයි. කිසිවකු මෙම මරණය සුළුවට ගත්තේ නැත. මහා අම්මා මෙම ශතවර්ෂය තුළ මැකොන්ඩෝහි ගුරුත්ව ලක්ෂය වූවාය. ඊට පෙර ඇගේ සොහොයුරන්, ඇගේ දෙමාපියන් හා දෙමවුපියන්ගේ දෙමාපියන්, ආදී සියල්ලෝම ශත වර්ෂ දෙකකට අධික කාලයක් තුළ සිය ආධිපත්‍යය විහිදුවා සිටි අය වූහ. නගරය ආරම්භ කර නම් කර තිබුණේ ඔවුන්ගේ වාසගම අනුවය. එහි මූලාරම්භය කිසිවකු දැන සිටියේ නැත. ඇගේ බූදලයේ වටිනාකම මෙතෙකැයි කියා සිතාගත නොහැකි විය. එ නමුත් ගලායන හා නිසල ගංගා හා ජලාශ, වැස්ස හා නියඟය, දිස්ත්‍රික්කයේ සියලුම පාරවල්, දුරකථන කණු, අධික වර්ෂා, අධි උෂ්ණ කාලගුණය ආදී සියල්ලේම අයිතිකාරිය ඇය බව පිළිගන්නට සියල්ලෝම සැදී පැහැදී සිටියහ. සියලුම ජීවිත හා දේපළ පිළිබඳව පාරම්පරික අයිතියක් ඇයට ඇති බවත් තවදුරටත් විශ්වාස කළහ. සිහිල් සුළඟ හමන සැන්දෑවේ සිය මන්දිරයේ මතු මහලේ, සඳලුතලයේ ඇගේ පැද්දෙන පුටුවෙහි සිය උදරයේ හා අධිකාරීත්වයේ බර ඔබා වාඩිවී සිටිද්දී ඇත්ත වශයෙන්ම ඇය අසීමිතව ධනවත් එසේම බලවත් කාන්තාව සේ පෙනුණා පමණක් නොව, මුළු ලෝකයේම පොහොසත් හා බලවත්ම කත ඇය බව පැහැදිලි විය.

මහා අම්මා මරණයට පත්වන අයෙකු ලෙස කිසිවකු නොසිතුවද ඇත්තනී ඉසබෙල් පියනමගේ වෘධ මඟ පෙන්වීම නිසා පවුලේ සැම පමණක් නොව, ඇය ද ඒ බව පිළිගත්තාය. එහෙත්, ඇය සිතුවේ ඇගේ මවු පාර්ශ්වයේ අත්තම්මා මෙන් වසර සියයකටත් වැඩි කාලයක් ජීවත්වන බවයි. ඇගේ අත්තම්මා 1885 යුද්ධයේදී කර්නල් ඔර්ලියානෝ බුවෙන්ඩියාගේ සංචාරක භටයන් සමග වතුයායේ මුළුතැන් ගෙහිදී ගැටුමක් ඇති කරගත්තියක ද වූවාය. පෙදරේරුවන් හා ඇති වූ ගැටුමකදී, ඔවුන් නිමාවට පැමිණවීමට අවශ්‍ය බලය තමනට දෙවියන් වහන්සේ නොදෙන බව මහා අම්මාට අවබෝධ වූයේ මේ වසරේ අප්‍රේල් මාසයේදීය.

වේදනාව ඇති වූ මුල් සතියේ දී පවුලේ වෛද්‍යවරයා අබ පැලැස්තර දැමීමෙන් හා ලොම්න් නිමකළ මේස් පැළඳවීමෙන් එය සුව කිරීමට කටයුතු කළේය. ඔහු පාරම්පරික වෛද්‍යවරයෙකි. මොන්ට්පෙලර් හි උපාධිධාරියෙකි. ඔහුගේ විද්‍යාත්මක මාර්ගයේ දියුණුවට විවිධ සතුරුකම් ද ඇතිවිය. ඒ නිසාම මහා අම්මා වෙනත් වෛද්‍යවරයෙකුට මකොන්ඩෝහි ප්‍රතිකාර කිරීම වැළැක්වීම නිසා, ඔහුට ජීවිත කාලයටම අගනා වරප්‍රසාදයක් හිමිවිය. කලකට පෙර හේ අසරණ රෝගීන් පරීක්ෂා කරනු සඳහා සවස් වරුවේ නගරයේ සැරිසැරුවේ අසෙකු පිටය. අනෙකුන්ගේ දරුවන්ගේ පියා වීමේ වරප්‍රසාදය ඔහුට ස්වභාව ධර්මය විසින් උරුම කර දී තිබිණ. සන්ධි ඉදිමීමේ රෝගයට ගොදුරු වූ ඔහුට ඇඳට වී සිටින්නට සිදුවීම නිසා, රෝගීන්ට ප්‍රතිකාර කරන්නට සිදුවූයේ රෝග ගැන උපකල්පනය කිරීමෙන් පණිවිඩකරුවන් සපයන තොරතුරු



මගින් හා වෙනත් සන්දේශන මාර්ගයෙන් මිස ඔවුන් පෞද්ගලිකව පරීක්ෂා කිරීමෙන් නොවේ. මහා අම්මා ඔහු කැඳවූ අවස්ථාවේ ඔහු රාත්‍රී නිදන ඇඳුම පිටින් දැතින් වේවැල් සැරයටි දෙකක් ආධාරයට යොදාගෙන රෝගී කාන්තාවගේ නිදනකාමරයට විත් ඈඳී ගත්තේය. මහා අම්මා මිය යන්නට ආසන්න බව වටහාගත් ඔහු බෙහෙත් පෙට්ටියක් ඇණවුම් කොට ගෙන්වා ගත්තේය. ලතින් බසින් නම්කර තිබූ විවිධාකාරයේ පෝසිලේන් බඳුන්වල වූ නොයෙකුත් ආකාරයේ සුවාලේප ඇගේ සිරුරේ හැම තැනම ගල්වමින්ද නොයෙකුත් වටිනා උත්තේජක වර්ග හා කල්ක ලබා දෙමින්ද තෙසතියක් හේ ප්‍රතිකාර කළේය. පසුව ඇගේ වේදනාව ඇති තැන්වලට පිරිපුන් ඉස්ගෙඩියන් ස්පර්ශවන්නට සැලැස්වීමෙන් හා වකුගඩුවලට කුඩැල්ලන් මාර්ගයෙන් ද පසුදා අලුයම තෙක් ප්‍රතිකාර කළද ගුණයක් නැති හෙයින් වඩා යෝග්‍යවන්නේ කරනවෑමියා ලවා ඇමූ කැපුමකින් ලේ ගලන්නට සැලැස්වීමද නැතිනම් ඇන්තනී ඉසබෙල් පියනම ලබා යක්ෂා වේශය දුරු කර ගැනීමේ වතාවත් කිරීමද යන ගැටලු ප්‍රශ්නයට මුහුණ පා සිටියේය. පියතුමා කැඳවා ගෙන එන්නට නිකනෝර් පිටත් කර හැරිණි. නිකනෝර්ගේ ශක්තිමත්ම මිනිස්සු දස දෙනෙකු පියතුමා මීසම් නිවසේ සිට මහා අම්මාගේ නිදන කාමරයට ඔසවාගෙන ආවේ කිරිකිරිගාන පැද්දෙන පුටුවක තබාගෙනය. පුස් බැඳුණ උඩු වියනක් සහිත එම පුටුව විශේෂ අවස්ථාවලදී භාවිතා කිරීමට තබා ගත්තකි. උණසුම් සැප්තැම්බරයේ අලුයම මරණාසන්න වූවෙකුට ලබා දෙන, දිව්‍ය සත්ප්‍රසාදය හඟවමින් හඬවන සිහින් සීනු නාදය, මැකොන්ඩෝ නුවරුනට ප්‍රථම ඇන්වීම ලබා දුන්නේය. එදින හිරු නැගෙත්ම මහා අම්මාගේ මන්දිරය ඉදිරියෙහි වූ පුංචි සාප්පු සංකීර්ණයේ ගෙමිදුල හරියට ගමේ පොළක් ලෙසින් දිස්විය. එය හරියට වෙනත් යුගයක ස්මරණයක් බඳුවිය. සැත්තෑවිය පසුකරන තෙක්ම මහා අම්මා සිය

උපන්දිනය සැමරුම දිගු කලක් ගතවන අමතක නොවන සැණකෙළියක් බවට පත් කළාය. සිහින් ගෙල සහිත අති විශාල රම් මත්පැන් බෝතල් නුවරුන්ගේ සතුට සඳහා තැන තැන තබා තිබිණි. මහජන සාප්පු පරිශ්‍රයේ ගවයන් මස්කොට තිබුණේ ඒ වෙනුවෙන් කෙරෙන පුද පූජාවකට අනතුරුවය. උස් පීඨිකාවක සිට සංගීත කණ්ඩායමක් දින තුනක් තිස්සේ නොකඩවා සංගීතයෙන් නුවරුන් සනසාලූහ. මේ සියවසේ මුල් සතියේදී කර්නල් ඖරලියානෝ බුවෙන්ඩියා සිය හමුදා භටයන් හා කඳවුරු බැඳ තිබූ ස්ථානයේ, කොට්ටම්බා තුරු සෙවණේ නොයෙකුත් දේ විකුණන කුටි තනා තිබිණි. ඒවායේ කෙසෙල්, මත්පැන්, නොයෙක් රසමසවුළු, පලහන ලද මස් කැබැලි, සොසේජස්, යුකා පාන් ඇතුළු කෙටි ආහාර පාන රාශියක් විකිණීමට තබා තිබිණ. ඒ හැරුණ විට කුකුළු පොර කෙටීම් ද විය.

සෙනඟගේ කලිකලහ අස්සේ මහා අම්මාගේ රුවට සමාන රූ ගත් පින්තූරත් උඩුකය වස්නාත් අලෙවි විය.

උත්සව කටයුතු ආරම්භ වූයේ ඇගේ උපන් දින දෙකකට පෙර සිටය. අවසන් වූයේ උපන් දින දා මහ හඬින් පිපිරූ රතිඤ්ඤාවලින්, හා මහා අම්මාගේ නිවසේ පැවති බාල් නැටුම්වලින් පසුවය. ඉතා සීරුවෙන් තෝරාගත් අමුත්තෝද නීත්‍යානුකූල පවුල් සාමාජිකයෝද පමණක් නොව, නොමසුරුව සහභාගි වූ සුජාත නොවූ සාමාජිකයෝද පැරණි පියානෝ සංගීතයට නැටූහ. ශාලාවේ පසුපස පහසු අසුනක, ලිනන් කොට්ට අතර වාඩිවී සිටි මහා අම්මා ප්‍රධානියා ලෙස සාදය මෙහෙයවූවාය. සියලුම ඇඟිලි රන්මුදුවෙන් සරසාගෙන සිටි ඇගේ දකුණු අතින් ඈ රහසිගත විවිධ සංඥා මගින් යම් යම් දේ පාලනය කළාය. ඊළඟ වසරේ සිදුවන විවාහ බොහෝවිට තීරණය වූයේ එදින රාත්‍රියේ සාදයේදී ය. ඇතැම් විට පෙම්වතුන්ගේ සංකීර්ණතා පැවතුණත් අවසානයේදී ඇගේ ආභාසය ලැබ ඒවා ස්ථිර විය. සාද සන්තුෂ්ටිය නිමවූයේ මල්දම්වලින් හා අලංකෘත ජපන් ලන්තෑරුම්වලින් සැරසූ සඳලුතලයට මහා අම්මා පැමිණ පහත රැස්ව සිටි මහා සෙනඟට කාසි විසි කිරීමෙනි.

මෙම සම්ප්‍රදාය විටින්විට කඩවූයේ එක්කෝ පවුලේ සාමාජිකයෙකුගේ මරණය හේතුවෙන් ශෝක කාලයක් ගෙවීමට සිදුවීම නිසා හෝ පසුගිය වසර කීපය තුළ රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය නිසාය.

මෙම මනබඳනා උපන් දින උත්සව ගැන නව පරපුරේ අය දැන ගත්තේ කථා මාත්‍රයෙන් පමණි මහා අම්මා දේවස්ථානයේ මහා පූජා මෙහෙයට සහභාගිවනු පවා ඔවුනට දැකගත නොහැකි විය. ඇය මෙහෙයට සහභාගී වන අතරේ ඇයට පවන් සැලීම සඳහා සිවිල් අධිකාරියේ කිසියම් අයෙකු යොදවා තිබිණ. එසේම පූජා මෙහෙය පවත්වන අවස්ථාවේ දණ ගැසීමට අවශ්‍ය තත්හිද ඇය දණ නොනැමූයේ එය ඇයට පමණක් සීමාවුණ වරප්‍රසාදයක් බැවිනි. සත්ප්‍රසාදය ඉහළට ඔසවන අවස්ථාවේවත් ඇය දණින් නොවැටුණේ සීරුවට නමා රැලි තබා තිබූ ඕලන්ද සාය සහ හොඳින් කැඳ දමා මැද තිබූ කේම්බ්‍රික් යට ගවුම් ආදිය පොඩිවීමට ඉඩ ඇති බැවිනි. සිය පියාගේ අවමංගල උත්සවයේදී මන්දිරයේ සිට දේවස්ථානයේ ප්‍රධාන අල්තාරය දක්වා අතුරන ලද යාර දෙසීයක් දිගු පලස මත අවමංගල මෙහෙයට සහභාගි වීමට මරියා ද රොසයිරෝ කැස්ටැන්දේ ඇවිද ගිය සැටිත් අවසානයේ දී නගර වීථියෙහි එළන ලද පලස් මතින් මහත් අභිමානයෙන් හා තේජස් විලාසයෙන් යළි මන්දිරයට පැමිණි අන්දමත් පැරන්නෝ, තමන් දුටු සිහිනයක් ලෙස සිහිපත් කර ගත්හ.

ඒ සමගම දෙවිසි හැවිරිදි වියේදීම ඇය මහා අම්මා තනතුර උරුම කරගත්තාය.

එවකට මධ්‍ය කාලීන දැක්ම අයත්ව තිබුණේ පවුලේ අතීතයට පමණක් නොව, මුළු

ජාතියේම අතීතයටය. උණුසුම් සවස් කාලයන්හි දී පේරෙනියම් මල් සැරසිලි අතර සිරවී ඇගේම පුරාවෘත්තයේ නිමග්නව සඳලුතලයේ හිඳහුන් මහා අම්මා බෙහෙවින්ම ජනයාට දැක බලා ගත නොහුන දර්ශනයක් විය. ඇගේ බලාධිකාරය ඇ ක්‍රියාත්මක කළේ නිකනෝර් මාර්ගයෙනි. නිහඬ ගිවිසුමක් පැවති අතර මහා අම්මා සම්ප්‍රදායට අනුකූලව සිය අන්තිම කැමැත්තට මුද්‍රා තැබූ විට සම්ප්‍රදායට අනුකූලව ඊට උරුමකරුවෝ රාත්‍රි තුනක් තිස්සේ විවෘත තුටු පහටු උත්සව සංවිධානය කළෝය. එහෙත්, ඒ අතරම මිය යාමට ආසන්න පැය කීපය එළඹෙන තුරුම ඇගේ අන්තිම කැමැත්ත හෙළි නොකිරීමට ඇ ගෙන ඇති තීරණය කවුරුත් දැන සිටියහ. එසේම මහා අම්මා මිය යනු ඇතැයි කිසිවකු ශෞඛ්‍යවත් සිතුවේද නැත.

අවසාන සත්ප්‍රසාදය පිරිනමනු ලබන මොහොතේ හඬවන සීනු නාදය ඇසීමෙන් පසු මැකොන්ඩෝ නුවරු, මහා අම්මා වුව මරණයට ගොදුරු වන්නියක බව පමණක් නොව, දැන් ඇය මරණයේ දොරටුවට ළඟා වී ඇති බවද දැනගත්හ.

ඇගේ නික්ම යාමේ පැය පැමිණ ඇත. ගෙල මුදුන දක්වාම කෝමාරිකා මිදුලු තවරාගෙන, දූවිලි ගැහුණු වියන යටවූ ඇඳෙහි වැතිර සිටින ඇය දකින්නෙකුට ඇය ඇයගේ මාතෘක පියයුරු සෙමෙන් සෙලවෙන සේ යාන්තමට හුස්ම ගන්නා සැටියෙන්, ඇය ජීවතුන් අතර සිටීද යන්න ගැන පවා සැකයක් උපදී. මහා අම්මාට පනස් විය පිරෙන තෙක්ම විවිධාකාර සරාගී මනාලයෝ ඇගේ අත පතා ආහ. ඇය ඒ සියල්ලම ප්‍රතික්ෂේප කළාය. ඉරණම විසින් ඇගේ අනාගතය තීන්දු කිරීමට ඉඩ හරිමින් . ඒ නිසාම ඇය මිය ගියේ කන්‍යාවක ලෙසිනි. දරුවන් නැති තැනැත්තියක ලෙසිනි. අවසාන මොහොතේ අවස්තය දීමට ශුද්ධ වූ තෛලය ආලේප කිරීමට, ඇන්තනී ඉසබෙල් පියතුමාට ඇගේ දැතේ අත්ල දිග හැර ගැනීමට කිසිවෙකුගේ උපකාරය අවශ්‍ය වූයේ මරණාසන්න මොහොතේ සිටම ඇය ඇයගේ දැත් තරයේ මිට මොළවා ගෙන සිටි බැවිනි. ඥාති දියණිවරුන් එතැන සිටීම එතරම් පලක් නොවීය. අත්ල දිග හැරීමට කළ අරගලයේදී ඇ වඩාත් ඇගේ අත් සිය ළැමට තදකර ගත්තාය. මුතු මැණික් පැළඳි එම අත් තද කරගනිමින් හිස් බැල්මෙන් සිය ඥාති දියණියන් දෙස බැලූ ඇ “මංකොල්ලකාරියෝ” යයි කීවාය. ඇන්තනී ඉසබෙල් පියතුමා ආගමික වතාවත්හි යෙදෙන අතර එතුමාගේ සහයකයා එම ආම්පන්න සකස් කරන ආකාරය එවිට ඇ දුටුවාය. ඉතා සන්සුන් පියොවින් මෙසේ මිමිනුවාය. “මම දැන් මරණාසන්න අවස්ථාවේ ඉන්නෙ.” එසේ කියූ ඇ විශාල දියමන්තියක් ඇල්ලූ ඇගේ මුදුව ගලවා මග්දලේනාට දුන්නාය. ඇය උරුමක්කාරයන් අතරින් ළාබාලම තැනැත්තිය බැවින් එය ඇයට අයත්විය යුතු විය. එය සම්ප්‍රදායක අවසානය විය. මග්දලේනා ඇයට අයත් උරුම කොටස අත්හැර එය, දේවස්ථානයට අයත්කර දී තිබුණාය.

අවසාන උපදෙස් ලබාදීම සඳහා නිකනෝර් හැර අන් අයට ඉවත්වන ලෙස අලුයම් කාලයේදී ඇ දන්වා සිටියාය. ඇගේ කටයුතු ඉටු කරන අන්දම ගැන හොඳ සිහිකල්පනාවෙන් ඔහුගෙන් විමසා සිටියාය. ඇගේ මෘත දේහයට අවසන් කටයුතු සිදු කළ යුතු ආකාරය ගැන විශේෂ පැහැදිලි උපදෙස් දුන්නාය. අවමඟුල් ගෙදර නිදිමරන්නට පැමිණෙන්නන් ගැන විශේෂයෙන් සඳහන් කළාය. “හොඳට ඇස් ඇරගෙන ඉන්න ඕන” ඇ කීවාය. “ඔක්කොම වටිනා දේවල් ඇතුළට දාල යතුරු දමන්න ඕනා. ඒ මොකද හුගක් මිනිස්සු නිදිමරන්න එන්නෙ මොනව හරි උස්සගෙන යන්න හිතාගෙන.” ටික වේලාවකට පසු ඇය පියතුමා සමග තනිව දීර්ඝ පාපෝච්චාරණයක් කළාය. එය ඉතාමත් අවංක හා විස්තරාත්මක එකකි. ඉන් අනතුරුව සිය ඥාති පුතුන් හා

දියණියන් ඉදිරියෙහි සත්ප්‍රසාදය ලබා ගත්තාය. එයින් පසුවය, ඇගේ අන්තිම කැමැත්ත පළකරනු පහසුව සඳහා ඇය පැද්දෙන වේවැල් පුටුවේ හිඳුවන ලෙස ඉල්ලා සිටියේ.

පිටු විසි හතරකින් යුතුව ඉතා පැහැදිලිව ලියන ලද ඈ සතු සියලුම දේපළ හා වස්තුව පිළිබඳව ඉතා පැහැදිලි විස්තරයක් නිකනෝර් විසින් පිළියෙල කර තිබිණි. වෛද්‍යවරයා හා ඇන්තනී ඉසබෙල් පියතුමා සාක්ෂිකරුවන් ලෙස තබා සීරුවෙන් හුස්ම ගනිමින්, මහා අම්මා ඇගේ ශ්‍රේෂ්ඨත්වයට ගාම්භීරතාවට බලාධිකාරයට හේතු භූත වූ ඇගේ දේපළ පිළිබඳ ලැයිස්තුව සටහන් කරගනු සඳහා නොතාරිස්වරයාට කියෙව්වාය. සත්‍ය ප්‍රමාණ අනුව, ඇගේ වතුපිටි ගේ දොර ආදිය දිස්ත්‍රික්ක තුනකට සීමාවී තිබිණි. ඒවා යටත් විජිතය ආරම්භ කරන ලද අවධියේම රාජකීය අනාඥා මගින් ප්‍රදානය කරන ලද ඒවාය. කාලය ගතවෙත්ම හුදෙක් යම් යම් පහසුතා සඳහා බලෙන් සිදු කරන ලද සංකීර්ණ විවාහ නිසා තව තවත් දේපළ ද මහා අම්මාගේ පාලනය යටතට පැවරුණේය. නිශ්චිත මාඉම් රහිත වූ එබඳු දේපළවල නගර පහක් ඇතුළත් විය. එහි වූ කුඹුරුවල ගොවිතැන් සඳහා අයිතිකරුවෝ, එක වී ඇටයක් වත් ඔවුන්ගේ වියදමෙන් සපයා නුදුන්හ. එහි පවුල් තුන්සිය පනස් දෙකක් අඳ ගොවීහු ලෙස ජීවත්වූහ. සෑම අවුරුද්දේම සිය නාම ශාන්තුවරයාගේ මංගල්‍ය දිනයේදී මහා අම්මා මෙසේ අත්පත් කරගත් ඉඩම් යළි රජයට පවරා ගැනීම වැළැක්වීමට එක් කටයුත්තක් කළාය. එනම් ඒ ඉඩම්වලින් බදු අය කර ගැනීමය. මෙම ඉඩම්වල ජීවත්වීම වෙනුවෙන් බදුකරුවන් ගෙවිය යුතු බද්ද මහා අම්මා ඇගේ නිවසේ පසු ආලින්දයේ සිට එකතු කර ගත්තාය. ශතවර්ෂාධික කාලයක සිටම ඇගේ මුතුන් මුත්තෝ මේ ආකාරයෙන් අඳකරුවන්ගේ මුතුන් මිත්තන්ගෙන් බදු අයකරගෙන ඇත. තෙදිනක් තුළ බදු එකතුවෙන්. පසුව ගේ පසුපස සලපතල මිදුල ඌරන්, කළුකුමුන්, කුකුළන් ආදියෙන් ඇඟිල්ලක් ඔබන්නටවත් ඉඩක් නැති පරිදි පිරී ඉතිරෙයි. වී හැරුණ විට දේවස්ථාන බද්දත් භූමියේ පලගත් නැඹුල් එලත් ත්‍යාගවශයෙන් ගෙනවුත් භාරදුන්හ. ඇත්ත වශයෙන්ම ආරම්භයේ සිට චැඩ් ප්‍රයෝජනයක් නොතිබූ භූමි ප්‍රදේශයෙන් මෙම පවුල ලබාගත් එකම අස්වැන්න වූයේ එයයි. පළමුව ගණන් බැලීමේදී මේ භූමි ප්‍රදේශයට හෙක්ටයාර් එක්ලක්ෂයක් ඇතුළත් බව සඳහන්ය. ඓතිහාසික සිදුවීම් හේතු කොටගෙන මෙම මායිම් තුළ මැකොන්ඩෝ දිස්ත්‍රික්කයේ නගර හයක් දියුණු වී සමෘද්ධියට පත්ව ඇත. ප්‍රධාන නගර සභාවද මේ අතර වෙයි. එහෙයින් මෙහි නිවසක පදිංචිව සිටින කිසිවෙකුට කිසිදු දේපළ අයිතියක් නොමැත. ඔවුන්ට අයිතිව ඇත්තේ පදිංචි නිවස පමණි. සියලුම ඉඩම්වල අයිතිය ඇත්තේ මහා අම්මාට බැවිනි. ඒ නිසා බද්ද ඇයට ගෙවිය යුතු විය. මෙහි වැසියන් නාගරික සංවර්ධන වැඩට යොදා ගැනීම උදෙසා රජයද ඇයට දීමනාවක් ගෙවීය.

ජනයා පදිංචි ප්‍රදේශවලින් බැහැර ප්‍රදේශවල සත්තු විශාල ප්‍රමාණයක් රංචු වශයෙන් ජීවත්වූහ. ඔවුන් ගණනය කිරීමක් සිදු නොවූ අතර, ඔවුන් රැක බලා ගැනීමක් ද නොවීය. ඉබාගාතේ ඇවිද යන ඔවුන්ගේ, පසුභාගයේ යතුරු ඉබ්බෙකුගේ සටහනක් හන ගසා තිබුණි. මෙම පාරම්පරික හංවඩුව අපිළිවෙළක්ව තිබුණ බව ඈත දිස්ත්‍රික්කයන්හිදී විසිර ගිය ගවරංචු පිපාසයෙන් මිය ගිය විටත් ගිම්හාන කාලයේදී අයාලේ ගියවිටත් පැහැදිලි විණි. අන්තිම සිවිල් යුද්ධයෙන් පසුව මන්දිරයට අයත් ඉස්තාල ශීඝ්‍රයෙන් හිස්වන්නට පටන් ගත් අන්දම කිසිවෙක් වටහා ගන්නට උත්සාහ කළේ නැත.

පසුව එම ඉස්තාල උක්දඬු මිරිකන යන්ත්‍ර සවිකිරීමටත්, කිරිදොවන ශාලා ලෙස භාවිත



කිරීමටත්, හාල් මෝලක් සවි කිරීමටත් යොදා ගන්නා ලදි. ඒ හැර නිදහස් සටන අවධියේදී, රත්රන් ආභරණ, පෙට්ටි තුනක බහා කොහේ හෝ වළ දමා ඇති බවත්, විටින් විට මහත් වෙහෙසවී කැණීම් කොට සෙවූමුත් තවමත් හමු නොවූ බවත්, ඇගේ අන්තිම කැමැත්තේ අතිරේකව සඳහන් කළාය. බද්දට දෙන ලද ඉඩම්වලින් ලැබෙන ආදායම් හා දේවස්ථාන බද්ද නැඹුල් එල හා සෙසු පරිත්‍යාග සඳහන් ලේඛනයක් පරම්පරාවෙන් පරම්පරාවට නොකඩවා පවත්වාගෙන යන අතර, ඊට මෙම මෙතෙක් සොයා ගෙන නැති රත්රන් බහාලූ පිළිබඳවද සඳහනක් කිරීමද දිගටම සිදු විය.

ඇගේ මෙම භෞතික හිමිකම් මුළුමනින්ම සඳහන් කරන්නට මහා අම්මාට පැය තුනක් ගත විය. පිරී ඉතිරී තිබුණ නිදන කාමරයෙහි මරණාසන්න ගැහැනිය එක එක දේ ගැන සඳහන් කරන විට එම ස්ථානය ගාම්භීරත්වයට පත්වන අන්දම පැහැදිලිව දැනිණ. ඇගේ වෙව්ලන අතින් මහා අම්මා සිය අත්සන තැබූ පසු සාක්ෂිකරුවෝ ඊට පහතින් අත්සන් කළහ. සාප්පු පරිශ්‍රය ඉදිරියේ වූ දූවිලි ගැහුණු කොට්ටම්බා තුරු සෙවණේ රැස්ව සිටි පිරිසගේ හදවත් තුළ යම් ප්‍රමාණයක ගැස්මක් ඇති විය. ඊළඟට අඩුවූයේ ඇයට හිමි අභෞතික දේවල ලැයිස්තුවක් පමණි. ඇයගේ පරම්පරාවේ අය එම උරුමය ආරක්ෂා කර ඔවුන්ගේ බල පරාක්‍රමය රැක ගැනීමට හැම දෙයක්ම කළහ. මහා අම්මා මඳක් එසවී නිතඹට බර දී අතීත ස්මරණයන්හී රැඳෙමින් බලවත් හා නිහතමානී ස්වරයෙන් ඇගේ අදෘශ්‍යමාන හිමිකම් සටහන් කර ගන්නා ලෙස නොතාරිස්වරයාට කීවාය. මතුපිට පොළොවට යටින් ඇති යටි පස, වෙරළ තීරය, කොඩියේ ඇති වර්ණ, ජාතික ස්වෛරීභාවය, සාම්ප්‍රදායික පක්ෂ, මිනිසාගේ අයිතිවාසිකම් සිවිල් අයිතිවාසිකම්, ජාතික නායකත්වය, අභියාචනයකට ඇති අයිතිය, කොන්ග්‍රසය මගින් විභාග කිරීම්, ලිපි මගින් නිර්දේශ කිරීම්, ඓතිහාසික වාර්තා, නිදහස් මැතිවරණ, රූප රැජිනියන් තේරීම, උත්කෘෂ්ට දේශන, දැවැන්ත පෙළපාළි වැදගත් තරුණ කාන්තාවෝ, නිසියාකාර ලෙස හැසිරෙන මහත්වරු, ශික්ෂණයෙන් යුත් හමුදාවෝ, ඉතා ගෞරවනීය ශ්‍රේෂ්ඨාධිකරණය, ආනයනය නවතන ලද

භාණ්ඩ, නිදහස් මතධාරී කාන්තාවන්, මස් පිළිබඳ ප්‍රශ්නය, භාෂාවේ පිවිතුරු බව පිළිබඳ තත්වය, ආදර්ශවත් හැසිරීම, ස්වාධීන එහෙත් වගකීමෙන් කටයුතු කරන මාධ්‍ය ආයතන, දකුණු ඇමෙරිකාවේ ඇතැන්ස් නුවර, මහජන මතය, ප්‍රජාතන්ත්‍රවාදයේ පාඩම්, ක්‍රිස්තියානි සදාචාරාත්මක හැදියාව, විදේශ විනිමය හිඟවීම, සරණාගත වීමට ඇති අයිතිය, කොමියුනිස්ට් වසංගතය, රාජ්‍ය නෞකාව, ඉහළ යන ජීවන වියදම, ජනරජයේ සම්ප්‍රදායන්, වරප්‍රසාද නොලත් පන්තිය, දේශපාලන සහය පිළිබඳ ප්‍රකාශන, යනාදිය ඊට ඇතුළත් විය.

ඇයට එම ලැයිස්තුව අවසන් කරන්නට නොහැකි විය. දීර්ඝ වූ සටහන් කිරීම් ඇගේ හුස්ම කෙටි කළේය. ශතවර්ෂයන් දෙකක් තුළ සිය පවුලේ බලය රැඳවීම ගැන සදාචාරාත්මක පැහැදිලි කිරීමක් ගැන සිතමින් අවට ඇති කලබලය තුළ ගිලෙමින් සිටි මහා අම්මා මහ හඬින් රාමතෙල් පිට කරමින් අභාවප්‍රාප්ත වූවාය.

එදින සවස් වරුවේ පුවත්පත්හි අතිරේක මුද්‍රණවල පළවුණ විසිහැවිරිදි වියේ කාන්තාවගේ රුව දුටු, නිද්‍රාශීලී නුවර වැසියෝ එය රූ රැජිනක ගේ ඡයාරූපයක් යයි කල්පනා කළහ. අවශ්‍ය සකස් කිරීම් වලින් පසුව තීරු හතරේ ප්‍රමාණයෙන් පළකරන ලද මහා අම්මාගේ ඡායරූපය ඇගේ තාරුණ්‍යය නැවත ළඟාවීමක් බඳුවිය. ඇගේ හිස මත වූ ඝන කෙස් කලඹ ඇත්දලින් නිම වූ පනාවකින් හැඩ කර තිබුණේය. රේන්ද අල්වා තිබූ ගවුම් කර වටා මල්දමකින් අලංකෘත විය.

ශතවර්ෂය ආරම්භයේ, මැකොන්ඩෝ නගරය පසුකර ගිය වීදි ඡායාරූප ශිල්පියකු ගත් මෙම ඡායාරූපය දිගු කලක් පුවත්පත් කාර්යාලයේ සංරක්ෂණ ගබඩාවේ රඳවා තිබුණේ නම නොදත් තැනැත්තියක ගේ පින්තූරයක් ලෙසිනි. ඉදිරි පරම්පරාවන්ගේ ස්මරණයන් අලුත් කර ගන්නා තෙක් එය ඉවසිල්ලෙන් එතැන සිටියා බඳුය. කබල් බස්රථවලත්, අමාත්‍යාංශවල සෝපානයන්හිත් මලානික ස්වරූපයක් ගත් තේ පැන්හල් වලත්, අඳුරු සැරසිලි අතරත් අලවා තිබූ ඡායාරූපය දුටු ජනයා, මෙම ගිනියම් අව්වෙන් හා මැලේරියාවෙන් පීඩිත ප්‍රදේශයේ සිට මිය ගිය කාන්තාව ගැන පූජනීය ගරුත්වයකින් කසුකුසු ගෑහ. පුවත්පත් විසින් පූජනීයත්වයට ඔසවා තබන තෙක් අන්‍ය පළාත්වල ඇගේ නම එතරම් ප්‍රකට නොවීය. හදිසියේ කඩා වැටුණ හිරිපොද වැස්සෙන් එතැන පසුකර යන්නවුන්ගේ සැක සංකා මෙන්ම හිතුත් අඳුරද සේදී ගියේය. ආධුනික හටයන්ගේ ව්‍යායාම ආරම්භ කිරීමේ උත්සවය සඳහා යමින් සිටි ජනරජයේ ජනාධිපති, අනපේක්ෂිත ප්‍රවෘත්තිය දැන ගැනීමෙන් පසු තම්න්ගේ කථාව අවසානයේදී මහා අම්මාගේ මරණය ගැන ගෞරවය දැක්වීම සඳහා මිනිත්තුවක නිහඬතාවක් පැවැත්වීමට කටයුතු කළයුතු බව ඔහුට ලැබුණ විදුලි පුවතේ අනෙක් පැත්තේ සිය අත් අකුරෙන්ම ලියා ඔහුගේ යුද කටයුතු භාර අමාත්‍යවරයාට දැන්වීය. මෙම මරණය නිසා සමාජ වැඩ කටයුතුවල සැලකිය යුතු අවුලක්ද ඇතිවිය. ජලය පවිත්‍ර කරන පිල්ටරයකින් ගලා එන්නාක් බඳු නාගරික හැඟීමෙන් යුතු වූ ජනරජයේ ජනාධිපති මෙම සිද්ධිය නිසා නගරයේ ඇතිවන කැලඹිල්ල සිය මෝටර් රථයේ සිටම වටහා ගන්නට සමත්විය. සුළු අවන්හල් කීපයක් පමණක් විවෘත කර තිබුණේය. නව දිනක් තිස්සේ අවමංගල චාරිත්‍ර පැවැත්වීමට නාගරික දේවස්ථානය සූදානම් කර තබා ඇත.

ජාතික අගනුවර ග්‍රීක තාලේ කුලුනු අසල හා මියගිය ජනාධිපතිවරුන්ගේ නිහඬ ප්‍රතිමා පාමුල පරණ පත්තර එළාගෙන යාචකයන් නිදි අතරේ මන්ත්‍රී මණ්ඩල සභා ශාලාවේ විදුලි පහන් දැල්වෙමින් තිබිණි. අගනුවර පැවති අවමංගල ශෝකාත්මක දර්ශනයෙන් හැඟීම් බර

වූ ජනාධිපති ඔහුගේ කාර්යාලයට ඇතුළු වෙද්දී අවමංගල්‍යයට යෝග්‍ය ඇඳුමෙන් සැරසුණු ඔහුගේ අමාත්‍යවරු ඔහු එනතුරු බලා සිටියහ. ඔවුහු සුදුමැලිව හා වෙනදාටත් වැඩියෙන් අප්‍රාණික ගතියෙන් යුතු වූහ.'

එදින රාත්‍රියේ සහ පසුව ඇති වූ සිදුවීම් ඓතිහාසික පාඩමක් ලෙස පසුව හඳුනාගන්නට පුළුවන. මෙම ප්‍රකට තැනැත්තියගේ දේහය භූමදානය උදෙසා භේදයකින් තොරව බලාධිකාරය දැරූ පුද්ගලයන් එකඟවූයේ ක්‍රිස්තියානි අධ්‍යාත්මය විසින් ඔවුන් මෙහෙයවීම නිසා පමණක් නොව, සමහරක් විට විවිධ කරුණු සම්බන්ධයෙන් මතභේද තිබුණ ද මෙම අවස්ථාවේදී ඒවා සමනය කර ගැනීමට එකඟවූ නිසාත්ය. මහා අම්මා දීර්ඝ කාලයක් තිස්සේ ඇගේ අධිරාජ්‍යයේ සමාජ සාමය හා දේශපාලන එකමුතුව පවත්වා ගත්තාය. ඒ ඇගේ බූදලයේ කොටසක්ව පැවති ට්‍රන්ක පෙට්ටි තුනක් පුරවා තිබූ ව්‍යාජ ඡන්ද නාම ලේඛනවල පිහිටෙනි. ඇය යටතේ සේවය කළ අය, ඇගේ රැකවරණයේ ජීවත්වූවෝ මෙන්ම අඳකරුවෝ ඔවුන්ගේ ඡන්ද බලය පමණක් නොව, මීට ශත වර්ෂයකට පෙර මිය ගිය අයගේද ඡන්ද බලය පාවිච්චි කළහ. ඇය සිය පාරම්පරික බලයෙන් තාවකාලික අධිකාරිය යටපත් කළාය. පොදුජනයා ඉක්මවා ඉහළ පන්තියේ ආධිපත්‍යය පැතුරුවාය. මිනිස් ක්‍රියාකාරකම් නොතකා දිව්‍යමය බලය ගැන විශ්වාසයක් තැබුවාය. ඇගේ බලවත් ආත්ම ශක්තිය මත අවශ්‍ය වූ පරිදි දේව ධර්ම නීතිවලට එකඟවීම හෝ එකඟ නොවීම සිදු කළාය. පුහු තාන්ත මාන්ත භාර ගැනීම හෝ නොගැනීම ඇයට උවමනා පරිදිය. ඇගේ හිතවතුන්ගේ ශුභසිද්ධිය ගැන බැලුවාය. සමහර විට ඒ අවස්ථාවලදී බොරු ප්‍රයෝගකරන්නටත්, නීති බිඳින්නටත් මැතිවරණ ප්‍රෝඩා කරන්නටත් නොපැකිළුණාය. කරදර කාලවලදී තමන්ගේ පාක්ෂිකයන්ට රහසේ අවි ආයුධ ගන්නට මහා අම්මා උදව් කළාය. පසුව ඒ අවිවලින් විපතට පත් වූවන්ගේ සහයට ප්‍රසිද්ධියේ ඉදිරිපත් වූවාය. ජාති හිතෛෂිභාවය හා කැපවීම නිසා ඇයට මහත් ගෞරවයක් ලැබිණි.

මේ අවමංගල්‍යයේ දී ජනාධිපතිට පැවරෙන වගකීමේ බැරෑරුම්කම ගැන ඔහුට ඔහුගේ උපදේශකයන්ගෙන් උපදෙස් ගැනීමට අවශ්‍යතාවක් වූයේ නැත. මාලිගයේ සම්භාෂණ ශාලාවත් පසුපස ගල් ඇතුරූ කුඩා ගෙමිදුලත් අතර කළුපැහැ සයිප්‍රස් ගස් වවා තිබූ පුංචි ගෙඋයනක් විය. යටත් විජිත සමයේදී බිඳී ගිය පෘතුගීසි පූජකවරයෙක් මේ සයිප්‍රස් ගසක ගෙල වැළලා ගත් බව කිය වේ. යටත් විජිත පාලකයන් මේ ගෙඋයන භාවිත කළේ සැහැල්ලු විවේකය සඳහාය. මෙතැන ඔහුට හිතවත් නිලධාරීන් සුළු පිරිසක් කලබලයෙන් ගැවසුණත් ජනාධිපති අඳුර වැටුණු පසු මෙම ස්ථානය හරහා යද්දී ඔහු තුළ යම් සුළු හෝ අවිනිශ්චිත තැතිගැන්මක් ඇතිවේ. එහෙත්, එදින රාත්‍රියේ මතුවූ තැතිගැන්ම අනාගතයේ සිදුවන්නට ඇති අනතුරක සේයාවක් තදින් මතු කළේය. ඓතිහාසික වශයෙන් ඔහු වෙත පැවරී ඇති ඉරණම පිළිබඳ පූර්ණ අවබෝධයෙන් යුතුව, මහා අම්මාගේ මරණය සම්බන්ධයෙන් දින නවයක ජාතික ශෝක කාලයක් ඔහු ප්‍රකාශයට පත් කළේය.

ඒ හැරත් පියබිම රැකගනුවස් සටන් වැද මිය ගිය වීරවරියකට උචිත වූ ගෞරවනීය බුහුමානයක් ද මියගිය ඇයට පිදුවාය. එදින උදේ ජාතික ගුවන්විදුලියෙන් හා රූපවාහිනියෙන් ඔහු පැවැත්වූ ආකර්ෂණීය කතාවේදී ඔහු මේ ගැනද සඳහනක් කළ අතර, මහා අම්මාගේ අවමංගල්‍ය උත්සව කටයුතු මුළු ලෝකයටම ආදර්ශයක් ගෙන දෙනු ඇතැයිද ජාතියේ නායකයා විශ්වාස කළේය.

එහෙත්, කෙතරම් උත්තම ගණයේ අරමුණින් මෙය සිදු කළත් යම්යම් බරපතළ අපහසුතාවන් හා එය ගැටුණේය. මහා අම්මාගේ

මුතුන් මිත්තන් ගොඩ නැගූ අධිකරණ ව්‍යුහය දැන් දැන් සිදුවන මෙබඳු කටයුතුවලට සකස් වී නොතිබිණි. ජන රජයේ ජනාධිපතිතුමාට මෙම අවමංගල්‍යයට සහභාගි වීමට අවකාශ සැලසෙන්නේ කෙසේද යන්න පිළිබඳව කුශාග්‍ර බුද්ධිමත් නීති විශාරදයෝත්, අණපනත් පිළිබඳව සහතිකලත් රස විශේෂඥයෝත්, නීති නිසණ්ඩු පෙරළමින් අර්ථ විභාගයේ යෙදෙමින් හා සංවාක්‍ය තර්කනයෙන් කරුණු සොයා බැලූහ. පූජක උතුමන්, මුදල් ආයෝජකයින් වැනි දේශපාලනයේ ඉහළම ස්තරයේ සිටි අය දින ගණනාවක් තිස්සේ මහත් සීරුවෙන් බලා සිටියහ.

ශත වර්ෂයක් තුළ අතාර්කික නීති රීති සම්පාදනය කළ, මන්ත්‍රී මණ්ඩලයේ විශාල අඩකව සහා ගර්භය තුළ ජාතික වීරයන්ගේ තෙල් සායම් චිත්‍ර හා ග්‍රීක චින්තකයන් උඩකය මූර්ති තබා තිබිණි.

මහා අම්මාගෙන් සිදු වූ මෙහෙය ගැන මන්ත්‍රී මණ්ඩලයේදී පැවැති ශෝක ප්‍රකාශකයේදී ඇය අහස උසට ඔසවා තැබීමක් සිදු විය. ඒ අතරට සැප්තැම්බර් මාසයේ මැකොන්ඩෝහි දරුණු උෂ්ණත්වය නිසාම මහා අම්මාගේ සිරුරේ බුබුළු මතු වී තිබිණි. ජනයා ප්‍රථම වතාවට ඇය ගැන කථා කරන්නට වූහ. වේවැල් හාන්සි පුටුව මත හැන්දෑ වරුවේ අන්දමන්දව සිටි ඇගේ අබ පැලැස්තරවලින් තොර සිරුර ඔවුහු දුටහ. කිසිදා වයසට නොගිය - අති පවිත්‍ර හොඳින් පෙරාගත් ඇගේ කථාන්දරය ඔවුහු පැහැදිලිව වටහා ගත්හ.

නිමක් නැතිව පැය ගණන් දොඩන ලද වචන, වචන, වචන ජනරජය පුරා දෝංකාර දුන්නේය. මුද්‍රිත මාධ්‍යයෙනුත් තවදුරටත් එය සනාථ කරන ලදි.

ඉතාමත් ශුද්‍ර කරුණු ගැනත් දිගටම විවාද කරන මන්ත්‍රී මණ්ඩලයේ ඓතිහාසික කචකචය හදිසියේම නැවතුණේ මහා අම්මාගේ දේහය අංක 104 දරන තැන සෙවණේ තබාගෙන ඔවුන්ගේ තීරණය දන්වනතුරු බලා සිටින බව මතක් කිරීමෙනි. පරම පවිත්‍ර ලිඛිත නීතිය පළාගෙන මතුවුණ මේ කවුරුත් දන්නා කාරණය ගැන කිසිවකු කිසිදු විරෝධයක් පළකළේ නැත. කළයුතු නොයෙකුත් දේ සඳහන් කොට, නොයෙකුත් මතිමතාන්තර සමනය කිරීමෙන් හා ජනාධිපතිතුමාට භූමදානයට සහභාගිවීමට අවසර ලැබෙන පරිද්දෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් අනතුරුව, දේහය එම්බාම් කිරීමට නියම කරන ලදී.

ඇති තරම් කථා බහ ඇතිවිය. ඒවා දසත අත ද පැතිර ගියේය. සයුරු තරණය ද විය. අසුබ නිමිත්තක් සේ පාප්වහන්සේ නිවසන ගොන්ඩොල්ෆෝ මාලිගය හරහාද ඒ සුළඟ හමා ගියේය. ආලස්‍ය අගෝස්තු මාසයේ නිදිමතින් මිදෙමින් සිටි පාප්තුමා ජනේලය අසලට වී, කිමිදුම්කරුවන් අසල වූ වැවේ ගෙල කපා මරා දැමූ තරුණියකගේ හිස සොයමින් සිටිනු බලා සිටියේය. පසුගිය සති කීපය තුළ සවස පුවත්පත්වලට මීට වඩා හොඳ ප්‍රවෘත්තියක් නොවීය. තමන්වහන්සේගේ ගිම්හාන මාලිගයට ඉතාමත් කිට්ටු තැනක සිදුවී ඇති මෙම අබිරහස් සිදුවීම ගැන පාප්වහන්සේටද නොඇසූ කන්ව සිටිය නොහැකි විය. නමුත් එදින සවස් වරුවේ කලින් නොසිතූ දෙයක් සිදුවිය. මෙතෙක් විපතට පත් අයගේ පින්තූර වෙනුවට විසි හැවිරිදි කාන්තාවකගේ විශාල ඡායාරූපයක් පළවිය. "මහා අම්මා" පාප්තුමා විස්මය පළ කළේ එතුමන් ශාන්ත පීටර්තුමාගේ අසුනට නැගෙන විට, එතුමාට තෑගි කළ පරණ ඡායාරූපය සිහියට නැගුණ බැවිනි, "මහා අම්මා" සියලුම කාර්දිනල්වරු ද සිය කාමරවල සිට විස්මය පළ කළහ. අසීමිත මහා ක්‍රිස්තියානි අධිරාජ්‍යයේ ශතවර්ෂ විස්සක පමණ කාලයක දී සිදු වූ තෙවන මහා සිදුවීම ඔවුන් තුළ මහත් සංකූලතාවක්, අසහනයක් හා කලබලයක් ඇති කළේ අති උත්තම පාප්තුමා සිය දිගු, කළු මහා

මෝටර් රථයේ නංවනු ලැබ ඉතා දිගු දුරක වූ "මහා අම්මා"ගේ විශ්මය ජනක අවමඟුලට සහභාගි වන අටියෙන් පිටත් වී යනතුරුය.

එතුමාට, බැබළෙන පීච් උයන් පසු කරමින්, සිදු වූ මෙම ව්‍යසනය මෙතෙක් කිසිවක් නොදැන සිටි උණුසුම් ජීවයෙන් පිරි සිනමා නිළියන් මග දෙපස එළිමහනේ සිය සිරුරු පැහැ ගන්වමින් තණ තිල්ලේ වැතිරී සිටින අප්පියා ඇන්ටිකා මග ඔස්සේ

**ඉතාමත් ශුද්‍ර කරුණු ගැනත් දිගටම විවාද කරන මන්ත්‍රී මණ්ඩලයේ ඓතිහාසික කචකචය හදිසියේම නැවතුණේ මහා අම්මාගේ දේහය අංක 104 දරන තැන සෙවණේ තබාගෙන ඔවුන්ගේ තීරණය දන්වනතුරු බලා සිටින බව මතක් කිරීමෙනි. පරම පවිත්‍ර ලිඛිත නීතිය පළාගෙන මතුවුණ මේ කවුරුත් දන්නා කාරණය ගැන කිසිවකු කිසිදු විරෝධයක් පළකළේ නැත. කළයුතු නොයෙකුත් දේ සඳහන් කොට, නොයෙකුත් මතිමතාන්තර සමනය කිරීමෙන් හා ජනාධිපතිතුමාට භූමදානයට සහභාගිවීමට අවසර ලැබෙන පරිද්දෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් අනතුරුව, දේහය එම්බාම් කිරීමට නියම කරන ලදී.**

ටයිබර් නදිය කෙළවර පිහිටි නිසල සැන්ට් ආන්ජලෝ තුඩුව පසුකර යන්නට සිදුවිය. අලුයම එළඹෙත්ම ශාන්ත පීතර බැසිලිකාවේ සණ්ටාරයේ නින්නාදය මැකොන්ඩෝවේ සිහින් සීනු හඬ හා මුසු වනු අසන්නට ලැබිණි. එකිනෙකට පටලැවී තිබූ පන් වැවුණ බිමටත් නිහඬ වගුරු බිමටත් ඔබ්බෙන් වූ කූඩාරමේ සිරව සිටි පාප්තුමාට, මුළු රැය පුරාම එතැන පසු කර යන ජනකායගේ ශබ්දය නිසා කැළඹුණ වඳුරන්ගේ සෝෂාව ඇසිණි. මෙම බිම් කඩ රෝමානු අධිරාජ්‍යයත් මහා අම්මාගේ මහා සත්ව ගොවිපළත් බෙදා වෙන්වූ මාඉම විය. එතුමාගේ කටයුතුවලින් බැහැර වී මහා අම්මාගේ අවමංගල්‍ය උළෙලේදී තමන්ගේ වාසනාව උරගා බලන්නට තැත් කරන අන්දම දුටුවේය. ගෝනිගණින් යුකා පැළැටිද කෙසෙල් කැන්ද කුකුළන් රැඳවූ පෙට්ටිද වෙනත් දේ ද අලෙවි කිරීමට ගෙනයාම සඳහා ඔවුහු ඔරුවේ පැටවූහ. ක්‍රිස්තියානි පල්ලිය ආරම්භ වූ තැන් පටන් මේ දක්වාම ශුද්ධෝත්තමයාණන් කෙනෙකුට විඳින්නට සිදු වූ මහත්ම හිරිහැරය සිදුවූයේ එදින රාත්‍රියේය. මුළු රැයම නිදි නොලබා සිටින්නටත් මදුරුවන්ගෙන් පීඩා විඳින්නටත් එතුමාට සිදුවිය. එසේ වුවද ඔහු අත්දුටු සුන්දර අලුයම් කාලයේදී, ශ්‍රේෂ්ඨ මහලු කාන්තාවගේ රජදහන තුළ වූ සිත් අලවන සුවඳ ආලේපනයක මිහිර පතුරන පැරණි ඇපල්ගස්වල දර්ශනයෙනුත්, තලගොයින්ගේ දැක්මෙනුත්, රාත්‍රිය පුරා විඳි ගැහැට අමතක වී ගියා සේ ය. එය ඔහුගේ ගමනේ වෙහෙසටත් කැප කිරීමටත් පෙරළා ලැබූ ත්‍යාගයක් බඳු විය.

ශුද්ධෝත්තමයන් වහන්සේගේ ගෞරවනීය සම්ප්‍රාප්තිය දැන්වීමට දොරට තෙවරක් තට්ටු කිරීම නිසා නිකනෝර් නින්දෙන් අවදි විය. මරණය මුළු ගෙයම අත්පත් කරගෙන ඇත. නැවත නැවත පවත්වන ලද ජනාධිපති දේශනවලින් අනුබල ලැබ නොයෙකුත් මාධ්‍යවලින් මුළු ලොවම පුරා මෙම සිදුවීම පැතිර ගිය හේතුවෙන් නොයෙකුත් ජනයාත්, සංවිධානත් පැමිණීම නිසා නිවසේ හැම ශාලාවක්ම පිරී ගොස්ය. ශාලාවලට පිවිසෙන මං ද පිරී ඉතිරී ඇත. සඳලුතල ද සිරවී තිබේ. පසුව ආ පිරිස ඉඩ කඩ නොමැති නිසා දේවස්ථානය වටා ඉදිකර තිබූ පහත් තාප්ප,

ගරාදි වැටවල්, පවුරු හා හොඳින් බලාගත හැකි හැම තැනකම නැගී සුවසේ වාඩිවී සිටියහ.

මහා අම්මාගේ දේහය ප්‍රධාන ශාලාවේ එම්බාම් කරමින් තිබුණේය. ඉන් පසු ගත යුතු පියවරයන් ගැන එවන ලද විදුලිපුවත් ගොඩද ඒ අසල විය. ඇඬීම නිසාම දුර්වල වූ ඥාති දරුවන් නව දෙනා අසල වාඩිවී සිටියේ සිදුවන දේ ගැන විමසිල්ලෙන් හා යම් ආස්වාදයක් විඳිමින්ය.

තවද විශ්වයට තවත් බොහෝ කාලයක් බලා සිටින්නට සිදු වී ඇත. නගර සභා ශාලාවේ සමින් නිමවූ කනප්පු හතරක් හා වතුර ජෝගුවක්ද එරමිණියා පැටළුන එල්ලෙන ඇල් ඇඳක් ද විය. දහදිය දමමින්, නින්ද නොයාමේ ව්‍යාධියෙන් පෙළුණ පාප්තුමා දිගු රාත්‍රීන් ගෙවා දැම්මේ අනුස්මරණ ප්‍රකාශ, පරිපාලනමය නියෝග ආදිය කියවීමෙනි. දහවල් කාලයේ ඔහු බැහැ දැකීමට පැමිණි ළමුන්ට ජනේලය තුළින් ඔහු ඉතාලි රසකැවිලි බෙදා දුන්නේය. මෑ පඳුරු අසල සිට ඔහු ආහාරගත්තේ ඇන්තනී ඉසබෙල් පියතුමා සමඟය. සමහරවිට නිකනෝර් ද ඔවුන්ට එකතු විය. මෙසේ නිමක් නැති සති මාස ගෙවී ගියේය. උෂ්ණත්වයත් නිමක් නැතිව බලා හිඳුමක් නිසා එය වඩාත් දික් ගැහුණේය. මේ අතර එක් දිනක පස්රානා පියතුමා සිය අණබෙරකරු සමග පැමිණියේය. සාප්පු සංකීර්ණයේ මැදට පැමිණි ඔහු තීරණය පිළිබඳ අනාඥාව කියෙව්වේය.

ජන ජීවිතය අවුල් වී ඇත. ඩඟු ඩුගු ඩුගු ජනරජයේ ජනාධිපතිතුමාට ඩඟු ඩුගු ඩුගු අයත් බලතල අනුව සුවිශේෂ වරප්‍රසාද අනුව ඩුගු ඩුගු ඩුගු මහා අම්මාගේ අවමංගල්‍යයට සහභාගිවීමට අවසරය ඇත. ඩුගු ඩුගු ඩුගු ඩුගු ඒ ශ්‍රේෂ්ඨ දිනය උදා වී ඇත. බඳින ලද කෑම විකුණන වෙළෙන්දන්ගෙන්, ලොතරැයි කඩවලින්, බෙල්ලේ ඔතාගත් සර්පයින් සමග ස්ථිරවශයෙන්ම සෑමරෝග නිවාරණය කෙරෙන හා සදාකාලික ජීවනය ලබාදෙන තෙල් බෙත් විකුණන්නන් ආදීන්ගෙන් සහ කරත්තවලින් සියලු වීදි පිරී පැවතිණි. සාප්පු පරිශ්‍රයේ ඉරි ඇඳ වෙන් කරන ලද සුළු ඉඩ ප්‍රමාණයේ ජනයා සිය කූඩාරම් ඉදිකරගෙන, නිදන පැදුරු ආදිය එළාගෙන එක්ව සිටියහ. අධිකාරිත්වය ඇති අයට යාමට අවශ්‍ය වූ විට විශේෂ ඇඳුමෙන් සැරසුණ දුනුවායෝ ඔවුන් ඇත් මෑත් කර යන්නට ඉඩ පාදා දුන්හ. එහි සිට ඔවුහු ඉතා උත්කෘෂ්ටම මොහොත බලාපොරොත්තුව සිටියහ. එසේ රැස්ව සිටියෝ සැන් ජෝර්ජ් හි රෙදි අපුල්ලන්නියෝ, කබෝඩිලා, වෙලාහි මුතු කිමිදෙන්නෝ, එයින්ගාහි මසුන් මරන්නෝ, මොජජානාහි මන්ත්‍රකාරයෝ, මනයුවර්හි ලුනු රැස්කරන්නෝ, වල්ලෙඩුපර්හි එකෝඩියන් වාදනය කරන්නෝ, අයපර්හි මහා අසරුවෝ, සැන් පෙලයෝහි රැග් සංගීතකරුවෝ, ලේ කුයේවාහි පොර කුකුළන් ඇති කරන්නෝ, සබනාස් ඩි බෝලිවර්හි එසැණින් රංගයන් කරන්නෝ, රෙබෙලෝහි ජේත්තුකාරයෝ, මග්දලේනාහි පාරු පදවන්නෝ, මොනොපොක්ස්හි වංචනික තක්කඩි, ආදි මීට පෙර ඉහත දී සඳහන් කරන ලද අය ඇතුළු පිරිසක් වූහ. කොලෙල් අර්ලියානෝ බුවෙන්ඩියාගේ පාර්ශ්වයේ යුද ප්‍රවීණ නිලධාරීනුත් මාල්බොරෝ ආදිපාද තුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණ සිටියහ. ආදිපාදතුමා ලෝම ඇඳුමෙන් සහ දුර්ලභ කොටි නියෙන් හා කොටි දත්වලින් සකස්කරන ලද පලඳනාවන්ගෙන් සමන්විතව සිටියේය.

ඔවුහු පැමිණ සිටියෝ ශතවර්ෂාධික කාලයක් ඔවුන් වෛර කළ මහා අම්මා සහ ඇගේ පෙළපතේ අයගෙන්, හැට වසරක් ගතවීත් තමන්ගේ යුද ප්‍රවීණයන්ට ලැබිය යුතු විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා ජනරජයේ ජනාධිපතිගෙන් ඉල්ලීමක් කිරීමටය.

අලංකාර ඇඳුමෙන් හා සියුම් කැටයම් සහිත පදක්කම් පැළඳ සන්සුන් පියොවින්

යුතු වූ සුවිශේෂ හට පිරිසක් රැස්ව සිටි අය ඉදිරියෙන් සිට ඔවුන් පාලනය කරමින් සිටියහ. එහෙත් එකොළහට මඳකට පෙර හිරු රැසින් පීඩාවට හා සිත් සන්තෝෂයෙන් සිටි පිරිස බලවත් ජයග්‍රාහී හඬක් නැඟුහ. ඉතාමත් වැදගත් ලෙසත් ගම්භීර විලාසයෙනුත්, කෙටිකබා හා හිස්වැසුම් පැලඳ පැමිණි, ජනරජයේ ජනාධිපති හා අමාත්‍යවරු, පාර්ලිමේන්තු නියෝජිත පිරිස, ශ්‍රේෂ්ඨාධිකරණය, රාජ්‍ය මන්ත්‍රණ සභාව, සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ, පූජක උතුමන්ලා, බැංකු, වාණිජ ආයතන, කර්මාන්ත නියෝජනය කරමින් පැමිණි අය යන සියල්ලෝම ටෙලිග්‍රාප් කාර්යාලය අසලට රැස්වෙමින් සිටියහ. අනතුරුව තට්ට හිසින් යුත්, ස්ථූල, මහලු, රෝගාතුර ජනරජයේ ජනාධිපති තුමා පිරිස ඉදිරියෙන් ගම්භීර ලෙස ඇවිද යන විට ඔවුන්ගේ ඇස් විස්ම පත්විය. මීට පෙර ඔවුන් ඔහු දැක තිබුණත් ඔහු කව්ද යයි නිශ්චිතව දැන සිටියේ නැත. ඔහු ගැන හා පැවැත්ම ගැන සත්‍ය විස්තරයක් ඉදිරිපත් කළ යුත්තේ ඔහු විසින්මයයි පිරිස කල්පනා කළහ.

පූජකවරයේ බර දමා සිටීම නිසාම ඔබලත් වූ අගරදගුරුන් හා පුළුල් උරතල මත පදක්කම් පැළඳි හමුදා නිලධාරීන් අතර සිටි ජාතියේ නායකයා තමන්ගේ බලපරාක්‍රමයේ ශක්තිය ප්‍රදර්ශනය කරමින් සිටියේය. දෙවනුවට ගමන් කළෝ, ශාන්තව, ශෝකාත්මක ලීලාවෙන් යුත්, සිදුවෙමින් පවතින්නාවූත්, ඉදිරියේදී සිදුවන්නාවූත් සියලු දේටම අධිපතිවූ ජාතික බිසෝවරුය. ප්‍රථම වතාවට පොළොවේ අසිරිය ඉවත් කරමින්, විශ්ව රැජිනගේ ප්‍රධානත්වයෙන් ඔවුහු පෙරහැරේ ගමන් කළහ. ඒ අතර සෝයා බෝංචි රැජින, අළු පුහුල් රැජින, කෙසෙල් රැ ජින, යුකා රැජින, පේර රැජින, පොල් රැජින, මෑකරල් රැජින, සැතැපුම් 255 දිග තලගොයි බිත්තර මාලා රැජින, ආදී අමතරව වෙනත් රැජිනියන්ගේ විස්තර සඳහන් නොකරන්නේ මෙම විස්තරය නිමාවක් නැති දීර්ඝ එකක් වීම වැළැක්වීම සඳහාය. දම්පාට ඇඳුමෙන් සරසා, යථා ස්වභාවය ඉක්මවන ලෙස පිත්තල ගාංචු අටකින් අලංකෘත මහා අම්මාගේ දේහය ද ඇගේ ගම්භීර ශ්‍රී විභූතිය ගැන සිතිවිල්ලෙහි ගැලී සිටියා වැනිය. උෂ්ණත්වය නිසා නිදි වරන්නට වූ විට, සඳලුතලයට විත් ඈ සිහින දුටු ඇගේ නිවසේ අසිරිය දැන් සැබවින්ම මෙම පැය හතළිස් අට තුළ ඇති වී ඇත්තාසේය. මේ කාලය තුළදී හැම සංකේතාත්මක ගෞරවයක්ම ඇගේ නමට පුදා

ජන ජීවිතය අවුල් වී ඈත. ඬඟු ඬුඟු ඬුඟු ජනරජයේ ජනාධිපතිතුමාට ඬඟු ඬුඟු ඬුඟු අයත් බලතල අනුව සුවිශේෂ වරප්‍රසාද අනුව ඬුඟු ඬුඟු ඬුඟු මහා අම්මාගේ අවමංගල්‍යයට සහභාගිවීමට අවසරය ඇත. ඬුඟු ඬුඟු ඬුඟු ඬුඟු ඒ ශ්‍රේෂ්ඨ දිනය උදා වී ඇත. බදින ලද කෑම විකුණන වෙළෙන්දන්ගෙන්, ලොතරැයි කඩවලින්, බෙල්ලේ ඔතාගත් සර්පයින් සමග ස්ථිරවශයෙන් ම සෑමරෝග නිවාරණය කෙරෙන හා සදාකාලික ජීවනය ලබාදෙන තෙල් බේත් විකුණන්නන් ආදීන්ගෙන් සහ කරත්තවලින් සියලු වීදි පිරී පැවතිණි. සාප්පු පරිශ්‍රයේ ඉරි ඇඳ වෙන් කරන ලද සුළු ඉඩ ප්‍රමාණයේ ජනයා සිය කූඩාරම් ඉදිකරගෙන, නිදන පැදුරු ආදිය එළාගෙන එක්ව සිටියහ. අධිකාරිත්වය ඇති අයට යාමට අවශ්‍ය වූ විට විශේෂ ඇඳුමෙන් සැරසුණ දුනුවායෝ ඔවුන් ඈත් මෑත් කර යන්නට ඉඩ පාදා දුන්හ.

ඇත. ඇගේ සිතිවිලිවලදී වතිකානු මාලිගයට ඉහළින් ගුවනේ අලංකාර රථයක නැගී සරමින් සිටිතියි ඈ සිතු ශුද්ධෝත්තම පාප්වහන්සේත් මෙම මුළු ලෝකයේ ශ්‍රේෂ්ඨතම අවමංගල්‍යයට වැඩම කර උෂ්ණත්වය මැඩ ගන්නට තල් විජිනිපතකින් පවන් සලමින් සිටියි.

බල ප්‍රදර්ශනය දැකීම නිසා නිලංකාරව ඇසින් යුත් පොදු මහජනයාට නිවසේ ඉහළ මාලයේ සිදු වූ කලබලය ගැන වැටහීමක් ලැබුණේ නැත. එහිදී සිදුවූයේ අවමංගල දෙණ ඔසවා ගෙන යා යුත්තේ කුමන උසස් පංතියේ අයවලුන්ද යන්න ගැනය. අවසානයේ නිගමනය වූයේ ඔවුන් අතරින් උසස්තම පුද්ගලයන්ගේ කර මතින් දෙණ වීදියට රැගෙන ආ යුතු බවයි. දේහය උණුසුම් වූ වීදි දිගේ රැගෙන යන විට ඒ දෙස මහත් ගිජු ලෙස සීරුවෙන් හඹායන ගිජු ලිහිණියන්ගේ සෙවණැල්ල කිසිවකු දුටුවේ නැත. උත්තම ජනයා මැකොන්ඩෝ නගරය පසු කරගෙන යනවිට වසංගත ඇති කරන මහා කුණුකන්දලක් ද ඇති කළබවද ඔවුන්ට නොපෙනිණ. දේහය පිටතට ගනිත්ම, ඥාති දරුවන්, දේව දරුවන්, සේවකයන් සහ මහා අම්මාගේ සරණාගතයන් නිවසේ දොරවල් වසනු කිසිවකු දුටුවේ නැත. ඉන් අනතුරුව දොර සරනේරු ගලවා ඇණ ඉවත්කොට ලෑලි ගොඩ ගසා බිම ද හාරමින් නිවස බෙදාගන්නට යාමද කිසිවෙක් නුදුටුහ. එහෙත්, හැම දෙනම දුටු දෙයක් නම් තිබිණි. එය කාගේවත් දැක්මෙන් වැළකී තිබූ දෙයක් නොවීය. දින දහහතරක නොයෙකුත් අයැදීම්, නියෝගයන් බොරු උදාරම්කම් පෑම් හා සාංකාවන්ගෙන් හා ඝෝෂාවෙන් පිරුණ අවමංගල්‍යය අවසන්වීම නිසා මහජනයා විශාල සුසුමක් පිටකර හිත් සන්සුන් කරගත්තේ සොහොන බැඳ, මුදුනේ ඊයම් සොහොන් කොතකින්ද අවාරණය කොට මුද්‍රාතැබීම නිසාය. එදින පැමිණියවුන් මෙය නව යුගයක උපතක් ලෙස වටහා ගැනීමට තරම් තේරුම් පැහැදුම් ඇත්තෝ වූහ. මහජනයා උදෙසා පාප්වහන්සේගේ මෙහෙය අවසාන නිසා පාප්වහන්සේටද සාකල්‍යයෙන්ම ස්වර්ග රාජ්‍යයට වැඩම කළ හැකිය. ජන රජයේ ජනාධිපතිතුමාටද නිවී සැනසිල්ලේ වාඩිවී ඔහුගේ යහපත් සිතුම් පැතුම් අනුව රට පාලනය කළ හැකිය. පවතින හා ඉදිරියට ඇතිවන කර්තව්‍යයන්ට අධිපති රැජිනියන්ටද තමන් සිත්වූ පරිද්දෙන් විවාහ පත්වී සතුටින් දිවි ගෙවන අතර, බොහෝ දරුවන් බිහි කරන්නටද පුළුවන. සාමාන්‍ය මහජනයාටද සිත්සේ මහා අම්මාගේ ඉඩම් රාජ්‍යයේ ඔවුන් කැමති තැනකින් මඩු කුඩාරම් අටවා ගත හැකිවන්නේ, කලින් ඔවුන් වළකාලූ හා ඔවුන් කෙරෙහි බලය පෑවා වූ මහා අම්මා සොහොන් කොත යට දිරා යන්නට පටන් ගෙන තිබීම නිසාය. දැන් මේ කථාව කියන්නටත් ඉදිරි පරම්පරාවලට පාඩමක් ලෙස දක්වන්නටත් කැමති කෙනෙකුට ඉතිරිව ඇත්තේ තමන්ගේ ඉදිරි දොරට බංකුවක් හරස් කර තබාගෙන එසේ කිරීමටය. එම නිසා කිසිවක් විශ්වාස නොකරන කවුරුත් පාහේ මහා අම්මාගේ කථාව දැන ගන්නවා ඇත්තේ හෙට බදාදා නගරයේ කැළි කසළ පවිත්‍ර කරන්නන් පැමිණ ඇගේ අවමඟුලෙන් ඉතිරි වූ කුණු කසළ අතුගා සදහටම ඉවත් කිරීම නිසාය.

පරිවර්තනය

**ජයසුමන දිසානායක**




# කීර්තියේ හුදකලාවත් බලයේ හුදකලාව වගෙයි

දැ පැරිස් රිවියු (The Paris Review) සඟරාව සඳහා පීටර් එච්. ස්ටෝන් විසින් ගබ්රියෙල් ගර්සියා මර්කෙස් සමඟ 1981 දී කරන ලද සම්මුඛ සාකච්ඡාවකි.

**මේ සාකච්ඡාවේදී මම ටේප් රෙකෝඩරය පාවිච්චි කිරීම ඔබට හැඟෙන්නේ කොහොමද?**

මෙතැන තියෙන ගැටලුව තමයි, මේ මොහොතේ අපේ සම්මුඛ සාකච්ඡාව පටිගත වෙන බව ඔබ දන්නවා. එතකොට ඔබේ ආකල්ප වෙනස් වෙනවා. මා සම්බන්ධයෙන් ගත්තොත් මං වහාම ආරක්ෂාකාරී ආකල්පයක් ඇති කරගන්නවා. මාධ්‍යවේදියෙක් හැටියට මට හැඟෙන්නේ සම්මුඛ සාකච්ඡාවකදී ටේප් රෙකෝඩරය භාවිත කරන හැටි අපි තවම ඉගෙනගෙන නෑ කියලා. මට හැඟෙන විදියට හොඳම ක්‍රමය තමයි, මාධ්‍යවේදියා කිසි සටහනක් තියාගන්නේ නැතිව දීර්ඝ සංවාදයක යෙදීම, ඉන් පසුව ඔහුට පුළුවන් ඒ සාකච්ඡාව නැවත මෙනෙහි කරමින් එය ලියන්න. ඒ ලිවීමේදී කලින් කතා කළ දේවල් ඒ වචනවලින්ම සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නෑ. තවත් ප්‍රයෝජනවත් ක්‍රමයක් තමයි සම්මුඛ සාකච්ඡාව අතරතුර සටහනක් තබාගෙන ඉන් පසු ඒවා නැවත ලිවීම. මේ ලිවීමේදී සකච්ඡාවට එක්කරගත් පුද්ගලයාට අවංකවීමත් අවශ්‍යයි. ටේප් රෙකෝඩරය භාවිත කිරීමෙන් ඔබ සාකච්ඡාවට සහභාගි කරගන්නා පුද්ගලයාට අවංක වන බවක් අදහස් වෙන්නේ නෑ. මක්නිසාද කිව්වොත්, ඔබ එය

කරන්නේ ඔබ සඳහා නිසයි. මේ නිසා තමයි මමත් සමඟ සම්මුඛ සාකච්ඡාවක යෙදීමේදී ටේප් රෙකෝඩරයක් භාවිතා කිරීම ගැන මම ටිකක් සැලකිලිමත් වෙන්නෙ. හැබැයි, ටේප් රෙකෝඩරයක් නැත්නම් මං කතා කරන්නේ අවිඥානිකව සහ මුළුමනින්ම ස්වාභාවික ලෙසයි.

**හොඳයි, එය භාවිත කරන එක ගැන ඔබ කතාකළේ එය යම් වරදක් වැනි හැඟීමකින් බවයි මට දැනෙන්නේ. ඒත්, මං හිතන හැටියට මේ වගේ සම්මුඛ සාකච්ඡාවකදී අපට එය අවශ්‍යම වෙනවා...**

කොහොම වුණත්, විය යුතු දේ තමයි මං කියන දේ ඔබ ප්‍රවේසමෙන් ග්‍රහණය කර ගැනීම.

**එතකොට ඔබ සම්මුඛ සාකච්ඡා සිදුකරද්දි ටේප් රෙකෝඩරය පාවිච්චි කළේ නැතිද?**

මාධ්‍යකරුවෙක් හැටියට මං එය පාවිච්චි කළේ නෑ. මට ඉතාමත් හොඳ ටේප් රෙකෝඩරයක් තිබුණා. ඒ මං ඒක පාවිච්චි කළේ සංගීතය රස විඳින්න විතරයි. ඊළඟට මාධ්‍යකරුවෙක් හැටියට මම සම්මුඛ සාකච්ඡා කරල නෑ. මං කළේ වාර්තාකරණය. ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් සම්මුඛ සාකච්ඡා මං කරලා නෑ.

**මං අහල තියෙනවා එක ප්‍රසිද්ධ සම්මුඛ සාකච්ඡාවක් ගැන. එය යාත්‍රාව අනතුරකට ලක්වූ නාවිකයෙක් සමඟ සිදුකළ එකක්...?**

ඒක ප්‍රශ්න - පිළිතුරු මාදිලියේ එකක් නෙවෙයි නාවිකයා ඔහුගේ වීර ක්‍රියා ගැන මාත් සමඟ කියද්දි ඒවා අහගෙන ඉඳල මං නැවත ලිව්වා. එතැනදී පාවිච්චි කළේ ඔහුගේම වචන. ඒ කියන්නේ ඒක ලියල තියෙන්නෙ ඔහු එය ලියූ හැටියටයි. මේක කොටස් කීපයකින් පුවත්පතක පළවුණා. සති දෙකක් තිස්සේ එක කොටස බැගින්... ඒක පළවුණේ ඔහුගේ අත්සන යටතේ මිස මගේ දෙයක් වශයෙන් නෙවෙයි. වසර විසිගණනකට පසුව ඒක ආයෙමත් පළවුණාම තමයි මිනිස්සු දැනගත්තෙ එය මං ලියපු දෙයක් කියල. මං සිය වසක් හුදෙකලාව (One Hundred Years of Solitude) ලියනකල්ම ඒ පුවත්පතේ සංස්කාරකවත් අර ලිපි හොඳයි කියල තේරුම්ගත්තෙ නෑ.

**අපි කතා කරන්න පටන් ගත්තේ ජනමාධ්‍යවේදයෙන්. මාධ්‍යකරුවෙක් වීම ගැන ඔබට කොහොමද හැඟෙන්නේ, දීර්ඝ කාලයක් නවකතාකරුවෙක් ලෙස පෙනී සිටියාට පස්සෙ? මේ දෙක දෙවිදිහකටද ඔබට දැනෙන්නෙ? ඔබ වෙනස් ඇසකින්ද ඒ දිහා බලන්නේ?**

මං හැමවිටම හිතන්නෙ සහ මට දැනෙන්නෙ මගේ සැබෑ වෘත්තිය ජනමාධ්‍යවේදය කියලයි. මාධ්‍යකරුවෙක් හැටියට මං කැමැති නැත්තෙ වැඩ කිරීමේදී තිබුණු කොන්දේසිවලට. මට තිබුණේ පුවත්පතේ අභිලාෂයට අනුව ගොඩනඟාගත් මගේම අදහස් හා චින්තනයක් මත පදනම් වූ කොන්දේසි. දැන් නවකතා කරුවෙක් හැටියට වැඩ කළාට පස්සේ සහ නවකතාකරුවෙක් හැටියට යම් මූල්‍යමය නිදහසක් ගොඩ නගාගත්තට පස්සෙ මගේ අදහස්වලට, කැමැත්තට ගැළපෙන තේමා තෝරාගැනීමට ඇත්තටම මට පුළුවන්. මොන තත්ත්වයක් යටතේ වුණත්, මාධ්‍යකරුවෙක් හැටියට යම් විශිෂ්ට දේවල් කරන්න ලැබීම ගැන මට තියෙන්නෙ සතුටක්.

**ඔබට අනුව මාධ්‍යකරණය සම්බන්ධයෙන් දැක්විය හැකි එක් විශිෂ්ට උදාහරණයක් ඔබට තිබෙනවාද?**

ජොන් හර්සිගේ හිරෝෂිමා. ඒක විශිෂ්ට වැඩක්.

**වර්තමානයේදී ඔබ වඩාත් කැමැතිවන කතාවක් තිබෙනවාද?**

හුඟක් තියෙනවා. සමහර ඒවා මමත් ලියා තියෙනවා. මං පෘතුගාලය, කියුබාව, ඇංගෝලාව සහ වියට්නාමය ගැන ලියා තියෙනවා. පෝලන්තය ගැන ලියන්න මං හුඟක් කැමැතියි. මං හිතන්නෙ දැන් සිදුවෙමින් තියෙන්නෙ මොනවාද කියල මට හරියටම විස්තර කරන්න පුළුවන් වුණොත්, ඒක හරිම වැදගත් කතාවක් වෙයි. ඒත් දැන් පෝලන්තයෙ ඕනෑවටත් වඩා සීතලයි. මං තමන්ගේ පහසුව ගැන කැමැති මාධ්‍යකරුවෙක්.

**ජනමාධ්‍යවේදයට කළ නොහැකි සමහර දේවල් නවකතාවට කළ හැකියි කියල ඔබ සිතනවාද?**

නෑ. එතැන කිසිම වෙනසක් ඇතැයි කියා මං සිතන්නේ නෑ. මූලාශ්‍ර සමානයි. අමුද්‍රව්‍යත් සමානයි. සම්පත් සහ භාෂාවත් සමානයි. ඩැනියෙල් ඩේෆොගේ The Journal of the Plague විශිෂ්ට නවකතාවක් වගේම Hiroshima විශිෂ්ට මාධ්‍ය වැඩක්.

**කාල්පනික දේ සහ යථාර්ථය අතර තුලනයක් ඇති කිරීමේදී මාධ්‍යකරුවා සහ නවකතා කරුවා හමුවේ ඇති වගකීම්වල වෙනසක් තියෙනවාද?**

ජනමාධ්‍යයේදී එක් තනි කාරණයට සමස්ත කාර්යය ගැනම වැරදි පූර්වවිනිශ්චයක් ලබාදෙන්න පුළුවන්. විස්තරාත්මකව කිව්වොත්, ප්‍රවෘත්තියකදී එක් තනි කාරණයකට, එය ඇත්තක් නම්.. සමස්ත කාර්යය ගැනම වලංගුභාවයක් ලබාදීමට පුළුවන්. ඒ තමයි එකම වෙනස. ලේඛකයාගේ දායකත්වය ගැන එහිදී කියැවෙන්නෙ බොරුවක්. නවකතාකරුවෙකුට ඔහුට අවශ්‍ය ඕනෑම දෙයක් කරන්න පුළුවනි, ඒත් මිනිස්සු විශ්වාසකරනතාක් දුරට...

**මීට අවුරුදු කිහිපයකට කලින් කළ සම්මුඛ සාකච්ඡාවලදී මාධ්‍යකරුවෙක් වීම ගැන ඔබ ආපසු හැරී බැලුවේ යම් අලසබවකින් යුතුවයි. ඒ කාලයේ ඔබ අදට වඩා මොනතරම් වේගවත්ද?**

නවකතා ගත්තත් ජනමාධ්‍යකරණය ගත්තත් පෙරට වඩා මට දැන් ලිවීම දුෂ්කරයි. මං පුවත්පත්වල වැඩ කරද්දී දැන් මං කරනවා වගේ මං ලියන සෑම වචනයක් ගැනම සැළකිලිමත් වුණේ නෑ. මං බොගොටාවේ El Espectador පත්තරේ වැඩ කරන කාලෙ සතියකට කතා 3 ක් වත් ලිව්වා. හැමදාම සංස්කාරක සටහන් 2 ක් හරි 3 හරි ලිව්වා. තව චිත්‍රපට විචාරයක් කළා. ඊළඟට රෑ, හැමෝම ගෙවල්වලට ගියාට පස්සේ මං මගේ නවකතා ලිව්වා. ලිනොටයිප් මැෂින්වල හඬට මං ප්‍රියකළා. හරියට ඒක වැස්සක් වහිනවා වගෙයි. ඒ හඬ නතර වුණොත් මමත් නිශ්ශබ්ද වුණා. මට වැඩ කරන්න පුළුවන් කමක් නෑ වගේ දැනුණා. දැන් සන්සන්දනාත්මකව බැලුවොත් ලැබෙන දේ අල්පයි. හොඳට වැඩ කරන දවසක උදේ 9 ඉඳන් දවල් 2, 3 වෙනකල් වැඩ කරනවා. හුඟක් වෙලාවට ලියන්නෙ කෙටි පරිච්ඡේද පේළි 4, 5 ඒවා. සමානයයෙන් ඊළඟ දවසේ මං වැඩ නෑ.

**ඔබේ නිර්මාණ තුළින් මතුවෙන මේ වෙනස ඉහළ ඇගැයීමක් නිසා වුණ දෙයක් ද නැත්නම් යම් දේශපාලනික කාරණයක් නිසා වුණු දෙයක් ද?**

මේ දෙකම නිසා වුණු දෙයක්. මං හිතන්නේ මේකට මං ගොඩක් දෙනා වෙනුවෙන් ලියනවා කියන සිතුවිල්ලත් බලපානවා. ඒ පිරිස මං කලින් හිතාගෙන හිටියාට වඩා විශාලයි. එය සාහිත්‍යමය හා දේශපාලනික වගකීමකුත් කරන්න හේතුවක් වුණා. මේක ආඩම්බරයටත් කාරණයක්. මං කලින් කළ දේවල් ගැන මට කලකිරෙන්න දෙයක් නෑ.

**ඔබ ලිවීම පටන් ගත්තෙ කොහොමද?**

ඇඳීමෙන්. කාටූන් ඇඳීමෙන්. මම ලියන්න කියවන්න පටන් ගන්නත් කලින් ඉඳලා පාසලේදීත්, ගෙදරදිත්. කළේ විහිළු චරිත අඳින එක. අද මට මතක් වෙනකොට හිනායන කාරණයක් තමයි, උසස් පාසලේදී

ලේඛකයෙක් හැටියට මට ලැබුණු පිළිගැනීම. ඒත් මං කිසිම දෙයක් ලියලා තිබුණේ නෑ. මොනවා හරි ලියන්න තිබුණා නම් ලියුමක් හරි පෙත්සමක් හරි වෙන්න පුළුවන්. මට තමයි ඒක ලියන්න වුණේ. මොකද මට ලේඛකයෙක් හැටියට පිළිගැනීමක් තිබුණා. මං පාසලට ඇතුළත් වෙනකොටත් සාමාන්‍යයෙන් මගේ යහළුවන්ගේ මට්ටම හා සසඳන කොට මට ඉතා හොඳ සාහිත්‍යමය පසුබිමක් තිබුණා. බොගෝටා සරසවියේදී මට අලුත් යහළුවෝ හමුවුණා. සමකාලීන ලේඛකයෝ මට හඳුන්වා දුන්නේ ඔවුන්. එක රාත්‍රියක යහළුවෙක් මට ෆ්‍රාන්ස් කෆ්කාගේ කෙටිකතා පොතක් දුන්නා. මං නවාතැනට ගියාට පස්සෙ The Metamorphosis පොත ආයෙම කියවන්න පටන් ගත්තා. පළමුවෙනි පේළිය කියවද්දිම මං ඇඳෙන් බිමට පැන්නා. මට පුදුමයි. පළමුවෙනි පේළියෙන් කියැවුණේ "ඒ උදෑසන ග්‍රෙගෝර් සම්සා අවදි වූයේ අසුබ සිහිනයක් දැකලා. ඔහු කෘමි සතෙක් වෙලා ඔහුගේ ඇඳට ඇලිලා ඉන්නවා දැකලා තිබුණා. මේ පේළිය කියවාගෙන යද්දි මට හිතුණේ මං නම් දන්නේ නෑ කාටද මේ වගේ පොත් ලියන්න පුළුවන් කියලා. මං ඒක දැනගෙන හිටියා නම් මං ලියන්න පටන්ගන්නවා ඇත්තෙ මීට හුඟාක් කලින්. ඉතින් මං ඉක්මනින්ම කෙටිකතා ලියන්න පටන් ගත්තා. ඒ මුළුමනින්ම බුද්ධිමය කෙටිකතා මොකද, මං ඒවා ලිව්වේ මගේ සාහිත්‍යමය අත්දැකීම් මත සහ සාහිත්‍ය හා ජීවිතය අතර ඇති සම්බන්ධය මොකක්ද කියන එක තවමත් සොයාගෙන නැති නිසා. මේ කෙටි කතා බොගෝටාවේ El Espectador පුවත්පතේ සාහිත්‍ය අතිරේකයේ පළවුණා. ඒවා ඒ වකවානුවේ හැටියට යම් සාර්ථක නිර්මාණ හැටියටත් පිළිගත්තා. මොකද ඒ වෙද්දි කොළොම්බියාවේ කිසිවෙකුත් බුද්ධිමය කෙටිකතා ලිව්වේ නෑ. ඒ කාලයේ ලියැවුණු බොහෝමයක් කතා ජන ජීවිතය හා සමාජ ජීවිතයට සම්බන්ධ ඒවා. මං මගේ පළමු කෙටිකතා එළිදැක්වූවාම ඔවුන් මට කිව්වේ මේ කතා ඔවුන්ට ජොයිසියානු බලපෑමක් ඇති කළ බවයි.

**ඒ කාලය වනවිට ඔබ ජොයිස් කියවා තිබුණාද?**

මං ජොයිස් කියවා නෑ. ඉතිං මං යුලිසිස් කියවන්න පටන් ගත්තා. මං කියෙව්වෙ එහි ස්පාඤ්ඤ සංස්කරණය පමණයි. එතැන් පටන් මං යුලිසිස් ඉංග්‍රීසි සංස්කරණය සහ ඉතා හොඳ ප්‍රංශ පරිවර්තනයක් කියෙව්වා. එවිට මට පෙනී ගියේ අර මුල් ස්පාඤ්ඤ පරිවර්තනය ඉතාමත් දුර්වල මට්ටමක තිබුණා කියන එකයි. ඒත් මං යමක් ඉගෙන ගත්තා. ඒ, එය මගේ අනාගත ලේඛන කටයුතු සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් වූ බවයි. විශේෂයෙන් එහි භාවිත වූ අභ්‍යන්තරික හා ඒකභාෂණමය ප්‍රකාශන ශෛලිය ගැන. පසුකාලීනව මා එය වර්ජිනියා වුල්ෆ්ගෙනුත් දැක්කා. ජොයිස්ටත් වඩා හොඳින් ඇය එය භාවිත කරන විදිහට මං කැමැතියි. කොහොම වුණත්, පසුකාලීනව මං තේරුම්ගත්තා මේ අභ්‍යන්තරික ඒකභාෂණමය ශෛලිය සොයාගත් පුද්ගලයා නිර්නාමික 'ලසාරිලෝ ද තොමස්' කියලා.

**ඔබට ආභාසයක් වූ අය කවුද කියල කියන්න පුළුවන්ද?**

කෙටිකතාව ගැන මා දැරූ බුද්ධිමය ආකල්පයෙන් මිදීමට මට උපකාරී වුණේ ඇමෙරිකාවේ අපට කලින් සිටි පරපුර. ඔවුන්ගේ සාහිත්‍යය හා ජීවිතය අතර මගේ කෙටිකතාවල නොතිබුණු සම්බන්ධයක් ඇති බව මං තේරුම් ගත්තා. මේ ආකල්පය වඩාත් ඒත්තු ගැන්වීමට එක්තරා වැදගත් සිදුවීමකුත් බලපානවා.

ඒක වුණේ බොගොටාසෝවලදී. දවස 1948 අප්‍රේල් මාසෙ 9 වැනිදා. ගයිටන් කියන දේශපාලන නායකයාට වෙඩි තබා තිබුණා. බොගොටාවේ මිනිස්සු පිස්සුවෙන් වගේ වීදිවල රස්වෙමින් හිටියා. මේ ප්‍රවෘත්තිය අහනකොට මං මගෙ නවාතැනේ දවල් කෑම ගන්න ලෑස්තිවුණා විතරයි. මේක වුණ තැනට




මං දුවගෙන ගියා. ඒත් එතකොටම ගයිටන් ව ටැක්සියක දමාගෙන රෝහලට ගෙනයමින් තිබුණෙ. විශ්‍රාම වැටුපත් අරන් ආපහු එන අතරතුර මිනිස්සු විරෝධතා දක්වන හැටි කඩසාප්පු කොල්ලකන හැටි, ගොඩනැගිලිවලට ගිනි තබන හැටි මං දැක්කා. මමත් ඔවුන්ට එකතු වුණා. ඒ දවාලෙ සහ එදා සවස මං ජීවත්වෙන්නෙ කොහොම රටකද කියන එකත්, මේ ඕනෑම දෙයක් සම්බන්ධයෙන් මගේ කෙටිකතාවලට කරන්න පුළුවන් දේ මොනතරම් පොඩ්ඩද කියන එකත් මට තේරුම් ගියා. ආපහු කැරිබියානු බැරැන්කුයිලාවලට යන්න මම මටම බල කළා. මගේ ළමා කාලය ගෙවුණේ එහෙදි. නැවතත් එහාට ආවට පස්සේ මගේ ළමාවිය ගෙවීගිය හැටි පිළිබඳ මතකය අලුත්වුණාම මං ඒ ගැන ලියන්න පටන් ගත්තා.

1950 දී හරි 1951 දි හරි මගේ සාහිත්‍යමය කටයුතුවලට බලපෑමක් කරන්න පුළුවන් තවත් සිද්ධියක් ඇතිවුණා. මගේ අම්මා මට කතා කළා ඇයත් සමඟ අරකටාකාවට යන්න. එහෙදි තමයි මං ඉපදිලා තියෙන්නේ. මගේ ළමා කාලයේ මුල් අවුරුදු කිහිපය ගෙවී ගිය ඒ නිවස විකුණන්න තීරණය කරල තිබුණා. එහෙම ගියාට පස්සෙ මුලින් එක්වරම මට ඇතිවුණේ කම්පනයක්. මොකද වයස අවුරුදු 8 න් පස්සේ මං එහේ ගිහින් තිබුණේ නෑ. දැන් මට අවුරුදු 22 ක්. ඇත්තටම කිසිම දෙයක් වෙනස් වෙලා තිබුණේ නෑ. ඒත් මට නම් දැනුණේ මං ගම දකිනවා නොවෙයි, එය කියවමින් හිටියා වගෙයි කියලයි. එය අත්විඳිමින් ඉන්නවාය කියලයි. මා දුටු හැම දෙයක්ම හරියට ලියලා තියෙනවා, මට තියෙන්නේ වාඩිවෙලා මා ඒ කියවමින් සිටි දේ පිටපත් කිරීමයි කියලායි. ගෙවල් දොරවල්, මතක සටහන් ආදී හැම දෙයක්ම සාහිත්‍යය විදියට විකාශනය වෙලා තිබුණා. මම ඒ වෙනකොටත් ෆෝක්නර්

කියවලා තිබුණද කියල මට හරියට විශ්වාස නෑ. ඒ දැන් මං දන්නවා, මං දැකපු දේවල් ලියන්න පුළුවන් ෆෝක්නර්ගේ වගේ ශෛලියකින් විතරයි කියලා. ඒ පරිසරය උණුසුම වගේ දේවල් පවා ෆෝක්නර්ගේ ගමට සමානයි.

ඒක කෙසෙල් වගාකරන ප්‍රදේශයක්. පලතුරු සමාගම්වලට අයත් අමෙරිකානුවන් විශාල ප්‍රමාණයක් එහෙ ජීවත් වුණා. ඒ පරිසරය හරියට මම ඇත දකුණේ ලේඛකයන්ගෙන් දුටු පරිසරයට සමානයි. ෆෝක්නර් ගෙන් ලැබුණු සාහිත්‍යමය ආභාසය ගැන විචාරකයන් කතා කරල තියෙනවා. නමුත් මං ඒක දකින්නෙ එහි දෙපැත්තක් තියෙනවා කියලා. කතාව සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මට ලැබුණු විදිහත් ෆෝක්නර් ඒවා සපයාගත් විදිහත් සමානයි.

ගමට ගිහින් ඇවිත් මං මගේ පළමුවෙනි නවකතාව Leaf Storm ලිව්වා. අරකටකාවලට ගිය මේ ගමනෙදි මට ඇත්තටම මගේ ළමාවිය හා සම්බන්ධ සෑම දෙයකටම සාහිත්‍යමය වටිනාකමක් ඇති බව තේරුම් ගැනීමට හැකිවුණා. මා එය අගැයීමට ලක්කරන්නේ දැනුයි. Leaf Storm ලියපු තැන ඉඳලා මට ලේඛකයෙක් වීමට අවශ්‍ය බවත් කිසිවකුටත් මාව අතරමග නතර කළ නොහැකි බවත්, මට කරන්න තියෙන එකම කාර්යය ලෝකයේ හොඳම ලේඛකයා වීමට මහන්සි දැරීම බවත් මං තේරුම් ගත්තා. ඒ, 1953 අවුරුද්ද. ඒත් 1967 වෙනකල්ම ඒ කියන්නේ මගේ පොත් 8 න් 5 ක් ලියන ඉවරවෙනකල්ම මං ඒවායේ අයිතිය ලබාගෙන තිබුණේ නෑ.

**තරුණ ලේඛකයන් ඔවුන්ගේ ළමාවිය හා එම අත්දැකීම නොතකා හැරීමත් ඔබ මුලින් කළා වගේ බුද්ධිමය නැඹුරුවක් ඇතිව ලේඛනයේ යෙදීමත් සාමාන්‍ය දෙයක් හැටියටද ඔබ සිතන්නේ.**

නෑ, සාමාන්‍යයෙන් මේක වෙන්නෙ වෙනත් විදියකට, ඒත්, මේ ගැන මං තරුණ ලේඛකයකුට යම් උපදෙසක් දුන්නොත් ඔහුට සිදුවුණු යමක් ගැන ලියන්න කියල, මං ඔහුට කියයි, හැම විටම ලේඛකයකුට තමන්ට සිදුවුණු දෙයක් හරි , ඔහු කියවා ඇති දෙයක් හෝ අසා ඇති දෙයක් ගැන හරි ලිවීම පහසුයි කියලා. පැබ්ලෝ නෙරූඩා ගේ කවියක මේ වගේ පේළියක් තිබෙනවා. “මා ගීත ගයන විට ඒවා හඳුන්වා දීමෙන් දෙවියන් මට උපකාරී වුණා...” හැම විටම වගේ මා හිනස්සන දෙයක් තමයි, මගේ වැඩවල විශාලම ප්‍රතිඵලය එන්නේ පරිකල්පනය තුළින් කියලා කීම. මගේ නිර්මාණ පිළිබඳ ඇත්ත තමයි යථාර්ථය නොවන එකම එක පේළියක්වත් ඒවයේ නොවීම. මෙතැන ගැටලුව තමයි කැරිබියානු යථාර්ථවාදය මඟින් මතු කරන්නේ නොහික්මුණු පරිකල්පනයක් වීම.

**මෙතැනදී, ඔබ ලිව්වේ කා සඳහා ද? කවුද ඔබේ ග්‍රාහකයන් වුණේ.?**

මං Leaf Storm ලිව්වේ මගේ මිතුරන් සඳහා. ඔවුන් තමයි මට පොත් පත් ආදිය ගෙනැත් දීල උදව් උපකාර කළේ. ඒ වගේම මගේ නිර්මාණවලට ඉතාමත් ප්‍රිය කළේ... මං සාමාන්‍යයෙන් හිතන්නේ ඔබ ලියන්නේ කා වෙනුවෙන් හරි කියලා. ලිවීමේදී මගේ මේ මිත්‍රයා මේ කොටසට කැමැති වෙයි. අර මිත්‍රයා මේ පරිච්ඡේදයට හරි කොටසට හරි කැමැතිවෙයි කියල මං සිතනවා. ඒ කියන්නේ යම් විශේෂිත පුද්ගල සමූහයක් ගැන සිතනවා. ඔය විදිහට අන්තිමේදී සියලු පොත් ලියල් තියෙන්නේ මිතුරන් වෙනුවෙන්. One Hundred years of Solitude ලියල ඉවර වුණාම මතුවුණු ගැටලුව තමයි එතෙක් මම ලියන්නේ මිලියන සංඛ්‍යාත පාඨක සමූහයකට කියන එක දැන නොසිටීම. ඒක ටිකක් මාව කැලැඹීමට පත් කළා. හරියට ලක්ෂ සංඛ්‍යාත ඇස් ඔබ දෙසට යොමු වෙලා තියෙද්දී ඔවුන් සිතන්නේ මොනවාද කියල ඔබ නොදැන සිටිනවා වගේ හැඟීමක්.

**ඔබේ ප්‍රබන්ධකරණය සඳහා ජනමාධ්‍යවේදයෙන් ලැබුණු ආභාසය කෙබඳුද?**

මං හිතන හැටියට ඒ ආභාසය අන්‍යෝන්‍යයි. ජනමාධකරුවෙක් හැටියට මට ප්‍රබන්ධකරණය උපකාරී වුණා, මොකද එමඟින් යම් සාහිත්‍යමය වටිනාකමක් ඊට ලැබුණු නිසා. ඒ වගේම ජනමාධ්‍යවේදය මගේ ප්‍රබන්ධකලාවටත් උපකාරී වුණා. කොහොමද කිව්වොත් එමඟින් යථාර්ථය හා සමීප සම්බන්ධතාවක් පවත්වා ගත්තා.

**ඔබ Leaf Storm ලිව්වට පස්සේ සහ One Hundred Years of Solitude ලිවීමට පෙර යම් ශෛලියක් සොයාගිය බවක් පෙනෙනවා. එය ඔබ පැහැදිලි කරන්නේ කොහොමද?**

Leaf Storm ලිව්වට පස්සේ මං තීරණය කළා ගම සහ මගේ ළමාවිය ගැන ලියමින් මං කරන්නේ රටේ තියෙන දේශපාලන යථාර්ථයෙන් පලායාම නේද කියලා. උපන් භූමියට යළි යෑමට ඇතිවන බලවත් අශාව නම් හැඟීමෙන් පෙළුණු මම මා තුළම සැඟවී සිටියේ සිදුවෙමින් තිබූ දේශපාලනික තේරුමක් ඇති දේවල් මඟ හැරලා කියලා මා තුළ වැරදි වැටහීමකුයි තිබුණේ. මේ කාලයේ තමයි, සාහිත්‍යය හා දේශපාලනය අතර ඇති සම්බන්ධය ගැඹුරින් සාකච්ඡා කළේ. මේ දෙක අතර තියෙන පරතරය පියවීමේ උත්සාහයක මං යෙදී සිටියා. ෆෝක්නර්ගෙන් කලින් මට ආභාසය ලැබුණ වගේ මේ වෙලේදී හෙමිංවේගෙන් මට ආභාසය ලැබුණා. No One Writes to the Colonel, In Evil Hour, Big Mama's Funeral වගේ කෘතීන් මං අතින් ලියැවුණේ හුඟක් දුරට මේ කාලවකවානුවේදී. මේ කතාවලින් පිළිබිඹු වූ ගම Leaf Storm y හෝ One Hundred Years of Solitude වල හරි නිරූපිත ගමට ~~වඩා වෙනස්. මේ ගමේ විජ්ජාවල් තිබුණේ නෑ.~~ මේ තමයි ජන[redacted]සාහිත්‍යය. නමුත් මං In Evil Hour ලියල ඉවර කළාම මං දැක්කා මගේ දැක්ම ආයෙමත් වැරදි සහගතයි කියලා.

මගේ ළමාවිය ගැන මං ලියූ දේවල් වඩා දේශපාලනිකයි කියල මට පෙනෙන්න ගත්තා. මගේ රටේ යථාර්ථය මං හිතුවට වඩා හොඳින් ඒවායේ පිළිබිඹු වෙන බව මට පෙනුණා. In Evil Hour ලිව්වට පස්සේ අවුරුදු 5 ක් යනකල් මං කිසිම දෙයක් ලියන්නේ නැතිව සිටියා. හැමවෙලේම මං කරන්න ඕන මොකක්ද කියන එක ගැන මට අදහසක් තිබුණා. නමුත් යම් දෙයක් මට මඟ හැරී තිබුණා. ඇත්තටම එක්තරා දවසක හරි ස්වරය කුමක්ද කියන එක මං සොයාගන්න කල්ම ඒ මොකක්ද කියන එක ගැන මට හරි විශ්වාසයක් තිබුණේ නෑ. ඒ හරි ස්වරය තමයි One Hundred years of Solitude ලිවීමේදී මං යොදා ගත්තෙ. ඒ ස්වරය මගේ අත්තම්මා මං පුංචි සන්ධියේදී කතාන්දර කියල දෙන්න පාවිච්චි කරපු ස්වරයමයි. ඇය යම් යම් දේ ගැන කියා දුන්නෙ අති ස්වාභාවික සහ විස්මය දනවන අයුරින්. නමුත් ඇය ඒක කියා දුන්නේ මුළුමනින්ම ස්වාභාවික ලෙසයි. මං පාවිච්චි කරන්න ඕන ස්වරය කුමක්ද කියල අන්තිමේදී මං සොයාගත්තට පස්සෙ මාස 18 ක් සෑම දවසක්ම මඟ හරින්නේ නැතිව මං එක දිගටම වැඩ කළා.

**'මායාවී' බව ඇය කොහොමද ඒ තරම් ස්වාභාවිකව මතු කළේ?**

ඇයගේ මුහුණේ පළවුණු හැඟීම් තමයි වඩා වැදගත්. කතාන්දරය කියල ඉවරවෙනකල් ඇය මුහුණෙන් පළවුණු ඒ ප්‍රකාශනය වෙනස් කළේ නෑ. මේ ගැන හැමෝම පුදුමයට පත් වුණා. One Hundred Years of Solitude ලියන්න මං කලින් දරපු උත්සාහයන්වලදී මේ ගැන විශ්වාස කරන්නෙ නැතිව මං කතාව කියන්න බැලුවා. ඒත් මං සොයාගත් හැටියට ඒ ගැන මං මා තුළම විශ්වාසයක් ඇති කරගත යුතු ~~වුණා.~~ වගේම මගේ අත්තම්මා අපට කතාන්දර කියාදුන් ශෛලිය ඇයගේ මුහුණෙන් පළවූ හැඟීම් ප්‍රකාශනය එයාකාරයෙන්ම යොදාගැනීම සුදුසු බවත් මට තේරුම් ගියා.

**ඒ ස්වරය හෝ ශිල්පීය ක්‍රමය තුළ ජනමාධ්‍යමය ගුණයක් තිබිය හැකියි. එක්තරා මොහොතක යම් විස්මයජනක සිද්ධීන් ගැන ඔබ විස්තර කරනවා. ඊටම ආවේණික යථාර්ථවාදී බවක් එවිට ඇතිවනවා. මෙතැනදී ජනමාධ්‍යකරුවෙක් ලෙස ග්‍රහණය කරගත් යමක් තියෙනවාද?**

ඒක ජනමාධ්‍යමය උපක්‍රමයක්. ඔබට එය සාහිත්‍යයේදී ආදේශකරගන්න පුළුවන්. උදාහරණයක් හැටියට, අහසේ අලි පියාඹමින් සිටියා කියල ඔබ කිව්වොත් මිනිස්සු ඔබව විශ්වාස කරන එකක් නෑ. නමුත් ඔබ කිව්වොත් අලි 425 දෙනෙක් අහසේ පියාඹමින් සිටියා කියලා මිනිස්සු නිසැකවම ඔබව විශ්වාස කරනවා. One Hundred Years of Solitude මේ වගේ දේවල්වලින් පිරිලා. ඒක තමයි හරියටම මගේ අත්තම්මාගේ ක්‍රමය. මං හුඟක් පුංචි සන්ධියේදී විදුලි කාර්මික ශිල්පියෙක් අපේ ගෙදරට ආවා. ඔහු රැගෙන ආ පටියක් ගැන මට විශාල කුතුහලයක් තිබුණා. මේ පටිය තමයි ඔහු විදුලිය තිබුණු තැන්වල අලුත්වැඩියාවලදී රඳා සිටීම සඳහා පාවිච්චි කළේ. මගේ අත්තම්මා කියන්න ගත්තා, මේ මනුස්සයා ඇවිත් ගිය හැම වෙලේම ගෙදර සමනලයින්ගෙන් පිරුණා කියලා. නමුත් මං මේක ලියන්න ගියාම, මං සොයාගත්ත දේ තමයි, මේ සමනලයින් කහ පාටයි කියලා මං නොලිව්වා නම් මිනිස්සු ඒක විශ්වාස කරන එකක් නෑ කියලා. කතාව ලියාගෙන යද්දි සුන්දරත්වය සුරලොව දක්වාම පැතිරුණා කියලා කියන්න ගියා නම් ඒක විශ්වාස කරවන්න මට සෑහෙන කාලයක් ගන්න වෙනවා.

එක දවසක් මං ගෙවත්තේ එහෙ මෙහෙ ඇවිදිමින් සිටියා. එක්තරා කාන්තාවක් ඇතිරිලි වගයක් සෝදලා ඒවා වේළෙන්න වනමින් සිටියා. ඒ වෙලාවෙ හුඟක් තදින් සුළං හැමුවා. මේ ඇතිරිලි එහෙ මෙහෙ අරන් යන්න එපා කියලා ඇය සුළඟත් එක්ක වාද කරමින් සිටියා. මෙතැනදී මං සොයාගත් දේ තමයි ඒ ඇතිරිලිවල ලස්සන ගැන කියන්න ගියා නම් මට ඒ කාන්තාව මඟහැරෙනවා. ඉතිං මං කළේ වඩා විශ්වාසනීය ලෙස ඔය කතාව කියන එකයි. සෑම ලේඛකයෙක්ම මුහුණ දෙන ගැටලුව තමයි විශ්වසනීයභාවය. ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් ලියන්න පුළුවන් වෙන්නේ එය විශ්වාස කරන තාක් දුරට විතරයි.

**One Hundred Years of Solitude හි දැක්වෙන නින්ද නොයාමේ වසංගතය ඇතිවීම ගැන යමක් කිව හැකිද?**

ඊඩිපස් ගෙන් තමයි ඒක පටන්ගත්තෙ. මං නිරන්තරයෙන්ම වසංගත ගැන උනන්දුයි. මධ්‍යතන යුගයේ වසංගතයක් ගැන මං ගොඩක් දේවල් අධ්‍යයනය කළා. මං කැමතිම පොත්වලින් එකක් තමයි, ඩැනියෙල් ඩෙෆෝගේ The Journal of the Plague Year. ඒකට කැමැති වෙන්න තවත් හේතුවක් තමයි ඩෙෆෝ ඔහුට කියන්න ඕන දේ හරිම ෆැන්ටසියක් විදිහට ඉදිරිපත් කළ මාධ්‍යකරුවෙක් වීම. අවුරුදු ගණනාවක් යනකල් මං හිතාගෙන හිටියෙ ඩෙෆෝ ලන්ඩන් ගැන ලිව්වේ ඒක නිරීක්ෂණය කළාට පසුව කියලයි. නමුත්, පසුව මං දැනගත්තා ඒක නවකතාවක් කියලා. මොකද ලන්ඩනයේ වසංගතය හටගනිද්දි ඩෙෆෝට වයස අවුරුදු 7 කට වැඩි නෑ.

හැම වේලාවේම මං තෝරාගත් තේමාවන් අතරේ වසංගත තිබුණා. හැබැයි ඒ විවිධ ආකාරවලින්. The Evil Hour වල පත්‍රිකා තමයි වසංගත. හුඟක් කල් යනකල්ම මං හිතාගෙන හිටියෙ කොළොම්බියාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය වසංගතයක් තරමටම ගුප්තයි කියලා. One Hundred Years of Solitude ලියන්න කලින් මං වසංගතය පාවිච්චි කළේ සෑම කුරුල්ලෙක්ම මරලදාන්න. ඒ One Day After Saturday කතාවේදී. One Hundred Years of Solitude වලදී මං ඒක පාවිච්චි කළේ සාහිත්‍යමය උපක්‍රමයක් හැටියටයි. එතකොට නින්ද නොයාමේ වසංගතය ප්‍රතිවිරුද්ධ අර්ථයෙන්

තමයි එතැනදී යොදාගත්තෙ. නිසැක වශයෙන්ම සාහිත්‍ය කියන්නේ වඩුවැඩක් වගේ දෙයක්.

**ඒ ක්‍රමවේදය ගැන ඔබට ටිකක් විස්තර කරන්න පුළුවන්ද?**

ඒ දෙකම හරිම දුෂ්කර කාර්යයන්. යමක් ලියන එකත් මේසයක් හදනවා වගේම අමාරු වැඩක්. මේ දෙකේදීම ඔබ වැඩ කරන්නේ යථාර්ථයත් සමඟයි. මේ ලිවීමේදී යොදාගන්නා අමුද්‍රව්‍යත් දැව තරම්ම ඇඩියි. මේ දෙකම තාක්ෂණයෙන් හා ප්‍රයෝගවලින් පිරිලයි තියෙන්නෙ. මූලික වශයෙන් ගත්තොත් විජ්ජා හරිම අඩුවෙන් යොදා ගන්නෙ. හුඟාක් තියෙන්නේ අමාරුවෙන් කළ යුතු වැඩ තමයි. ප්‍රවුස්ට් කියනවා වගේ (Proust) මං හිතන්නේ 10% ක් විතරයි මේවායේදී පරිකල්පනය බලපාන්නේ. ඉතිරි 90% ම ශ්‍රමයයි කිව්වොත් හරි. මං කවදාකවත් වඩමඩුවක වැඩ කරලා නෑ. ඒත් මං හුඟාක් කැමැතිවුණු රක්ෂාව තමයි ඒ. මොකද ඔබ වෙනුවෙන් ඒක කරන්න වෙනත් කවුරුන් හෝ කෙනෙක් සොයාගන්න ලැබෙන්නෙ නෑ.

**මොකක්ද මේ One Hundred Year පොතේ එන "කෙසෙල් උණ". ඒක කොපමණ දුරට එක්සත් පලතුරු සමාගම එක්ක සම්බන්ධ වෙනවාද?**

කෙසෙල් උණ කියන්නේ යථාර්ථයට සමීප මොඩලයක්. මං ඒක පාවිච්චි කළේ ඓතිහාසික වශයෙන් තහවුරු නොකළ දේවල් කීම සඳහා සාහිත්‍යමය ප්‍රයෝගයක් හැටියටයි. උදාහරණයක් හැටියට චතුරශ්‍රයේදී සිදුවූ සංහාරය මුළුමනින්ම සත්‍යයක්. නමුත් සාක්ෂි සහ ලේඛන මත පදනම්ව මං ඒ ගැන ලියද්දි හරියටම කී දෙනෙක් මරල දාල තිබුණද කියල දැන සිටියේ නෑ. මං ඒක 3000 ක් කියල ලිව්වේ උපකල්පනය පදනම්වයි. නමුත් මගේ ළමා කාලයට ගියොත් කෙසෙල් කැන් පුරවාගත් හුඟක් දිග කෝච්චි කෙසෙල්වතුවලින් පිටවෙන හැටි නරඹනවා මට මතකයි. ඒ



සංහාරයේදී 3000 ක් විතර මැරෙන්න ඇති. ඒ අය මුහුදට විසිකරන්නත් ඇති. මෙතැනදී ඇත්තෙන්ම පුදුමයට කාරණය තමයි, දැන් ඔවුන් කොන්ග්‍රසයේදී හා පත්තරවල ඒ ගැන හරිම ස්වාභාවික විදිහට කතා කරන්නෙ "මරණ සංඛ්‍යාව 3000 ක්" කියලයි. මං අනුමාන කරන හැටියට අපේ ඉතිහාසයෙන් හරි අඩක්ම නිර්මාණය වෙලා තියෙන්නෙ ඔය විදිහට තමයි. The Autumn of the Patriarch කෘතියේදී ආඥාදායකයා කියනවා, ඒක දැන් ඇත්තක් නොවුණාට කමක් නෑ. මොකද ඒක සමහර විට අනාගතයේදී ඇත්තක් වෙන්න පුළුවන් කියලා. කවදා හෝ දවසක මිනිස්සු ආණ්ඩුවට වඩා ලේඛකයො විශ්වාස කරාවි.

**ඒ කියන්නෙ ලේඛකයා සෑහෙන බලසම්පන්න කෙනෙක්. එහෙම නෙවෙයිද?**

ඔව්! මටත් එහෙම හැඟෙනවා. ඒ හැඟීමත් එක්ක මට දැනෙන්නෙ විශාල වගකීමක්. මාධ්‍ය වාර්තාකරණයකදී මුළුමනින්ම

සත්‍ය හා යථාර්ථයට මං ඇත්තටම කැමැතියි. නමුත්, ඉන් නැගෙන හඬ හරියට One Hundred Years of Solitude කතාවේ වගේ අපූර්ව විය යුතුයි. වැඩි වැඩියෙන් මං අතීතයේ ජීවත්වෙනවා කියන්නෙ, අතීතය ආවර්ජනා කරනවා කියන්නෙ මං වැඩි වැඩියෙන් සාහිත්‍ය හා ජනමාධ්‍යවේදය ගැන සිතනවා කියන එකයි. මේ දෙක හුඟක් සමීපයි. සම්බන්ධයි.

**The Autumn of the Patriarch හි සඳහන් රට සිය විදේශ ණය වෙනුවෙන් තමන්ට අයිති මුහුද අත්හරිනවා?**

ඔව්, නමුත් ඒක ඇත්තටම සිදුවුණා. ඒක සිදුවුණා විතරක් නෙවෙයි තවත් බොහෝ වතාවක් ඉදිරියේදීත් සිදුවෙන්න පුළුවන්. The Autumn of the Patriarch කියන්නෙ මුළුමනින්ම ඓතිහාසික කෘතියක්. සත්‍ය තොරතුරු ඔස්සේ ශක්‍යතා සෙවීම ජනමාධ්‍යකරුවකුගේ වගේම නවකතාකරුවකුගේ වැඩක්. ඒ වගේමයි එය යම් ශුද්ධවූ කාර්යයක්. ගැටලුව තමයි, හුඟාක් දෙනා මා චමත්කාරජනක ප්‍රබන්ධකාරයෙක් හැටියට පිළිගැනීම. ඇත්තටම මා ඉතාමත් යථාර්ථවාදී පුද්ගලයෙක්. ලේඛනයේදී පවා මං විශ්වාස කරන්නෙ සැබෑ සමාජවාදී යථාර්ථවාදයයි.

**ඒක උතෝපියානු ද?**

උතෝපියාව කියන වචනයේ තේරුම යථාර්ථයද, පරමාදර්ශයද කියන එක ගැන මට හරියට අදහසක් නෑ. නමුත්, මං හිතන හැටියට ඒක යථාර්ථයයි.

**The Autumn of the Patriarch හි දැක්වෙන චරිත ආඥාදායකයන් ද, උදාහරණයක් හැටියට ඔවුන් සත්‍ය චරිත ඇසුරින් ගොඩනැගුණු ඒවාද? හරියට ෆ්‍රැන්කෝ, පෙරොස් සහ ට්‍රෘජිලො වගේ....?**

සෑම නවකතාවකම චරිතයක් කියන්නෙ කොලාජ් චිත්‍රයක්. විවිධාකාරයේ කොලාජ් ගැන ඔබ අසා ඇති. නැත්නම් කියවල ඇති. ඉතින් සියවසේ ලතින් ඇමෙරිකාවේ සිටි ආඥාදායකයන් ගැන මට සොයාගන්න ලැබුණු සෑම දෙයක්ම මං කියෙව්වා. ආඥාදායක පාලනයක් යටතේ ජීවත්වූ හුඟක් පුද්ගලයන් එක්ක මම කතා කළා. අඩුම තරමේ අවුරුදු 10 ක් විතර මං එහෙම කළා. ඊට පස්සේ මේ චරිත ගොඩනැගෙන්න ඕන කොහොමද කියන එක ගැන මට පැහැදිලි අදහසක් ඇතිවුණා. මේක ලියද්දි මා කියවූ සහ අසාදැනගත් සෑම

> **ඔබට හුඟාක් බලය තියෙනකොට කවුද ඇත්ත කියන්නෙ කවුද බොරු කියන්නෙ කියල ඔබට හොයාගන්න අමාරුයි. ඔබ පරම බලයට ළංවුණාම ඔබට යථාර්ථයත් එක්ක සම්බන්ධයක් නෑ. එපමණක් නෙවෙයි. හුදකලාවේ තියෙන දුර්වලම තැන එතැන තියෙන්න පුළුවන්. ඉතාම බලසම්පන්න පුද්ගලයෙක් - අපි කියමු ආඥාදායකයෙක් කියලා - වටකරගෙන ඉන්නෙ ඔහු යථාර්යෙන් හුදකලා කර තබන අභිලාෂයන් හා පුද්ගලයන්. ඒ සෑම දෙයක්ම පෙළගැහී තියෙන්නේ ඔහු හුදෙකලා කිරීමටයි.**

දෙයක්ම ජීවිතයේ සිදුනොවූ යමක් යොදා නොගෙනම යොදාගන්න මට පුළුවන් වුණා. ඒත් තැනකදී මං තේරුම් ගත්තා මං කවදාවත් ආඥාදායක පාලනයක් යටතේ ජීවත් වෙලා නෑ කියලා. ඉතිං මේ පොත ස්පාඤ්ඤයේ ලිව්වා නම් ආයතනගත ආඥාදායකත්වයක් යටතේ ජීවත්වනවිට ඒ පරිසරය කොහොම එකක් ද කියල දකින්න පුළුවන්. තව මං සිතුවා ඒත් ෆ්‍රැන්කෝගේ පාලනය යටතේ ස්පාඤ්ඤයේ තත්වය කැරිබියානු ආඥාදායකත්වයට වඩා

හුඟාක් වෙනස් බව. මේ නිසා පොත අවුරුද්දක් විතර පිට නොවී තිබුණා. මේකෙදි මොකක් හරි දෙයක් මඟහැරිලා තියෙනවා. ඒත් ඒ මොකක්ද කියා මට හරියටම විශ්වාසයක් තිබුණේ නෑ. මේ ගැන රැයක් පුරා කල්පනා කරලා, මං තීරණයක් ගත්තා. කැරිබියානු දූපත්වලට ආපසු එන්න. ඉතිං අපි හැමෝම කොළොම්බියාවේ බැරන්කුයිලාවලට ආවා. මේ ගැන ජනමාධ්‍යකරුවන්ට මං කළ ප්‍රකාශය ඔවුන් හිතුවේ විහිළුවක් කියලා. මං ඔවුන්ට කිව්වේ මං ආපසු ආවෙ පේර සුවඳ මොනවගේ ද කියල මට අමතක වෙලා තිබුණු නිසා කියලා. ඇත්තම කාරණය තමයි, මට ඇත්තටම ඕන කළේ මගේ පොත ලියල අවසන් කරන්න. ඉතිං මං කළේ කැරිබියානු දූපත් හරහා සංචාරයකු යෙදෙන එකයි. මං දූපතෙන් දූපතට ගියා. මේ චාරිකාවේදි මගේ පොතේ තිබුණු අඩුව මොකක්ද කියල දැනගෙන ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය මං රැස්කරගත්තා.

**ඔබ සාමාන්‍යයෙන් "බලයේ හුදෙකලාව" කියන තේමාව යොදාගන්නවා?**

ඔබට හුඟාක් බලය තියෙනකොට කවුද ඇත්ත කියන්නෙ කවුද බොරු කියන්නෙ කියල ඔබට හොයාගන්න අමාරුයි. ඔබ පරම බලයට ළංවුණාම ඔබට යථාර්ථයත් එක්ක සම්බන්ධයක් නෑ. ඒ්ජමණක් නෙවෙයි. හුදකලාවේ තියෙන දුර්වලම තැන එතැන තියෙන්න පුළුවන්. ඉතාම බලසම්පන්න පුද්ගලයෙක් - අපි කියමු ආඥාදායකයෙක් කියලා - වටකරගෙන ඉන්නෙ ඔහු යථාර්යෙන් හුදකලා කර තබන අභිලාෂයන් හා පුද්ගලයන්. ඒ සැම දෙයක්ම පෙළගැහී තියෙන්නේ ඔහු හුදෙකලා කිරීමටයි.

**ලේඛකයකුගේ හුදකලාව කුමක්විය හැකිද? මේ දෙක එකිනෙකට වෙනස්ද?**

බලයේ හුදකලාවට හුගක් සමානයි. ලේඛකයෙක් යථාර්ථය පිළිබිඹු කරන්න වෑයම් කරනකොට වඩාත් වෙන්නෙ එහි විකෘති දැක්මක් ඉදිරිපත්වෙන එකයි. යථාර්ථය විනිවිද දැකීමට ඔහුට පුළුවන්වෙන්නේ එය සමග ඇති සම්බන්ධය අත්හැරීමෙනුයි. ඒක හරියට එක්ටැම්ගෙයක විසීම වගේ දෙයක් ඔවුන් කියන විදිහට. ජනමාධ්‍යවේදය කියන්නෙ ඊට එරෙහි ඉතාමත් හොඳ ආරක්ෂකයෙක්.

ඒ නිසා තමයි මං ජනමාධ්‍යයේ යෙදෙන්න හැමවිටම වෑයම් කරන්නෙ. මක්නිසාද කිව්වොත් එය සැමවිටම සැබෑ ලෝකයත් සමග මට සම්බන්ධයක් ඇතිකරන නිසයි. මෙතැනදී දේශපාලන මාධ්‍යවේදය සහ දේශපාලනය වඩාත් විශේෂයි.

One Hundred Years of Solitude ලිව්වට පස්සේ මට දැනුණු හුදකලාව ඔය කියන අන්දමේ ලේඛකයකු පෙළන හුදකලාව නෙවෙයි. එය කීර්තියේ හුදකලාවයි. මෙය බලයේ හුදකලාවට බොහෝදුරට සමානයි. ඒත් මගේ මිත්‍රයන් මා එයින් ආරක්ෂාකරනවා. මගේ මිතුරන් නිරන්තරයෙන්ම එහිදී මා සමග සිටිනවා.

**කොහොමද?**

මක්නිසාද කිව්වොත්, මගේ ජීවිතය පුරාම එකම මිතුරන් පිරිසක් රඳවාගන්න මට පුලුවන් වුණු නිසා. මං ඒකෙන් අදහස් කරන්නේ මගේ පැරණි මිතුරන් සමඟ සම්බන්ධතා බිඳ දැමුවේ නැති බවයි. ඔවුන් හැමවිටම තමන්ගේ පා පොළවේ තියාගෙන ඉන්න අය මිසක් ප්‍රසිද්ධ අය නෙවෙයි.

**මේ දේවල් - මේ ප්‍රතිරූප - පටන්ගන්නේ කොහොමද? The Autumn of the Patriarch පොතේ එළදෙනුන් මාලිගා තුළ ජීවත් වෙනවා. මේවා ඇත්ත ප්‍රතිරූපද?**

ඡායාරූප ශිල්පය ගැන පොතක් තියෙනවා. මා ඔබට පෙන්වන්නම්. මං නොයෙක් අවස්ථාවලදී කියල තියෙන දෙයක්, මගේ පොත්වල හැම එකකම මූලාරම්භයේදී

ප්‍රතිරූපයක් තිබනවා. The Autumn of the Patriarch පොතේ පළමු පිංතූරය තමයි, හුඟක් සුඛෝපභෝගි මාලිගයක ඉන්න හුඟාක් මහලු මනුස්සයෙක්. මේ මාලිගයට එන එළදෙනුන් එහි තිරරෙදි කා දමනවා. එහෙත් මේ ප්‍රතිරූපය, මං පින්තූරය මා දකිනතෙක්ම ස්ථාවර වෙන්නෙ නෑ. මං රෝමයට ගිය වෙලාවෙ පොත් සාප්පුවකට ගොඩ වැදුණා. ඒකෙ ඡායාරූපශිල්පය ගැන තිබුණු පොත් මං බලන්න ගත්තා. මොකද ඒවා එකතු කරන්න මං කැමතියි. එතකොට මෙන්න මේ පිංතූරයත් මං දැක්කා. ඒක හරිම සම්පූර්ණයි. මං දැන් ඔබට පෙන්නුවේ කොහොමද ඒක වුණේ කියලා. මං මහා බුද්ධිමතෙක් නොවන නිසාම ජීවිතයේ එදිනෙදා දේවල්වල තිබෙන සම්බන්ධය සොයන්න මට පුළුවන්.

**ඔබේ නවකතා කිසිම දවසක අනපේක්ෂිත හැරවුම් ගෙන තිබේද?**

ආරම්භයේදී නම් මට එහෙම දෙයක් වුණා. මං ලියපු මුල් කාලවලදී මට මානසික ස්වභාවය ගැන සාමාන්‍ය අදහසක් තිබුණා. ඒත් මම ඒක ඉබේ වගේ සිදුවෙන්න ඉඩ ඇරියා. මේ ගැන කලින් මට ලැබුණු හොඳම උපදේශය වුණේ ඒ විදිහට වැඩ කිරීම හරි කියන එකයි. මොකද තරුණයෙකු හැටියට මට බොහෝ ආභාස තිබුණා. ඒත් මට මෙහෙම දෙයකුත් දැනගන්න ලැබුණා; ශිල්ප ක්‍රමය ඉගෙනගෙන තිබුණේ නැත්නම් පසුකාලීනව මං අර්බුදයකට යන්න ඉඩ තියෙනවා කියලා. හේතුව, ආභාසය නැතිවුණාම එය පිරිමසන්න ශිල්ප ක්‍රමය දැනසිටීම අවශ්‍ය වෙනවා. නියමිත කාලය වනවිට මං එය ඉගෙන ගෙන සිටියේ නැත්නම් මේ ගැන යම් ආකෘතියක් පිළියෙල කරන්න මට නොහැකිවෙනවා. මේ ආකෘතිය පිළියෙල කිරීම තනිකරම ශිල්පීය ගැටලුවක්. ඔබ ඒක ඉගෙනගෙන තිබුණේ නැත්නම් ඉදිරියට ඔබ එය ඉගෙන ගන්නෙත් නෑ.

**එයින් අදහස්වන්නෙ විනය ඔබට හුඟක් වැදගත් කියලයි?**

අසාමාන්‍ය විනයක් පවත්වාගන්නේ නැතිව ඔබට පොතක් ලියන්න පුළුවන් වෙයි කියලා මං සිතන්නේ නෑ.

**කෘත්‍රිම උත්තේජක ගැන ඔබ මොකද කියන්නෙ?**

හෙමිංවේ ලියල තිබුණු එක් දෙයක් මගේ හිත ගත්තා. ඔහු කිව්වා ලිවීම කියන්නේ ඔහුට නම් බොක්සිං ක්‍රීඩා කරනවා වගේ දෙයක් කියලා. ඔහු සෞඛ්‍යය සහ ශාරීරික යෝග්‍යතාව පිළිබඳ සැලකිලිමත් වුණා. ෆෝක්නර්ට බේබද්දෙකු වීම හේතුවක් වුණා. නමුත් ඔහු සෑම සම්මුඛ සාකච්ඡාවකදීම කිව්වේ බීමතින් ඉන්න වෙලාවට එක පේළියක්වත් ලියාගන්න ඔහු අසමත් කියලයි. හෙමිංවේත් එහෙම කියල තියෙනවා. සමහර නරක පාඨකයො මගෙනුත් අහලා තියෙනවා මගේ සමහර පොත් ලියල තියෙන්නෙ බීමතින් ඉන්දැද්දිද කියලා. නමුත්, ඒකෙන් පෙන්නුම්කරන්නෙ ඒ අය සාහිත්‍ය ගැන හරි මත්පැන් ගැන හරි කිසිම දෙයක් නොදන්නා බව. හොඳ ලේඛකයෙක් වෙන්න නම් ඔබ ලියන සෑම මොහොතකම සිහිනුවණින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුයි. ලිවීම කියන්නේ කැප කිරීමක්. ආර්ථික තත්වය අයහපත් හෝ භාවමය තත්ත්වය අයහපත් අවස්ථාවල හොඳින් ලිවීමේ යෙදිය හැකියි කියන රොමෑන්තික සංකල්ප ඔස්සේ කරන ප්‍රකාශවලට මං තදින්ම විරුද්ධයි. මං හිතන විදිහට ලිවීම සඳහා ඔබට ඉතා හොඳ මානසික හා කායික තත්ත්වයක් තිබිය යුතුයි. මට අනුව නම් සාහිත්‍ය නිර්මාණ ලිවීමට මනා කායික තත්ත්වයක්ද තිබිය යුතුයි. අපට කලින් සිටි පරම්පරාව මේක තේරුම් ගත්තා. ඔවුන් ජීවිතයට ආදරය කළ මිනිස්සු.

**බ්ලේස් සෙන්ඩ්‍රාස් (Blaise Cendrars) කිව්වා වෙනත් හුඟක් වෘත්තීන් එක්ක සන්සන්දනය**

**කළාම ලිවීම කියන්නේ වරප්‍රසාදයක් කියලා. ලේඛකයෙක් සිය වේදනාවන් අතිශයෝක්තියෙන් ගෙනහැර පාන බවත් ඔහු කිව්වා. ඔබ මොකද සිතන්නෙ?**

මං හිතන්නෙ ලිවීම කියන්නෙ හුඟක් අසීරු දෙයක් කියලා. නමුත් ඉතිං මොන වැඩේ වුණත් ප්‍රවේසමෙන් ක්‍රියාවට නැංවිය යුතුයි. වරප්‍රසාදයක් කියන්නේ මොකක්ද යම් කාර්යයක් ඔබේම තෘප්තිය සඳහා කිරීම කියන්නත් පුළුවන්. මං හිතන්නෙ මම ඕනෑවටත් වඩා මා ගැන සහ අනෙක් අය ගැන ප්‍රශ්න කරනවා. මොකද වැරැදි ඉවසා සිටින්න මට බැරි නිසා. මං හිතන හැටියට ඕනෑම දෙයක් ප්‍රශස්ත ගුණාත්මක භාවයෙන් කිරීම කියන්නෙ වරප්‍රසාදයක්. කොහොම වුණත් ඒක ඇත්තක්. ලේඛකයෝ සාමාන්‍යයෙන් මහන්තෝන්මාදයෙන් (megalomania) පෙළෙනවා. ඔවුන් සිතන්නේ ඔවුන් විශ්වකේන්ද්‍රීයයි, හෘදසාක්ෂිය ඔවුන්ය කියලයි. නමුත්, මම ගෞරවයෙන් සලකන්නේ යම් දෙයක් හොඳින්ම කිරීමයි. මං සංචාරයේ යෙදෙද්දි ගුවන් නියමුවන් හොඳ ගුවන් නියමුවන් බව දැන ගැනීම ගැන මං ලේඛකයකු වීමටත් වඩා සතුටුවෙනවා.

**ඔබ කොයි වෙලාවටද හොඳටම වැඩ කරන්නෙ? ඔබට කාල සටහනක් තියෙනවාද?**

වෘත්තීය ලේඛකයෙක් වුණාට පස්සෙ මට තිබුණු ලොකුම ගැටලුව තමයි, මගේ කාලසටහන. ජනමාධ්‍ය කරුවෙක් වෙනවා කියන්නෙ රාත්‍රියේදීත් වැඩ කරන්න වෙනවා කියන එකයි. මං පූර්ණකාලීනව ලියන්න පටන් ගන්නකොට මට අවුරුදු 40 යි. මගේ කාලසටහනේ උදේ 9.00 ට පටන් ගත්තාම දවල් 2.00 වෙනකල් මං කරන්නේ ලිවීම. 2.00 වෙද්දි මගේ පුතාලා ඉස්කෝලෙ ඇරිලා ගෙදර එනවා. මහන්සිවෙලා වැඩ කිරීම මගේ පුරුද්ද හින්දා මට පුංචි අමනාපයකුත් ඇතිවෙනවා මට ලියන්න ලැබෙන්නේ උදේ කාලයේ විතරයිනෙ



කියලා. ඉතිං මං දවල්ටත් වැඩ කරන්න වෑයම් කළා. නමුත් මට පෙනුණු දේ තමයි මං දවල්ට කළ වැඩ ආයෙමත් පහුවෙනිදා උදේටත් කරන්න වෙනවා කියලා.

ඉතිං මං තීරණය කළා මං ලියන වැඩ කරන්න ඕන උදේ 9.00 ඉඳන් දවල් 2.00 වෙනකල් විතරයි කියලා. 2.30 න් පස්සේ මට හමුවීම්, සම්මුඛ සාකච්ඡා සහ වෙනත් නොයෙක් දේ තිබුණා. මට තවත් ගැටලුවක් තිබුණා. ඒ තමයි මට වැඩ කරන්න පුළුවන් වුණේ වට පිටාව හුරුපුරුදු නම් විතරයි. පරිසරය මගේ වැඩෙත් එක්ක මිත්‍රශීලී සම්බන්ධයක් තිබිය යුතු වුණා. හෝටල්වල හෝ කුලියට ගත් යතුරුලියනවල හෝ මට යතුරු ලියනය කරන්න බෑ. මේ පුරුද්ද මට ගැටලු ඇතිකළා. මොකද මං සංචාරයේ යෙදෙනකොට මට ලියන්න බැරි නිසා. ඇත්තටම, ඔබ නිරන්තරයෙන්ම වෑයම් කරන්නෙ බොරු හේතු ඉදිරිපත් කරල අඩුවෙන් වැඩ කරන්න. ඒ නිසා තමයි ඔබ ඔබටම කරන්න අමාරු විදියේ කොන්දේසි දමා ගන්නේ.

පසුබිම් තත්ත්වය කුමක් වුණත් ඔබ අනුප්‍රාණය ගැන බලාපොරොත්තු තියාගන්නවා. ඒක තමයි රොමෑන්තිකවාදීන්

ඕනෑවටත් වඩා යොදාගත්ත වචනය. මගේ මාක්ස්වාදී සහෝදරවරුන්ට මේ වචනය භාරගැනීම හුඟක් අසීරු වුණා. නමුත් ඔබ ඊට කුමක් කිව්වත් මම තේරුම් අරගෙන තියෙන හැටියට මනස ලිවීම සඳහා ම විශේෂයෙන් හැඩ ගැහිල තියෙද්දි තමයි ඔබට ලියන්න පුළුවන්. එතකොට අදහස් හොඳින් ගලාගෙන එනවා. ඔබට ලියන්න පුළුවන් ගෙදරදී විතරයි වගේ කතා සියල්ල බොරු හේතු දැක්වීම්. නමුත් අර කිව්ව විශේෂිත මොහොතෙදි ඔබ හරි තේමාව තෝරාගෙන නම්, ඊට නිසි අයුරින් සලකන්නත් ඔබට පුළුවන් වෙනවා. ඒ වගේමයි එය ඔබ ඉතා කැමැත්තෙන්, ආසාවෙන් කරන වැඩක් වෙනවා. මොකද ඔබ අකැමැති දෙයක් කිරීම තරම් නරක වැඩක් තවත් නැති නිසා.

හුඟක්ම අමාරු වැඩේ තමයි පළමු පරිච්ඡේදය ලිවීම. පළමු පරිච්චේදය ලියන්න මං මාස ගණන් ගත කරලත් තියෙනවා. ඒක ලිව්වට පස්සෙ ඉතිරි ටික හරිම ලේසියෙන් ලියවෙනව. පළමු පරිච්ඡේදයෙදි ඔබේ පොතට අදාළ බොහෝමයක් ගැටලු ඔබ විසඳා ගන්නවා. එහි තේමාව නිශ්චය කර ගැනීම, ශෛලිය ස්වරය වගේ දේවල්. අඩුම තරමින් මට අදාළව නම් පොතේ පළමු පරිච්ඡේදය කියන්නේ පොතේ ඉතිරි හරිය පිළිබඳ සාම්පලයක් වගේ. මේ නිසා තමයි, කෙටිකතා පොතක් ලියන එක නවකතාවක් ලියනවාට වඩා අසීරු වෙන්නේ. ඔබ කෙටිකතාවක් ලියන හැම වෙලාවෙම ඔබට ඒක නැවත නැවතත් පටන් ගන්න වෙනවා.

**නිර්මාණයකට අවශ්‍ය අනුප්‍රාණය ලැබීමේ මූලාශ්‍රයක් ලෙස සිහින වැදගත් යැයි ඔබ සිතනවාද?**

හුගාක් මුලදී නම් මං ඒවා ගැන හොඳ අවධානයක් දැක්වූවා. නමුත් පසුව මා තේරුම්ගත් දෙයක් තමයි අනුප්‍රාණය ලැබිය හැකි විශිෂ්ටම මූලාශ්‍රය ජීවිතය බව. සිහින කියන්නේ ඉන් බොහොම පුංචි කොටසක් විතරයි. මගේ ලිවීම පිළිබඳ ඇත්තටම ඇත්ත නම් සිහිනවල විවිධ ආකාර සහ ඒවා ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ මට ඇත්තේ අල්ප රුචිකත්වයක් බවයි. සාමාන්‍යයෙන් මං සිහින ගැන දකින්නේ එය ජීවිතයෙන් කොටසක් හැටියටයි. නමුත් යථාර්ථය ඊට වඩා පොහොසත්. ඒත් මං ඉතාමත් දුප්පත් සිහින දකිනවා ද විය හැකියි.

**අනුප්‍රාණය සහ අන්තර්ඥානය අතර ඇති වෙනස පැහැදිලි කළ හැකිද?**

අනුප්‍රාණය කියන්නේ ඔබ හරි තේමාව සොයාගෙන යද්දි, ඔබ ඇත්තටම කැමැති තේමාව හමුවුණාම ඔබේ කාර්යය හුඟක් පහසුවීමෙන් කරගෙන යෑමට පුළුවන් වීම. අන්තර්ඥානය පැහැදිලි කළොත් ප්‍රබන්ධකරණය සඳහා අවශ්‍ය මූලික දෙයක් විශේෂ ඉගෙනීමකින් හෝ විද්‍යාත්මක දැනුමකින් හෝ තොරව දැන ගැනීමේ හැකියාව. යථාර්ථය මොකක්ද කියල හඳුනගන්න නම් මේ විශේෂ ගුණාංගය අවශ්‍යයි. ගුරුත්වාකර්ෂණය කියන්නේ මොකක්ද කියල වෙනත් කිසිවකට වඩා අන්තර්ඥානය තියෙනවා නම් තේරුම් කරගන්න පුළුවන්. එය වෙහෙසවීමකින් තොරව අත්දැකීම් ලැබීමේ ක්‍රමයක්.

නවකතාකරුවකුට අන්තර්ඥානය අත්‍යවශ්‍යයි. මූලික වශයෙන් ගත්තොත් එය බුද්ධිවාදයට විරුද්ධ තත්වයක්. එය තමයි මම ලෝකයේ වැඩියෙන්ම අප්‍රිය කරන දේ. මොකද එයින් සැබෑ ලෝකය අචල න්‍යායක් බවට පත්වෙනවා. එසේ වුණත් නොවුණත් අන්තර්ඥානය තිබෙනම් එය වාසියක්. එය ඇත්නම් හතරැස් සිදුරකට රවුම් කුඤ්ඤයක් දාන්න ඔබ අරගල කරන්න ඕන නෑ.

**න්‍යායවාදීන්ට ඔබ අකැමැතියිද?**

නිසැකවම. ප්‍රධාන වශයෙන්, ඇත්තටම මට ඔවුන්ව තේරුම්ගන්න බෑ. මේ නිසා තමයි මං හුඟක් වෙලාවට කතාන්දර ඔස්සේ

යම් යම් දේවල් පැහැදිලි කරන්නෙ. මොකද උපුටා ගැනීම් කරන්න තරම් මට හැකියාවක් නෑ. මේ නිසාම තමයි බොහෝ විචාරකයන් මට සංස්කෘතික මිනිසෙක් නෙවෙයි කියල කියන්නෙ. මම ප්‍රමාණවත් තරම් උපුටාගැනීම් යොදන්නෙ නෑ.

**ඔබ හිතනවද විචාරකයන් ඔබව නියමාකාර වශයෙන් වර්ගීකරණය කළා කියලා?**

බුද්ධිවාදය කියන්නේ මොකක්ද කියල මං පැහැදිලි කරනවා නම් මට ඒ ගැන තිබෙන ලොකුම උදාහරණය තමයි විචාරකයො. සේරටම කලින් ලේඛකයා කළ යුත්තේ කුමක්ද කියන එක ගැන ඔවුන්ට සිද්ධාන්තයක් තියෙනවා. ඔවුන් ලේඛකයාව තමන්ගේ අච්චුවට දා ගන්න බලනවා. ඔහු ඒ අච්චුවට නොගැළපුණොත් ඔවුන් ඔහුව බලහත්කාරයෙන් හෝ ඒ අච්චුවට දාන්න වෑයම් කරනවා. මං මේ උත්තරය දෙන්නෙ ඔබ මගෙන් ඒ ගැන අහපු නිසා විතරයි. ඇත්තටම මට ඔය විචාරකයන් මං ගැන හිතන්නෙ මොනවද කියන එක හොයන්න උනන්දුවක් නෑ. අවුරුදු ගණනාවක් තිස්සේ මම ඔවුන්ගේ විචාර කියවලවත් නෑ. ලේඛකයා සහ පාඨකයාගේ අතරමැදියන් තමන් කියලයි ඔවුන් කියන්නේ. මං හැම වෙලේම වෑයම් කළේ බොහොම පැහැදිලි, නියම ලේඛකයෙක් වෙන්න. ඒ වගේම විචාරකයා හරහා යන්නේ නැතිව කෙළින්ම පාඨකයා වෙතට ළඟා වෙන්න.

**පරිවර්තකයො ගැන ඔබ මොකද කියන්නෙ?**

පාද සටහන් භාවිත කරන අය හැරුණාම පරිවර්තකයන් ගැන මගේ විශාල පැහැදීමක් තියෙනවා. පැහැදිලි පරිවර්තනය ඉතා අසීරු කාර්යයක්. ඊට හැමවිටම ප්‍රසාද ලැබෙන්නෙ නෑ වගේම ගෙවීම් පවා ඉතා නරකයි. හොඳ පරිවර්තනයක් කියන්නේ අන් බසකින් නැවත නිර්මාණය කිරීමක්. මේ නිසා තමයි මම ග්‍රෙගරි රබාසාට Gregary Rabassa හුඟාක් ගරු කරන්නේ. මගේ පොත් භාෂා 21 කට පරිවර්තනය වෙලා තියෙනවා. රබාසා තමයි මගෙන් යමක් පැහැදිලි කරගන්න විමසීම් නොකළ එකම පරිවර්තකයා. මං හිතන්නේ මගේ නිර්මාණය ඔහු මුළුමනින්ම නැවතත් ඉංග්‍රීසියෙන් ලිව්වා. පොතේ සමහර කොටස් තිබුණා. ඒවා සාහිත්‍යමය වශයෙන් අවබෝධ කර ගැනීම හරිම අසීරුයි. කෙනෙකුට හැඟෙන්නේ පරිවර්තකයා පොත කියවලා මතකයෙන් එය නැවත ලිව්වා කියලායි.

ඔවුන් ගැන මගේ ලොකු ගෞරවයක් තිබෙනවා. මන්ද ඔවුන් බුද්ධියෙන් නොව අන්තර්ඥානයෙන් යුතු අය නිසයි. එපමණක් නොවෙයි ප්‍රකාශකයෝ ඔවුන්ට ගෙවන්නේ බොහොම නරක විදියට. ඔවුන් කරන්නේ නිර්මාණාත්මක කාර්යයක් කියලා ඔවුන් දකින්නෙත් නෑ. සමහර පොත් තියෙනවා, ඒවා ස්පාඤ්ඤ භාෂාවට පරිවර්තනය වෙනවා නම් මං කැමැතියි. හැබැයි ඒක මං වගේ පොතක් ලියනවා තරම්ම වැඩක් වෙන්න තිබුණා. ඒත් එයින් ජීවත්වෙන්න ප්‍රමාණවත් තරම් නම් මුදල් ලැබෙන එකක් නෑ.

**මොන පොතුත් පරිවර්තනය වෙනවාටද ඔබ කැමති?**

මල්රෝගේ (Malraux) සියලුම පොත්, Conrad හා Saint Exupery පරිවර්තනය වෙනවට මං කැමතියි. මේ පොත් කියවගෙන යද්දි මට සමහර වෙලාවට හැඟුණ දෙයක් තමයි ඒවා පරිවර්තනය කරන්න තිබුණා නම් හොඳයි කියලා. මං සාමාන්‍යයෙන් පොතක විශිෂ්ට මුල් කෘතිය හැරුණාම මධ්‍යම මට්ටමේ පරිවර්තනයක් කියවද්දි එය එම කෘතියේ මුල් භාෂාවෙන් ලබාගන්න වෑයම් කරනවා. මට වෙනස් භාෂාවකින් කියෙව්වට පොතක් හොඳටම දැනෙන්නෙ නෑ. මොකද මට හොඳින්ම දැනෙන එකම භාෂාව ස්පාඤ්ඤ භාෂාවයි. කොහොම නමුත් මං, ඉතාලි, ප්‍රංශ භාෂා කතා කරනවා. ඉංග්‍රීසිත් හොඳට දන්නවා.

අවුරුදු 20 ක් තිස්සේ මම හැම සතියකම ටයිම් සඟරාව කියවන්න පුරුදු වෙලා ඉන්නවා.

**මැක්සිකෝව දැන් ඔබට දැනෙන්නෙ ගෙදර වගේද? යම් විශාල ලේඛක ප්‍රජාවක් ගැන ඔබට හැඟීමක් තියෙනවාද?**

ලේඛකයන් හෝ කලාකරුවන් වූ පමණින්ම මං ඔවුන්ගේ මිතුරෙක් නෙවෙයි. විවිධ වෘත්තීන්හි යෙදෙන මිතුරන් රාශියක් මට ඉන්නවා. ඒ අතර ලේඛකයන් සහ කලාකරුවොත් ඉන්නවා. සාමාන්‍ය තේරුමෙන් ගත්තොත් මට හැඟෙන්නෙ මං ලතින් අමෙරිකානු රටක ඉපදුණ මනුස්සයෙක් හැටියටයි. වෙනත් කිසිම රටක නෙවෙයි, ලතින් අමෙරිකාවේ.... ලතින් අමෙරිකානුවන්ට දැනෙන්නේ තමන්ට හොඳින්ම සලකන රට ස්පාඤ්ඤය කියලා. නමුත් පෞද්ගලිකව මං එහෙ කෙනෙක් කියලා මට නම් දැනෙන්නෙ නෑ. ලතින් අමෙරිකාවෙදි දේශ සීමා මායිම් ගැන මට හැඟීමක් නෑ. මං ඒ ගැන සැලකිලිමත් වෙනවා නම් ඒ රටකින් රටකට යද්දි විතරයි. නමුත් මගේ මනස හා හදවත එලෙසමයි. බැරන්කුයිලාවලින් ගුවන්යානයකට ගොඩ වෙද්දි නිල්පාට ඇඳුමක් ඇඳපු කළු යුවතියක් මගේ ගමන් බලපත්‍රයට මුද්‍රා තැබුවා. ඒ වගේම, ජැමෙයිකාවේදී මං ගුවන්යානයෙන් බහිනකොට නිල්පාට ඇඳුමක් අඳපු කළු-යුවතියක් ආයෙමත් මගේ ගමන් බලපත්‍රයට මුද්‍රා තැබුවා. මේ දෙකම කළේ ඉංග්‍රීසියෙන්. භාෂාවෙන් ලොකු වෙනස්කමක් වෙනවා කියලා මම විශ්වාස කරන්නේ නෑ. නමුත්, ලෝකයේ වෙනත් ඕනෑම තැනකදී මට හැඟෙන්නේ මං විදේශිකයෙක් කියලයි. ඒ හැඟීම ආරක්ෂාකාරී බවෙන් මා මුදවනවා. ඒක පුද්ගලික හැඟීමක්. නමුත් මං සංචාරයේ යෙදෙන හැමවිටම ඒ හැඟීම මාත් සමඟ තිබෙනවා. ඒක සුළුතර හැඟීමක්.

**කියුබානු විප්ලවය ලතින් අමෙරිකානු සාහිත්‍යයට ඇතිකළ බලපෑම කුමක්ද?**

මේ දක්වා නම් එය සෘණාත්මකයි. හුගක් ලේඛකයෝ සිතුවෙ දේශපාලනික කැපවීමක් සහිතවයි. ප්‍රබන්ධකරණයේ දී ඔවුන් කළේ තමන්ට ඕනෑ දේ නෙවෙයි. ඔවුන් කළ යුතු යැයි ඔවුන් සිතූ දේයි. ඒ මඟින් නිර්මාණය වූ සාහිත්‍යයට අත්දැකීම් හෝ අන්තර්ඥානය සමඟ කළ හැකි යමක් තිබුණේ නෑ. මේ සඳහා බලපෑ ප්‍රකටම හේතුව තමයි, ලතින් අමෙරිකාව මත වූ කියුබානු සංස්කෘතික බලපෑමට එරෙහිව කටයුතු සිදු වීම. කියුබාවෙ වුණත් මේ ක්‍රියාදාමය සාහිත්‍යය හෝ කලාවට ගැළපෙන පරිදි නව රටාවකින් වර්ධනය වුණේ නෑ, ලතින් අමෙරිකානු සාහිත්‍ය කලාපය පුරා රැගෙන යාමේදී කියුබාව පාලමක් වශයෙන් ක්‍රියා කිරීමට. මේ තේරුමෙන් එක්සත් ජනපදය තුළ ලතින් අමෙරිකානු සාහිත්‍යයේ ඇති වූ පිබිදීමට කියුබානු විප්ලවය ඇරඹුණාම එක්වරම කියුබාව හා ලතින් අමෙරිකාව ගැන විශාල උනන්දුවක් ඇතිවෙනවා. විප්ලවය පරිභෝජනවාදය යටතේ වෙළෙඳ භාණ්ඩයක් බවට පත්වුණා. ලතින් අමෙරිකාව විලාසිතාවක් වුණා. ලතින් අමෙරිකානු නවකතා සෙසු ලෝක සාහිත්‍යයට වඩා පරිවර්තනය වීම් සිදු වුණා. ඇත්තටම කනගාටුදායක කාරණය තමයි, ලතින් අමෙරිකාවේ තිබූ සංස්කෘතික ආධිපත්‍යය. ඒක අයහපත්. මේ නිසා වුණේ ලතින් අමෙරිකානුවන්ට ඔවුන්ගේම නවකතා හොඳයි කියල පෙනුණේ පිටස්තර ලෝකය ඒවා අගය කරන්න ගත්තාට පසුව වීම.

**ඔබ විශේෂයෙන් කැමැති වූ එතරම් ප්‍රකට නැති ලතින් අමෙරිකානු ලේඛකයන් කිසිවකු හෝ සිටිනවාද?**

දැන්, එහෙම කවුරු හරි ඉන්නවාද කියල මට සැකයි. ලතින් අමෙරිකානු සාහිත්‍යයේ නැඟීමත් සමඟ ඇති වූ එක් හොඳ අතුරු බලපෑමක් ලෙස මං දකින්නේ ප්‍රකාශකයන් තමන්ට අලුත් Cortazar කෙනෙක් මඟ හැරෙන්න යනවාද යන කාරණය ගැන

වඩාත් අවධානය යොමු කිරීම. අවාසනාවකට හුඟක් තරුණ ලේඛකයන් වැඩි සැලකිල්ලක් දැක්වූයේ ඔවුන්ගේ ලේඛන කාර්යයට නෙවෙයි. ප්‍රසිද්ධියට. ටූලෝස් විශ්වවිද්‍යාලයයේ ප්‍රංශ මහාචාර්යවරයෙක් ලතින් අමෙරිකානු සාහිත්‍ය ගැන මෙහෙම දෙයක් ලියා තිබෙනවා. හුඟක් තරුණ ලේඛකයන් මං ගැන ඕනෑවට වඩා ලියන්න එපා කියල ඔහුගෙන් ඉල්ලා සිටි බවයි ඒ. මොකද, ඔවුන් පවසනවාලු දැන් මට ප්‍රසිද්ධිය උවමනා නෑ කියල.

නමුත් මෙතැනදී ඔවුන් අමතක කළ කාරණය තමයි, මං ඔවුන්ගේ වයසේ සිටියදී විචාරකයන් මං ගැන ලිව්වේ නැති බව. මට වඩා (Miguel Angel Asturias) මිගෙල් ඒන්ජල් ඇස්තූරියස් ගැන ලියූ බව. මේකෙන් මං පෙන්වා දෙන්න හදන්නෙ මේ තරුණ ලේඛකයො තමන්ගේ ලේඛන කාර්යයේ යෙදෙනවාට වඩා විචාරකයන්ට ලියමින් කාලය නාස්තිකරනවයි කියලයි. වඩා වැදගත් වෙන්නෙ ලේඛනයේ යෙදීම බව ඔවුන් අමතක කරනවා. මගේ සාහිත්‍ය ජීවිතය පිළිබඳ ඉතා වැදගත් කාරණයක් ලෙස මං හිතන්නෙ මට අවුරුදු 40 ක් වෙන තෙක්ම කර්තෘභාග වශයෙන් ශතයක්වත් නොලැබුණු බවයි. ඒ වෙනකල් මට ලැබුණේ ප්‍රකාශයට පත් කළ පොත්වලින් පිටපත් 5 ක් පමණයි.

**ප්‍රසිද්ධිය හෝ සාර්ථකත්වය හෝ වඩා ඉක්මනින් ළඟා වෙනවා කියන්නේ ලේඛකයකුගේ භූමිකාව අයහපත් අතට හැරෙනවා කියලද ඔබ සිතන්නෙ?**

මොන වයස් මට්ටමකදී වුණත් ඒක නරකයි. මගේ පොත්වලට ඉහළ පිළිගැනීමක් මං මිය ගියාට පසුව ඇතිවෙනවා නම් මං කැමැතියි. ධනපති රටක වුණත් ඒක එහෙම වෙනවා නම් තමයි මම කැමැති.

**ඔබ කැමැතිම දේවල් ඇරුණු විට ඔබ කියවන්නේ මොනවාද?**

අදෘශ්‍යමාන බලවේග පිළිබඳ මං කියවනවා. තවත් දවසක මං මොහොමඩ් අලිගෙ මතක සටහන් කියවමින් සිටියා. Bram Stoker බ්‍රෑම් ස්ටෝකර් ගේ 'ඩ්‍රැකියුලා' නියම පොතක්. අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා ගත්තොත්, මං කියවන්නෙ නැතිව සිටියා. මොකද මට හිතුණේ ඒක කාලය කා දැමීමක් කියලා. මට විශ්වාස කවුරු හරි නිර්දේශ කරන කල්ම මං පොතක් කියවන්නෙ නෑ. ඒ වෙනුවට මං හුඟක් කියවන්නෙ මතක සටහන් සහ වාර්තා. වාර්තා හොර ඒවා වුණත් මං කියවනවා. ඒ වගේමයි මගේම ප්‍රියතම පොත් මං ආයෙමත් කියවනවා. නැවත කියැවීමේ තියෙන වාසිය තමයි ඔබට ඕනෑම පිටුවක් පෙරළලා ඔබ කැමැති පරිච්ඡේදය කියවන්න පුළුවන් වීම. 'සාහිත්‍ය' පමණක් කියැවිය යුතුයි කියන පූජනීය අදහස මං බැහැර කරනවා. මං ඕනෑම දෙයක් කියවනවා. යාවත්කාලීන වෙන්න මං පුළුවන් තරම් වෑයම් කරනවා. හැම සතියකම ලෝකයේ හැම තැනම පළ වෙන වැදගත් සඟරා හැම එකක්ම වගේ මං කියවනවා. ප්‍රවෘත්ති ගැන මං උනන්දුවෙන් ඉන්නවා. ටෙලිටයිප් මැෂින් එකෙන් ඒවා කියැවීම මගේ පුරුද්දක්. වැදගත් පත්තර සහ ප්‍රවෘත්ති සේරම කියවලා ඉවර වුණාට පස්සෙ මගේ බිරිඳ මා ළඟට ඇවිත් මට අහන්න ලැබුණේ නැති ප්‍රවෘත්ති ටික කියනවා. එයාට ඒවා කියවන්න ලැබුණෙ කොහෙදීද කියල ඇහුවම ඇය දෙන පිළතුර තමයි බියුටි සැලූන් එකට ගිය වෙලාවක සඟරාවකින් කියෙව්වා කියන එක. ඒ කියන්නෙ මම විලාසිතා සඟරා, කාන්තාවන් සඳහා වූ සඟරා සහ ඔපාදූප සඟරාත් කියවනවා. මේවායින් මං ගොඩාක් දේවල් ඉගෙන ගන්නවා. දැන් මට ඉගෙනගන්න පුළුවන් මේවා කියැවීමෙන් තමයි, ඒ කියන්නෙ මං හරිම කාර්යබහුලයි.

**ලේඛකයකු සම්බන්ධයෙන් ප්‍රසිද්ධිය හානිදායකයි කියලද ඔබ සිතන්නෙ?**

ප්‍රාථමික වශයෙන් ගත්තොත් එය ඔබේ පෞද්ගලිව ජීවිතය ආක්‍රමණය කරනවා. එය ඔබට ඔබේ මිතුරන් සමග ගත කිරීමට ඇති කාලයත් වැඩ කරන්න තියෙන කාලයත් උදුරා ගන්නවා. සැබෑ ලෝකයේ ඔබ හුදෙකලා කිරීමත් ඒ නිසා සිදුවෙනවා. දිගටම ලේඛනයේ යෙදීමටම කැමති නෑ. මොකද ඒ වචන ඒ තරම් විශ්වසනීය නෑ වගේ දැනෙන නිසා. නමුත් මං ඇත්තටම කැමැතියි මගේ පොත් මං මැරුණට පස්සෙ පළකරන්න තිබුණ නම්... එහෙම වුණා නම් ප්‍රසිද්ධියත් එක්ක බැඳිල තියෙන මේ දේවල් වගේම විශිෂ්ට ලේඛකයකු වීමටත් මට වෑයම් කරන්න ඕන වෙන එකක් නෑ. මට අදාළව ගත්තොත් ප්‍රසිද්ධියේ එකම වාසිය තමයි, මට ඒක දේශපාලනිකව භාවිත කරන්න පුළුවන් වීම. වෙනත් විදිහකට ඒක ගුණදායක නෑ වගේ පේනවා. ගැටලුව තමයි දවසේ පැය 24 ම ඔබ ජනප්‍රිය චරිතයක් කියන්නෙ "සේරම හරි, මට හෙට වෙනකල් ජනප්‍රිය චරිතයක් වෙන්න ඕන නෑ." කියල කියන්න බැරිකම. එහෙම නැත්නම් බොත්තමක් ඔබලා. "මට දැන් ප්‍රසිද්ධ වෙන්න ඕන නෑ" කියන්න හැකියාවකුත් නෑ.

**One Hundred Years of Solitude කෘතියෙන් ඔබ අසාමාන්‍ය සාර්ථකත්වයක් අපේක්ෂා කළාද?**

මගේ අනෙක් පොත්වලට වඩා ඔය පොත මගේ මිතුරන් ප්‍රිය කරන කෘතියක් වෙයි කියන එක මං දැන සිටියා. නමුත් මගේ ස්පාඤ්ඤ ප්‍රකාශකයා මේ පොතෙන් පිටපත් 8000 ක් මුද්‍රණය කරන්න යනවාය කියල කිව්වම මං ගල් ගැහුණා. මොකද මගේ අනෙක් පොත් පිටපත් 700 කට වඩා විකිණිලා තිබුණේ නෑ. ඉතිං, මං ඔහුගෙන් ඇහුවා ඇයි අපි හෙමින් පටන් ගත්තෙ නැත්තෙ කියලා. එතකොට ඔහු කිව්වෙ ඒක හොඳ පොතක් කියල ඔහුට විශ්වාසයි ඔය පිටපත් 8000 මැයි - දෙසැම්බර් කාලය තුළ විකිණිලා ඉවරවෙයි කියලා. ඇත්තටම ඒ පිටපත් සියල්ලම බුවනොස් අයර්ස්වලදී සතියක් තුළ විකිණී අවසන් වුණා.




**One Hundred Years of Solitude මේ තරම් ජනප්‍රිය වුණේ ඇයි කියලද ඔබ කියන්නෙ?**

ඒ ගැන නිශ්චිතවම අදහසක් නම් මට නෑ. මොකද මගේම කෘතීන් සම්බන්ධයෙන් මං කොහොමටත් හොඳ විචාරකයෙක් නෙවෙයි. බහුල වශයෙන් අහන්න ලැබුණු දෙයක් තමයි ඒක ලතින් අමෙරිකානු මිනිස්සුන්ගෙ පුද්ගලික ජීවිත ගැන ලියැවුණු පොතක් වීම කියන එක. මේ පොත ඔවුන්ගේ ඇතුළාන්තය ගැන ලියැවුණු එකක්. ඔය පැහැදිලි කිරීම මාව මවිතයට පත් කළා. මොකද මං මුලදී ඒක ලියන්න හිතුවෙ The House කියන තේමාව යටතේ නිසා. නවකතාවේ සියලු වර්ධනයන් ගෙදර ඇතුළෙ සිදුවීමට ඉඩ හැරෙන්නට ඕන වුණා. බාහිරව සිදුවන දේවල් පවා ගෙදර තුළට බලපානවා. පසුව මං ඒ තේමාව වෙනස් කළා. ඒත් පොත මැකොන්ඩෝ නගරයට

ගියාම ආයෙමත් ඒක එහාට ගියේ නෑ. තවත් පැහැදිලි කිරීමක් තමයි සෑම පාඨකයකුටම ඒ පොතේ චරිතයක් තිබුණ කියන එක. මේකෙන් චිත්‍රපටයක් හදන්න මට ඕන වුණේ නෑ. මොකද ප්‍රේක්ෂකයා චිත්‍රපටයේ මුහුණු දැක්කාම ඔහුට අර මවාගත් චිත්‍රය නැතිවෙන නිසා.

**මේ ඇසුරෙන් චිත්‍රපටයක් හදන එකට කිසියම් කැමැත්තක් තිබුණාද?**

ඔව්, මගේ නියෝජිතයා ඩොලර් මිලියනයක ලංසුවක් තිබ්බා. මේක අධෛර්යවත් කරන්න ඕන නිසා ඒක ඩොලර් මිලියන 3 ට ඉහළ දැම්මා. නමුත්, මට චිත්‍රපටයක් ගැන කැමැත්තක් තිබුණේ නෑ. මට පුළුවන් තාක් දුරට මං ඒක වැළැක්වූවා. මං අදහස් කළේ එතැන් තියෙන්න ඕන කියවන්නා සහ පොත අතර පෞද්ගලික සම්බන්ධයක් පමණයි කියලා.

**ඔබ හිතනවද ඕනෑම පොතක් සාර්ථකව සිනමාවට නඟන්න පුළුවන් කියලා?**

හොඳ නවකතාවක් ඔස්සේ බිහිවුණු එක හොඳ චිත්‍රපටයක් ගැනවත් මට හිතාගන්න බෑ. හැබැයි ඉතාමත් අසාර්ථක නවකතා ඔස්සේ බිහිවූ හොඳ චිත්‍රපට හුඟක් මට මතක් වෙනවා.

**චිත්‍රපටයක් හදන්න ඕන කියල ඔබට කවදාවත් සිතුණේ නැද්ද?**

සිනමා අධ්‍යක්ෂවරයෙක් වෙන්න මට ඕනෑ කළ කාලයක් තිබුණා. අධ්‍යක්ෂණය ගැන මං රෝමයේදී ඉගෙන ගත්තා. සිනමාව ගැන මගේ තේරුම් ගැනීම වුණේ ඒක සීමා මායිම්වලින් තොර සෑම දෙයක්ම විය හැකි මාධ්‍යයක් කියලා. මං මැක්සිකෝවට ආවෙත් චිත්‍රපටයක වැඩ කරන්න ඕන වුණු නිසා. හැබැයි අධ්‍යක්ෂවරයෙක් හැටියට නෙවෙයි. තිර පිටපත් රචකයෙක් හැටියට. ඒත් සිනමාව ඒ සමස්ත කර්මාන්තයම කාර්මික කලාවක් වීම, ඒ වගේම ඔබට කියන්න අවශ්‍ය දේ සිනමාවෙන් පැවසීම හරිම දුෂ්කරයි. ඉතින් මං සිනමාවෙන් ඈතට ඈතට යනවා. සිනමාවත් සමඟ මට ඇති සම්බන්ධය වෙන්වෙලා ජීවත්වෙන්න බැරි, ඒත් එකට ජීවත්වෙන්නත් බැරි යුවළක් අතර ඇති සම්බන්ධය වගෙයි. සිනමා සමාගමක් හෝ වාරික සඟරාවක් කියන දෙකෙන් එකක අයිතිකරුවා වීම තෝරා ගන්න කියල කිව්වොත් මං තෝරා ගන්නෙ වාර සඟරාවයි.

**ලේඛකයකු ලෙස ඔබට දීර්ඝ කාලීන අපේක්ෂාවන් හෝ පසුතැවීම් තිබෙනවාද?**

මං හිතන්නෙ ඊට මගෙ පිළිතුරත් කීර්තිය සම්බන්ධයෙන් මා දුන් පිළිතුරට සමානයි. ළඟකදි මගෙන් කෙනෙකු ඇහුවා මම නොබෙල් ත්‍යාගය ගැන උනන්දු ද කියලා. ඒත් මං හිතන්නෙ මට ඒක මහා විනාශයක් වෙයි.

මම ඊට සුදුස්සෙකු වීම ගැන නම් මම් සතුටුයි. ඒත් ඒක ලැබීම නම් හරිම භයානක විය හැකියි. එය කීර්තිය සම්බන්ධ ගැටලු තවත් අවුල්කරන්න ඉඩ තියෙනවා.

ජීවිතේ මම කනගාටුවන එකම දේ මට දුවණියක් නැතිකම.

**ඔබ දැන් කරමින් ඉන්න දේවල් ගැන ඔබට යමක් කියන්න පුළුවන්ද?**

මගේ ජීවිතයේ ලියන ශ්‍රේෂ්ඨතම පොත මා ලියන්න යනවා. ඒත් ඒක මොකක්ද, කොයි කාලෙ මම එය ලියනවද මං දන්නෙ නෑ. මට එහෙම සිතුවිල්ලක් ආවාම; දැන් කලක් තිස්සේ මට එහෙම දැනෙනවා. එතකොට මම ඉතාමත් සන්සුන් වෙනවා. ඒ සිතුවිල්ල මාව පහුකරලා යන්න ගියොත් අල්ලාගන්න.



පරිවර්තනය

**ධම්මික සෙනෙවිරත්න**

*නිදහස් මාධ්‍යවේදියෙකි. විදෙස් විශේෂාංග රචකයෙකි. පරිවර්තකයෙකි.*



ට්‍රැන්කුයිලිනා ඉගුවාරන් කෝටෙස්. ගර්සියා මර්කෙස්ගේ මවුපස මිත්තණිය

# මගේ සීයාගේ නිවෙස

"මගේ නිරන්තර, එමෙන්ම අතිශයින්ම පැහැදිලි මතකයෙහි ඇත්තේ අරකටාකාවේ වැසියන් නොව, මගේ සීයා හා ආච්චි සමඟ මා විසූ ඒ නිවෙසය. දැන් වුව ද, මම එය නිරතුරුව සිහිනෙන් දකිමි. එපමණක් නොවේ; මගේ ජීවිතයේ සෑම දිනකම උදේ මා අවදි වන්නේ සැබැවින් හෝ කල්පිතව මා ඒ සා විශාල පැරැණි නිවසෙහි සිටිනු සිහිනෙන් දුටුවාය යන හැඟීමෙනි. මගේ ජීවිතයේ එක්තරා සුවිශේෂී යුගයක දී, සුවිශේෂ හේතුවකට මා එහි සිටිනවා යන හැඟීම නොවේ; හරියට මා ඒ නිවෙස කිසි දිනෙක හැර නොආවා සේය. මගේ මුළු ළමා අවධිය පුරා පැතිර පැවැති, රාත්‍රී කාලයට ඇති බිය අදටත් පවතී. එය සෑම සවස් යාමයකම ඇරඹී, දොරපළුවල හිදැස් අතරින් ඉර එළිය දකින තෙක්ම සෙමින් සෙමින් මා පීඩාවට පත් කරන පාලනය කළ නොහැකි සංවේදනයකි."

ගබ්රියෙල් ගාර්සියා මර්කෙස් මෙසේ අඩ සියවසකට පසු පැරිසියේ දී සිය පැරැණි මිත්‍රයකු වන ප්ලිනියෝ අපුලෙයෝ මෙන්ඩෝසා සමඟ තමා කොළොම්බියාවේ අරකටාකා ගමෙහි ගත කළ අසාමාන්‍ය ළමාවිය ආවර්ජනය කරයි. ගැබිටෝ සිය ජීවිතයේ මුල් දස වසර ගෙවන්නේ ඔහුගේ මව සහ පියා ද, ඔහුට පසු එක දිගට එකා පසු පස එකා පවුලට එකතු වූ සිය සහෝදර සහෝදරියන් ද සමඟ නොව, මවුපස සීයාගේ හා ආච්චිගේ නිවසෙහිය.

කර්නල් නිකලස් මාර්කෙ මෙජියා සීයාය. ආච්චි ට්‍රැන්කුයිලිනා ඉගුවාරන් කෝටෙස්ය.

එය ජනයා පිරුණු නිවෙසකි. ආච්චි හා සීයා, නැන්දලා, ආගන්තුකයෝ, මෙහෙකරුවෝ, ඉන්දියානුවෝ එහි විසූහ. භූතයන්ගෙන් ද පිරී පැවතියේය. (ඇතැම් විට, මෙම භූතයන් අතර නිවසේ නොසිටි මවගේ භූතයා ද විය.)

කාලයෙන් ද, අවකාශයෙන් ද දුරස්ව ජීවත් වන විට ඔහුට මව නැතිකමේ ආවේශය බලවත්ය. ඔහු ලේඛකයකු බවට පත් කරන ලද්දේ එම අසම්මුඛයේ ආවේශය යළි ලබා ගැනීමට, සිය මතකය තුළ එය ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ එම වෑයමේ විශාල කොටසක් මගිනි. එය, ළමා අවධියේ සිටම ඔහු තමා සමඟම රැගෙන ගිය පුස්තකයකි.

විසි වයස එළඹෙන්නට ද පෙර සිට ගැබ්‍රියෙල් 'නිවෙස' නමින් නිමාවට පත් නොකළ නවකතාවක් ලියමින් සිටියේ යැයි ඔහුගේ මිතුරෝ පවසති.

පනස් ගණන්වල අග භාගය වන තෙක්ම අරකටාකාවේ මෙම පරණ නිවෙස පවුල සතුව පැවැතිණි. ගබ්‍රියෙල් එලිජියෝ (ගබ්‍රියෙල් මර්කෙස්ගේ පියා) 1937 දී සිය බිරිඳ ද දරුවන් ද රැගෙන අරකටාකාවෙන් පිටවූ පසු මෙය වෙනත් පවුල්වලට කුලියට දෙන ලදී. පසුව, මෙම නිවෙස නිරූපද්‍රිතව, එහෙත්, එක්තරා භ්‍රාන්තිජනක ආකාරයට මර්කෙස්ගේ ප්‍රථම නවකතාව වන 'Leaf Storm' හි යළි මතු වෙයි. එහෙත්, මෙම ආවේශය කූටප්‍රාප්තියට පැමිණෙන්නේ 'සියවසක් හුදෙකලාවේ' කෘතියේදීය. ගැබ්‍රියෝගේ මතකයෙහි ඉතා හොඳින් සනිටුහන්ව පවතින දුකින් පීඩිත, බියමුසු ළමා අවධිය මැකෝන්ඩෝවේ ඉන්ද්‍රජාලික ලෝකය ලෙස සදාතනිකත්වයට පත් වෙයි. එහි දී කර්නල් මර්කෙස්ගේ නිවෙස මුළු අරකටාකාව පමණක් නොව, කොළොම්බියාව ද ලතින් ඇමෙරිකාව ද ඉන් එහා ලෝකය ද වසා පැතිරෙයි.

ගබ්‍රියෙල්ගේ උපතින් පසු, රියෝහචාවේ රැකියාව කරමින්, අසතුටින් කල් ගෙවූ ගබ්‍රියෙල් එලිජියෝ අරකටාකාව වෙත පැමිණීමට පෙර තවත් මාස කිහිපයක් ගත විය. රියෝහචාවේ කරමින් සිටි රැකියාවෙන් අස් වූ ඔහු ටෙලිග්‍රාෆ් යැවීමේ රැකියාවට ද සදහටම සමු දුන්නේය. අරකටාකාවට පැමිණ හෝමියෝපති වෙදකමෙන් ජීවිකාව ගෙන යෑමට ඔහු බලාපොරොත්තු විය. එහෙත්, ඔහුට ඒ සඳහා සුදුසුකම් හෝ මුදල් හෝ නොවූයෙන් ද පවුලේ පුරාවෘත්තය කෙසේ වුව ද, කර්නල්ගේ නිවෙසට ඔහු උණුසුම්ව පිළි නොගත් හෙයින් ද, ඔහු සිය බිරිඳ ලුයිසා සමඟ නැවත බැරන්කුයිල්ලා වෙත යෑමට තීරණය කළේය. කෙසේ වුව ද, දෙමහල්ලන්ගේ එකඟත්වය වූයේ ළදරු ගැබ්‍රියෝ ඔහුගේ සීයා හා ආච්චි වෙත තබා යෑමය. මෙම තරුණ යුවළ ගත් තීරණය බඳු දෑ, විස්තෘත පවුල් සහිත සාම්ප්‍රදායික සමාජ තුළ සාමාන්‍ය දේවල්ය. එහෙත්, බිළිඳා කිරි වරන්නට මාස ගණනාවක් තිබිය දී ඔහු සිය මවුපියන් ළඟ තබා යන්නට ලුයිසා ගත් තීරණය තේරුම් ගත නොහැකිය. සැමියා කෙරෙහි ඇය තුළ වූ කැපවීම සැමියා ඇඩි ලෙස ග්‍රහණය කර ගැනීමට වඩා වැඩි යමක් බව නම් පැහැදිලිය. මවුපියන්ගේ සියලු විවේචන ද, ගබ්‍රියෙල් එලිජියෝගේ සියලු අඩුපාඩුකම් හා විකාර ක්‍රියා ද නොතකා ඇය සැබෑ ලෙසින්ම ඔහුට සෙනෙහසින් බැඳී සිටින්නට ඇත. පෙනෙන හැටියට, කිසිදු පැකිළීමකින් තොරව ඔහුගේ දුක සැප විමසමින් ඔහු සමඟ වෙසෙන්නට මෙසේ ඇය එකඟ වූවා විය හැකිය. ඇය ප්‍රමුඛත්වය දුන්නේ කුලුඳුලේ උපන් දරුවාට නොව, සිය සැමියාටය.

කුලුඳුල් දරුවා දමා, බැරන්කුයිල්ලා වෙත යන්නට අරකටාකා නුවරින් දුම්රියට නැගුණු ලුයිසා සහ ගබ්‍රියෙල් ඇලිජියෝ අතර කෙබඳු සංවාදයක් ඇති වන්නට ඇත්දැයි කිසිවෙක් නොදනිති. එහෙත්, තරුණ යුවළ මුදල් අගහිඟකම්වලින් පෙළුණු බව නම් ප්‍රකට කාරණයක් විය. ඒ කෙසේ වුව ද, තවත් මාස කිහිපයක් ඇවෑමෙන් ලුයිසා සිය දෙවන දරු ප්‍රසූතියට පෙරළා අරකටාකා වෙත පැමිණියාය.

මෙයින් වටහා ගත හැක්කේ, එම දෙසැම්බර් මාසයේ දී සියෙනාගාවේ සංහාරය

සහ ඉක්බිති අරකටාකාවේ සහ ඒ අවට මිනිස් ඝාතනයන් සිදු වූ එම අවධියේ දී ලුයිසා සිය දෙවන දරුවා ද සමඟ අරකටාකාවේ විසූ බවය.

මේ කාලය පිළිබඳව ළමා ගැබිටෝගේ එක් මතකයක් වන්නේ කර්නල්ගේ නිවෙස පසුකොට ගමන් ගන්නා සොල්දාදුවන්ය. මව ද අලුත උපන් බිලිඳා ද ආපසු බැරන්කුයිල්ලා වෙත කැඳවාගෙන යෑමට 1929 දී ගබ්රියෙල් එලිජියෝ අරකටාකාවට පැමිණි විට, අලුත් බිලිඳා කඩිනමින් බෞතීස්ම කරනු ලැබූ අතර, 1930 ජූලි මාසය වන තෙක්ම ගැබිටෝ බෞතීස්ම කර නොතිබිණ.

මර්කෙස්ගේ ජීවිතයේ මතක සටහන් ඇතුළත් Living to tell the tale කෘතියේ පිටකවරයට යෙදූ එක් අවුරුදු වයසැති බිලිඳාගේ ඡායාරූපය බලන්න. ගැබිටෝගේ මව ඔහු සීයා හා ආච්චි වෙත දමා යන්නේ මේ ඡායාරූපය ගැනීමට මාස කිහිපයකට පෙරය. දැන් ලුයිසා ආපසු යාගත නොහී වැඩ වර්ජන හා ඝාතන නිසා කොටු වී සිටියි. මෙම මහා සංහාරය කොලොම්බියාවේ ඉතිහාසය වෙනස් කළ තීරණාත්මක සිද්ධිය වූ අතර, අඩ සියවසක සිවිල් යුද්ධ හා නොසලකා හැරීම්වලින් පසු, 1930 දී ලිබරල් රජයක් නැවත බිහිවීම ද, ජාතියේ ඉතිහාසය සමඟ මෙම දරුවා සම්බන්ධ වීම ද උදෙසා වැදගත් වේ: දරුවාගේ මවට උවමනා වී නම්, දරුවා බැරන්කියුල්ලාවට රැගෙන යෑමට මං පෑදීමට ද මෙම සිද්ධිය ඉවහල් විය. එහෙත්, ගැබිටෝ වෙනුවට ඇය බෞතීස්ම කරන ලද ළදරු ලුවිස් එන්රික් ද රැගෙන පුංචි ගැබිටෝ සීයාගේ හා ආච්චිගේ නිවසේ දමා බැරන්කියුල්ලාවට ගියේ මෙම අතහැර යෑමට ඔහු හුරුපුරුදු විය යුතු බවත් මෙම විරහව සමඟ ජීවත් විය යුතු බවත්, තේරුම් කරගත නොහැකි මෙම සිද්ධීන්ගේ අනුපිළිවෙළ ඔහුම පැහැදිලි කරගත යුතු බවත් තහවුරු කරමින් එවන් කතාවක් සූක්ෂ්ම ලෙස විස්තර කිරීම මඟින් සියලු අනන්‍යතාවන් මෙන්ම සියලුම දුෂ්ටත්වයන් හා ප්‍රහර්ෂයන් සහිත සිය පෞද්ගලික තත්ත්වයන් පොදු ලෝකයේ ප්‍රහර්ෂයන් හා දුෂ්ටත්වයට සම්බන්ධ වන අනන්‍යතාවක් සකසා ගත යුතු බවට සහතිකයක් දෙමිනි.

හුදකලාව පිළිබඳ ඔහුගේ මතකයන් කෙසේ වුව ද, ඔහු නිවසේ සිටි එකම දරුවා නොවීය. වයස අවුරුදු තුනහමාර වන විට ඔහුගේ සොහොයුරිය මාර්ගරීටා ද එහි විසුවාය. ගැටවර වියේ සිටි ඔහුගේ ඥාති සොහොයුරිය, සරා එමිලියා මර්කෙස් ද ඔවුන් දෙදෙනා අතර වැඩුණාය. ඇය ගැබිටෝගේ මාමා වූ ජුවාන් දෙ ඩියොස්ගේ අවජාතක දැරියකි. ඔහුගේ බිරිඳ ඇය ප්‍රතික්ෂේප කළාය.

මේ නිවෙස, ඇතැම්විට මර්කෙස් සඳහන් කරන අන්දමේ මහා මන්දිරයක් නොවීය. සත්‍ය වශයෙන්ම, 1927 මුල් භාගයේ දී එය එක් නිවෙස් ඒකකයකට වඩා දැව හා මැටිවලින් තැනූ, නිවෙසට පිටතින් සාදන ලද වැසිකිළි ගණනාවක් ද, විශාල පිටුපස මිදුලක් ද සහිත එකිනෙකට වෙන් වූ ගොඩනැඟිලි තුනකි. ගැබිටෝ උපදින විට, මෙම ගොඩනැඟිලි ඇමෙරිකානු ක්‍රමයට, මැදපු සිමෙන්ති දැමූ ගෙබිම් ද, මදුරුවන් පැමිණීම වැළැක්වීමට දුහුල් තිර යෙදූ වානේ කවුළු ද, රතු තුත්තනාගම් පැහැ කුරෙන්ති පියසිවලින් ද සැදිණි. එසේ වුව ද, නිවෙසින් පිටත වැසිකිළි තවමත් පාම් අතු සෙවිල්ලූ පියසිවලින් යුක්ත විය. කොට්ටම්බා ගස්වලින් නිවෙස ඉදිරිපසට සෙවණ ලැබුණේය.

ගර්සියා මර්කෙස්ගේ මුල්ම මතකයෙහි, උද්‍යානයට ඇතුළු වන විටම වම් පැත්තෙහි වූ ගොඩනැඟිලි දෙකකි. එකක් කර්නල්ගේ කාර්යාලයයි. එයටම යා වූ කුඩා පිළිගැනීමේ කාමරයක් විය. ඊට පිටුපසින් වූ පියකරු, කුඩා මැද මිදුල ලොකු පිච්ච ගසකින් ද, දීප්තිමත් පැහැ රෝස, නානා විධ පිච්ච, ස්පයික්නාඩ්, හීලියෝට්‍රෝප්, ජෙරේනියම්, ඇස්ට්‍රොමීලියා යන



*කර්නල් නිකලස් මර්කෙස් සිය සගයන් සමග චාරිකාවක*

විවිධ පුෂ්ප ශාකයන්ගෙන් පිරි, නිරතුරුවම කහ පැහැ සමනලයන් ගැවසුණු කුඩා ගෙඋයනකි. ඊට යාබදව කාමර තුනකින් යුත් නිවෙසකි.

මෙම කාමර තුනෙන් එකක් සීයා හා ආච්චිගේ නිදන කාමරයයි. ගැබ්‍රියෙල් උපන්නේ මෙහිය. එම කාමරයට යාබදවූ ශාන්තුවරයින්ගේ කාමරය පිහිටියේය. සීයා සහ ආච්චි සමඟ විසූ දස අවුරුදු කාලය තුළ තොටිලි ඇඳ කුඩා වැඩි වූ පසු ඔහු සිය නැඟණිය මාර්ගරීටා, ආච්චි අම්මාගේ සොහොයුරියක වූ ෆ්‍රැන්සිස්කා සිමොඩොසෙයා හෝ සිය ඥාති සොහොයුරිය වූ සරා මර්කෙස් සමඟ, උදේ සවස නොනිමී දැල්වුණු පාම්තෙල් පහනින් ආලෝකවත් වූ, පවුලේ එකිනෙක සාමාජිකයාගේ ආරක්ෂාවට කැප කරනු ලැබ සිටි සදා නොවෙනස් දේව මණ්ඩලයක් සමඟ මෙම සාන්තුවරයන්ගේ කාමරයෙහි එල්ලූ ලණු ඇඳක නිදා ගත්තේය.

"සීයා ආරක්ෂා කිරීමට, මුණුපුරන් බලා ගැනීමට, නිවසේ ආරක්ෂාවට, කිසිවෙකුට ලෙඩක් දුකක් නොවැලදෙනු පිණිස ආදී වශයෙන් සාන්තුවරයන්ට කැප කිරීම අපේ ආච්චිගේත් අම්මාගේ කාලයේ පටන් පැවැති චාරිත්‍රයක් විය."

ෆ්‍රැන්සිස්කා නැන්දණිය ජීවිතයෙන් වැඩි කාලයක් දණින් වැටී යාඥා කරමින් කාලය ගත කළාය. අවසානයේ පිහිටියේ "ට්‍රන්කපෙට්ටි කාමරය" යි. එහි පවුලට අයත් පෞරාණික වස්තු හා ගුවාජිරාවේ සිට ගෙන ආ පවුලේ සිහිවනට තැන්පත්කොට තිබිණි.

ඉඩමේ දකුණු පැත්තෙහි, ඇවිද යා හැකි කුඩා ඉඩකින් වෙන්ව කාමර හයක් සහිත, දිග ආලින්දයක් ඇති ගොඩනැගිල්ලකි. මෙම ආලින්දය දිගේ පේළියට විශාල මල් පෝච්චි තබා තිබිණි. පවුලේ අය එය හැඳින්වූයේ 'බිගෝනියා ආලින්දය' යනුවෙනි.

ඉදිරියෙන්ම පිහිටි, කාර්යාලය හා අමුත්තන් පිළිගන්නා කාමරය ඇතුළු කොටස නිවසේ පොදු අඩවියයි. නිවෙසට පැමිණි සුවිශේෂ අමුත්තෝ ආගන්තුකයන්ගේ කාමරයෙහි ලැගුම් ගත්හ. උදාහරණයක් ලෙස එස්පෙජෝ මහත්මයා පැමිණිවිට ලැගුම් ගත්තේ මෙහිය. එහෙත්, පවුලේ

උදව්යගේ යුද හිතවත්තු, ලිබරල් පාක්ෂික යුද වීරයන් වූ රෆායෙල් යුරිබ් යුරිබ් සහ ජනරාල් බෙන්ජමින් පෙරේරා ද ගුජායිරාවේ පැඩිල්ලා හා මග්දලේනාවේ යුද හිතවත්තු ද මෙහි නවාතැන් ගත්හ. ඊට යාබදව කර්නල්ගේ රිදී වැඩපොළ පිහිටියේ ය. නගර සභාවේ සේවය නිසා ඔහුට රිදී වැඩපොළේ කටයුතු විනෝදාංශයක් පමණක් බවට හරවා ගැනීමට සිදු විය. ඊළඟට, නිවසේ හරි මැද පිහිටි ආපනශාලාවය. ඔහු රිදී වැඩපොළට වඩා වැදගත්කමක් ආපනශාලාවට දුන්නේය. එළිමහනට විවෘතව පැවැති එහි දහදෙනෙකුට ඉඩ තිබිණි. කෑමට පෙර හෝ පසු හෝ පැවැත්වෙන බීම සංග්‍රහ සඳහා පැද්දෙන වේවැල් පුටු තබා තිබුණේය. නිවසේ වඩාත්ම ගෞරවාදරයට පාත්‍ර වූ භූතාත්මය විසූ 'අන්ධ ස්ත්‍රියකගේ නිදන කාමරය' පැමිණියේ ඉන් පසුවය. ට්‍රැන්කුයිලිනාගේ සහෝදරියක වූ පෙට්‍රො කෝටෙස් නැන්දා ද ලාසරෝ මාමා ද වසර කිහිපයකට පෙර මියගියේ මේ කාමරයේය. දැන් නැන්දලාගෙන් කවුරු හෝ කෙනෙක් එහි නිදයි. වැඩි විශේෂත්වයක් නැති ආගන්තුකයන්ට නවාතැන් සැපයූ මුළුතැන්ගෙයි ගබඩා කාමරය ඉන් පසුවය. ආපන ශාලාව මෙන්ම එළිමහනට ඇරුණු විශාල පෝරණුව ද සහිත ලොකු මුළුතැන්ගෙය ඊළඟට හමු වෙයි. සිය අමුත්තන්ට සංග්‍රහ කිරීම පිණිස ද පවුලේ වියදමට අමතර ආදායමක් ලබා ගැනීම පිණිස ඉන්දියානුවන්ට පාරේ විකිණීම සඳහා ද ගැබ්‍රියෝගේ මිත්තණිය ද නැන්දලා ද පාන්, කේක් හා නොයෙක් වර්ගයේ කැවිලි තැනූහ.

සාන්තුවරයන්ගේ කාමරයට හා ට්‍රන්ක පෙට්ටි කාමරයට ඔබ්බෙන් නාන කාමරයක් ද, ලොකු වතුර ටැංකියක් සහිත ගෙමිදුලක් විය. වතුර පුරවන හොසෙ කොන්ට්‍රෙරාස් දිනපතා පුරවන වතුර බැරල් පහෙන් වතුර ගෙන ට්‍රැන්කුයිලිනා කුඩා ගැබ්‍රියෝ නැහැව්වේ මේ කුඩා අංගණයේ දී ය. ගැබ්‍රියෝ දිනක් වහලයක් මත නගිමින් සිට පහළ බලන විට ඔහුගේ නැන්දණියක් මෙහි නිරුවතින් දිය නාමින් සිටිනු ඔහු දුටුවේය. කෑ ගසමින් සිය නිරුවත වසා ගන්නවා වෙනුවට ඇය කළේ ඔහුට අත වැනීමය; නොඑසේ නම්, සියක් වසක් හුදකලාවේ කෘතියේ කතුවරයා එම සිද්ධිය මතක් කරන්නේ එසේය. නාන කාමරය පිහිටි අංගණය දකුණු පැත්තෙන් විවර වුණේ අඹ ගසක් පිහිටි කුඩා මිදුලටය. මෙහි කොනක, කර්නල්වරයා සිය ක්‍රමෝපායාත්මක අලුත්වැඩියාවන් සිදු කළ වඩුමඩුව පිහිටියේය. නාන කාමරය හා අඹ ගසට එපිටින්, ඉඩම පිටුපසින් පිහිටියේ දියුණු වෙමින් පැවැති අරකටාකා ටවුම හා ඉඩම වෙන් කළ, කැලෑවට ගිය හිස් බිම්කඩකි. විශාල වානේ බාල්දියකට එකතු කොට, රසකැවිලි තැනීමට ට්‍රැන්කුයිලිනා ප්‍රයෝජනයට ගත්, ගැබ්‍රියෝට සිය ළමා කාලය නිරන්තරවම සිහිපත් කළ එම සුවඳ පිරි ගෙඩි නෙළා ගත් පේර ගස් වැවුණේ මෙම බිම්කඩෙහිය. 'සියක් වසක් හුදකලාවේ' කෘතියෙහි සඳහන් හොසේ ආකාඩියෝ බුවෙන්ඩියා බැඳ තබන පුරාවෘත්තමය චෙස්නට් ගස පිහිටියේ ද මෙහිය. සෙවණැලි අතර සැඟවී හිඳිමින්, ගොරවමින් 'මුර බැල්ලිය' ෆ්‍රැන්සිස්කා නැන්දා බලා සිටිය දී ගබ්‍රියෙල් එලිජියෝ ගර්සියා ලුයිසාගේ අත පතා සිටියේ මෙම චෙස්නට් ගස යටදීය. මේ ගස්වල ගිරවුන්, මැකෝ ගිරවුන්, ට්‍රෝපියල් ආදී කුරුල්ලෝ ද, දෙල් ගසේ අතු අතර මන්දයෙක් ද (sloth) ගැවසුණේය. පිටුපස ද්වාරය සමීපයේ කර්නල් සිය අශ්වයා ද කොටළුවන් ද එමෙන්ම දිවා ආහාරයට පමණක් නොව, කලක් නැවතීමට පැමිණෙන ආගන්තුකයන්ගේ අසුන් ද ගාල්කොට තැබූ ඉස්තාල පිහිටියේය. භූත මන්දිරයක් ලෙස ළමයින් අතර ප්‍රචලිත වූ ගොඩනැගිල්ලක් නිවෙසට යාබදව පිහිටි අතර, ඔවුන් එය හැඳින්වූයේ 'මළ මිනිසාගේ නිවෙස' යනුවෙනි. මුළු නගරයම මේ නිවෙස පිළිබඳව සිරුරේ ලේ සලිතවනසුලු කතා කීහ. මන්ද, අන්තෝනියෝ මොරා නම් වෙනිසියුලානුවෙක්

මේ නිවෙස තුළ එල්ලී මිය යාමෙන් අනතුරුව ද දිගටම නිවෙස තුළ ජීවත් විය. නිවෙස තුළ ඔහු කහික උරුවම් බාන හඬ පැහැදිලිවම ඇසුණේය.

ගර්සියා මර්කෙස්ගේ මුල්ම මතකයන්ට අනුව, අරකටාකා නොයෙක් සිදුවීම්වලින් ගහන වූ ප්‍රචණ්ඩ ප්‍රත්‍යන්ත නගරයකි. සෑම මිනිසෙක්ම කෙටේරියක් ගෙන ගිය අතර, තුවක්කු සුලභ විය. දිනක් මිදුලේ සෙල්ලම් කරමින් සිටින විට ගැහැනියක් ඇගේ සැමියාගේ හිස රෙද්දක දවටාගෙන අතින් ගෙන යනු ගැබ්‍රියෙල් දුටුවේය. හිස සුත් කඳ ඇය පිටුපසින් ඔසවාගෙන එමින් තිබිණි. කඳ කඩමාලුවලින් ආවරණය කොට තිබීම ගැන ඔහුට ඇති වූයේ පසුතැවිල්ලකි.

දිවා කාලය, පැහැදිලි වුත්, විවිධත්වයෙන් පිරුණා වුත් නිරතුරුවම වෙනස් වන්නා වූත්, ඇතැම් විට බිහිසුණු තවත් විටෙක ඉන්ද්‍රජාලික ලෝකයක් විය. රාත්‍රී කාලයේ වෙනසක් නොවීය. එහෙත්, බියකරු බිය. ඔහුගේ මතකය තුළ එය රැඳී ඇත්තේ මෙසේය: "මගෙ ආච්චි හිටියෙ කැලඹුණු ස්වරූපයෙන්. ඇයට හුඟාක් දේවල් දර්ශනය වුණා. රාත්‍රියේදී ඈ ඒ ගැන මට කිව්වා. මළ ආත්ම ගැන කතා කරද්දි ඇය කීවෙ, 'අර, ඒ ගොල්ල හැම තිස්සෙම උරුවම් බානවා. මට හැම තිස්සෙම ඒ ගොල්ල ඇහෙනවා.' නිවසේ සෑම මුල්ලකම මළවුන් ද, මළවුන්ගේ මතකයන් ද රැඳී තිබිණි. සවස හයෙන් පසු නිවෙස තුළ එහා මෙහා සැරිසැරිය නොහැකිය. 'ඔවුන් මාව මුල්ලක ඉඳවනවා. මම අර 'කුණාටුවේ කොළය' (Leaf in the storm) කතාවේ කොලුවා වගේ බලාගෙන ඉන්නවා.' පුංචි දරුවා නාන බේසම තුළ ද, මුළුතැන්ගෙයි ළිප අසල ද මළ මිනිසුන් දැකීම අරුමයක් නොවීය. වරෙක ඔහු ජනේලයක් අසල යක්ෂයා දුටුවේය.

දෛනික ජීවිතයේ පුරා අනිවාර්යයෙන් පැතිර පැවතියේ ට්‍රැන්කුයිලිනාගේ ආධිපත්‍යයයි. ඇගේ සැමියා මෙන්ම නිවසෙහි සෙසු ස්ත්‍රීන් විසින් ද 'මිනා' යනුවෙන් අමතන ලද ඇය අළු පැහැ සංකා සහගත ඇස් සහ බයාදු පෙනුමැති ස්ත්‍රියක වූවාය. සිය ස්පාඤ්ඤ - ඉන්දියානු මුහුණ වටා වූ රිදීවන් කෙස්වැටිය මැදින් බෙදා පීරා ගෙල පිටුපසට කොට කොණ්ඩයක් බැන්දාය. ගර්සියා මර්කෙස්ගේ මතකය: දේවල් සිදුවුණේ කොහොමද කියල විශ්ලේෂණයක් කළොත්, ගෙදර නායිකාව මගෙ ආච්චි. ඇය විතරක්ම නොවෙයි ඇය සන්නිවේදනයේ යෙදුණු මේ අරුම පුදුම බලවේග. ඒ ඒ දවසට කළ හැකි මොනවද, නොකළ හැකි මොනවද කියල තීරණය කළේ ඒ බලවේග. මොකද, ඈ ඇගේ හීනවල තේරුම පහදාගෙන ඒ අනුවයි ගෙදර වැඩ කළේ; ඒ ඒ දවසට කළ යුතු නොකළ යුතු මොනවද කියල තීරණය කළේ. එය කුරුල්ලන්ගෙන්, හෙණ පිපිරුම් හඬින්, කාලගුණයේ වෙනස්කම් පැහැදිලි කරන වායුගෝලයේ සංඥාවලින් පාලනය වුණු රෝම අධිරාජ්‍යය වගෙයි; අපි මෙහෙයවූයේ අදෘශ්‍යමාන දෙවිවරු. හැබැයි, ඒ හැම දෙනාම කතෝලික දෙවිවරු."

ශෝකය පළවන ඇඳුමෙන්, කොයි මොහොතේ හෝ යටිගිරියෙන් කෑ ගසන්නට සූදානමින්, ට්‍රැන්කුයිලිනා හිමිදිරියේ සිට ගොම්මන දක්වාම ගී ගයමින් සන්සුන්කම් උතුරා යන ස්වරූපයෙන් නිවෙස පුරාම පාවුණාය. එහෙත්, සැමවිටම එළඹ ඇති අන්තරායන්ගෙන් නිවැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ කල්පනාවෙන් වැඩ කටයුතුවල නිරත වූවාය. (ඉක්මන් කරන්න. දරුවො නිදි කරවන්න.) කළු සමනල්ලු (ළමයින් හංගන්න. කවුරු නමුත් මැරෙන්න ළඟයි.) අවමංගල්‍යයන් (ළමයින්, ඇහැරවන්න. නැතිනම් ඒ අයත් මිය යාවි.) රාත්‍රියේ ඇගේ අවසන් කාරිය වන්නේ මෙම අන්තරායයන් පිළිබඳව ළමයින්ට මතක් කර දීමය.



*කර්නල් නිකලස් ආර්. මර්කෙස්. මවුපස සීයා.*

ගර්සියා මර්කෙස්ගේ ප්‍රථම ගුරුවරිය රෝසා ෆර්ගසන් පවසන ආකාරයට ට්‍රැන්කුයිලිනා වෙත මිථ්‍යා විශ්වාස බොහෝ විය. රෝසාත් ඇගේ සොහොයුරියනුත් සවස නිවෙසට පැමිණි විට ට්‍රැන්කුයිලිනා මෙසේ පවසයි. "ඔයා දන්නව ද? මට ඊයෙ රාත්‍රියෙ යක්ෂණියකගෙ සද්දෙ ඇහුණා. ඈ ගෙයි වහලෙ උඩට වැටුණා." ගර්සියා මර්කෙස්ගේ නවකතාවල බොහෝ ස්ත්‍රී චරිත මෙන් ඇය ද තමන් දුටු සිහින විස්තර කළාය; දිනක් ඇයට තම හිසෙහි උකුණන් සිටින බව දැනුණි. ඇය හිස ගලවා අතට ගෙන දෙකකුල් අතර හිස රුවා උකුණන් ඇහිඳින්නට වූවාය.

මමා නැන්දා යැයි හැඳින්වුණු, ගැබිටෝගේ ළමා අවධියේ දී නිවසේ සිටි ෆ්‍රැන්සිස්කා සිමොදොසෙයා මෙජියා නැන්දා නැන්දලාගෙන් ප්‍රතාපවත් තැනැත්තිය වූවාය. ට්‍රැන්කුයිලිනා මෙන් නොව, ඇය ස්වාභාවික වේවා අද්භූත වේවා කිසිවකට හෝ කිසිවෙකුට බිය නැතැයි ප්‍රකටව සිටියාය. ඇය බරන්කස්හි දී කර්නල්ගේ පංගුකාරිය වූ ඉයුජිනියෝ රියොස්ගේ අර්ධ සොහොයුරියකි. කර්නල් සහ ඇගේ ඥාති සොහොයුරියක වූ එල් කාමන් දෙ බොලිවාර් සමග හැදී වැඩී මෙඩාර්ඩෝ ඝාතනයෙන් පසු ඔහු සමඟ බරන්කස්හි සිට අරකටාකාවට පැමිණියාය. ඕ අඳුරුවන්ය. හැඩිදැඩි සිරුරක් සතු වූ ඇගේ හිසකෙස් ගුවාජිරෝ ඉන්දියානුවකුගේ මෙන් කළුවන්ය. කොණ්ඩය ගෙතුවාය. ගෙයින් පිටතට යනවිට කොණ්ඩය බැන්දාය. කළු ඇඳුම් ඇඳ තද පාවහන් පැලැන්දාය. සැර දුම්වැටි ඉරුවාය. හැමවිටම ක්‍රියාශීලීව සිටි ඇය කෑ ගසා ප්‍රශ්න ඇසුවාය. ගැඹුරු ස්වරයෙන් කෑ ගසා යම් යම් දේ කරන්නට අණ කළාය. ළමයින්ගේ දවසේ කටයුතු සංවිධානය කළාය. ඒ සෑම දෙනෙක්ම බලා ගත්තාය. පවුලේ සාමාජිකයන්ට මෙන්ම, අනාථයන් හා ඉබාගාතේ යන්නන්ට රැකවරණ දුන්නාය. අමුත්තන් සඳහා විශේෂ කෑම හා රසකැවිලි පිළියෙල කළාය. ගඟට ගෙන ගොස් ළමයින් නැව්වාය. ඔවුන්ගේ හිස්වල උකුණන් ඇත්නම් කාර්බලික් සබන් යොදා හිස් සේදුවාය. පාසලට, පල්ලියට ගෙන ගියාය. ට්‍රැන්කුයිලිනාගේ රාත්‍රී පසුවදන් අසන්නට ඔවුන් මුදා හැරීමට පෙර, ඔවුන්ට යාඥා කරන්නට හුරු කළාය.

පල්ලියේ හා කැරකොප්පුවේ යතුරු තිබුණේ ඈ වෙතය. ශුද්ධ වූ දිනවල දී ඕ අල්තාර සැරසුවාය. පල්ලියට සත්ප්‍රසාදයට ගන්නා විස්කෝතු තැනුවාය. පූජකවරයා නිවෙසට නිතර එන යන තැනැත්තෙක් විය. ළමයින් ඔහුගේ ගමන ආශාවෙන් බලාපොරොත්තු වූයේ ඔහුට සංග්‍රහ කිරීමෙන් ඉතිරි වන රසමසවුළු භුක්ති විඳීමටය.

නිවෙස අවට පිරිසිදු කළ, රෙදි පෙරෙදි සහ වළන් පිඟන් සේදූ අර්ධ කාල සේවක-සේවිකාවෝ ද බොහෝ සිටියහ. සැබැවින්ම, එය ගැහැනුන්ගෙන් පිරි නිවෙසකි. නිවසේ අනෙක් එකම පිරිමියා වූ සිය සීයා සමඟ සමීප, තීරණාත්මක ඇසුරක් පැවැත්වීමට මෙන්ම ගැහැනුන්ගේ ඇසුර සැහැල්ලුවට ගැනීමට ද ජීවිතය පුරාම ඔවුන් මත යැපීමට ද එය හේතුවක් වී තිබිණි. ගැබ්‍රියෙල්ට පිරිමින් යනු, තම සීයා මෙන් අනුකරණය කිරීමට හෝ තම පියා සම්බන්ධයෙන් මෙන් බියෙන් පසුවීමටය. කාන්තාවන් සමඟ ඔහුගේ සබඳතා ඊට වඩා විවිධ මෙන්ම සංකීර්ණ ද වූයේය.

නිවසෙහි සිටි ඉන්දියානු සේවකයෝ සැබැවින්ම වහල්ලුය. ඔවුන් අතර වූ එකම පිරිමියා, ඇපොලිනාර් පිරිමියෙකු ලෙස ගණන් නොගන්නා ලද්දේ ඔහු සම්පූර්ණ මනුෂ්‍යයකු ලෙස නොසලකන ලද බැවිනි. සුරංගනා කතා කියන විට, එම කතා බොහොමයකම කුඩා පිරිමි ළමයෙකු, ගැහැනු ළමයෙකු, ආච්චි, සීයා කෙනෙකු සිටීම - ඔහු, මාර්ගෝ, නිකලස් සහ ට්‍රැන්කුයිලිනා - මෙන් ඔහුගේ සිත් ගන්නට ඇත. ඔහු පසු කලෙක මේ පිළිබඳව සිය මිතුරු ප්ලිනියෝ මෙන්ඩෝසාට පැහැදිලි කළේය. "පුදුමෙ මට මගේ සීයා වගේ වෙන්න උවමනා වීමයි. මට උවමනා වුණේ ඔහු වගේ යථාර්ථවාදී, එඩිතර, ආරක්ෂාව සපයන කෙනෙකු වීමයි. ඒත් මගේ ආච්චිගේ සීමාවට එබී නොබලා ඉන්නට මට හැකි වුණේ නැහැ." සිය මුනුපුරු මිනිබිරියන්ගේ මතකයෙහි සිංහයෙකු මෙන් තේජාන්විත වූ 'ලියෝ පපා' කාන්තාවන් රැසක් වෙත සිය අණසක පැතිරවීය. සුරක්ෂිතභාවය ද අලුතෙන් ඔහු සෙවූ ගෞරවාන්විතභාවය ද සමඟ අරකටාකාවට කැටුව ආ අයයි. තීරණාත්මක ඍජු අදහස් සම්බන්ධයෙන් ඔහු බොරුකාරයෙකු වුවා මෙන්ම, ඍජුව කටයුතු කරන්නෙක් විය. ගැබ්‍රියෙල්ට දැනුණේ තමා ඔහුගෙන් ඍජුවම පැවත එන්නා සහ උරුමක්කාරයා බවය.

කර්නල් සිය මුනුපුරා සෑම තැනම කැටුව ගියේය. හැම දෙයක්ම පැහැදිලි කර දුන්නේය. සැකමුසු දෙයක් සම්බන්ධයෙන් නම්, නිවෙසට ගිය පසු පවුලේ ශබ්දකෝෂය ගෙන එහි නිර්වචනය පෙන්වා පැහැදිලි කර දුන්නේය.

ගැබ්‍රියෙල් ඉපදෙන විට, කර්නල්ගේ වයස අවුරුදු 63කි. සිය බිරිඳ මෙන් ඔහු ද යුරෝපීය පෙනුමැති පුද්ගලයෙකි. උස් නළලක්, තට්ටය මතු වෙමින් පැවැති හිසක් හා ඝනකම් රැවුළක් ඔහු සතු විය. බොහෝ දිනවල ඔහු අතිශයින් පිරිසිදු සුදු කමිසයක් ද කලිසමක් ද වර්ණවත් උරපටි ද ඇන්දේය. රත්රන් රාමු සහිත උපැස් පැලැඳි ඔහුගේ එක් ඇසක් ඒ වනවිට ග්ලුකෝමාවෙන් නොපෙනී යමින් පැවැතිණි.

තමා ජීවත් වන මෙම සමාජය තුළ හොඳින් අවබෝධ කරගෙන සිටියේ යැයි ද, ඕනෑම වාතාවරණයක් තුළ තමාට හැකි හොඳම දේ කළේ යැයි ද ඔහු හොඳ විශ්වාසයෙන් පසු විය. එසේ වුවද, සදාචාරාත්මක වශයෙන් නම් - ලිංගික කාරණා සම්බන්ධයෙන් - ඔහු තරමට වඩා කෝල ගති දක්වන්නෙකු නොවන බව පෙන්වූ, හෙළන ඇසිපියෙන් මුහුන් වැටුණු, ඍජු හොඳ හිත ඇති පුද්ගලයෙක් විය.

වසර ගණනාවකට පසු, යථාර්ථය අර්ථ නිරූපණය කරමින්, එය විස්තර කරමින්, එය ප්‍රතිනිර්මාණය කිරීමේ දී ගර්සියා මර්කෙස් සිය සීයාගේ ලෞකික, තර්කානුකූල පැහැදිලි කිරීම්වල දේශනා ස්වරූපය ද, ආච්චිගේ පාර ලෞකික අද්භූත ප්‍රකාශයන් ද ඔහුගේම හාස්‍ය රසය හා මුසුකොට, දර්ශනයක් සහිතව, සෑම කෘතියදීම පාඨකයකුට එක්වනම හැඳින ගත හැකි ප්‍රකාශන ශෛලියක් ද යොදා ගත්තේය.

දවස් දහසේ යුද්ධයෙන් පරාජය වුව ද, සාමය පැවැති කාලයේ දී මර්කෙස් කර්නල්වරයා දියුණු විය.

එදිරිවාදිකම් අවසානයේ දී, කොන්සර්වැටිව් රජය රට විදේශ



*ගර්සියා මර්කෙස්ගේ මවුපියෝ - ගබ්රියෙල් එලිජියෝ ගර්සියා සහ ලුයිසා සැන්තියාගා - 1926 දී*

ආයෝජනයන්ට විවෘත කළ අතර, පළමු ලෝක සංග්‍රාමය අවධියේ හා ඉන් පසුව ජාතික ආර්ථිකය පෙර නොවූ වේගයකින් දියුණු විය. ඇමෙරිකානු මූල්‍ය ආයෝජකයෝ රට තුළ පැට්‍රෝලියම් නිධි ගවේෂණයට ද, පතල් කර්මාන්තයෙහි හා කෙසෙල් වගාවෙහි ද විශාල වශයෙන් ආයෝජනය කළහ. පැනමාව අහිමි වීම සම්බන්ධයෙන් ඇමෙරිකානු රජය කොළොම්බියානු රජයට ඩොලර් මිලියන 25ක් වන්දි වශයෙන් ගෙවන ලද අතර, මෙම ධනය රට නවීකරණය කිරීමේ පොදු වැඩ රාශියක ආයෝජනය කරන ලදි. ඉන් පසු තව තවත් ණය ගන්නා ලදි; මෙම සියලු ඩොලර් සහ පේසොස් රටේ සංසරණය වූයේ කොළොම්බියානු ඉතිහාසඥයන් "දශ ලක්ෂයේ රංගනය" නමින් හඳුන්වන ලද පාලනය කළ නොහැකි මූල්‍ය වාතාවරණයක් ඇති කරමිනි. කැරිබියානු මුහුදු තීරයේ කිසි කලෙකට සමාන කළ නොහැකි ආර්ථික සෞභාග්‍යයක් හා ආයෝජන අවස්ථාවන් ඇති වූ යුගයක් ලෙස ඇතැම්හු මේ යුගය හඳුන්වති.

කෙසෙල්, වැඩී පල දැරීම සඳහා මාස හතත් අටත් අතර කාලයක් ගත වන වසරේ ඕනෑම කාලයක දී නැව් ගත කළ හැකි පලතුරකි. ඇසුරුම් ද්‍රව්‍ය ද ගසෙන්ම ලැබෙන අතර, නව වගා හා පරිවහන ක්‍රම මඟින් ලොව විශාල ධනවාදී නගරවල ආහාර හා ආර්ථික පුරුදු වෙනස් කිරීමට උපස්තම්භක වේ. විදේශ ආයෝජනයන්ගෙන් කලකට පසුව, කොළොම්බියාවේ උතුරු වෙරළාශ්‍රිත ප්‍රදේශවල ද වගාව ඇරඹූ දේශීය ඉඩම් හිමියෝ ද උද්දාමයට පත්ව සිටියහ.

එක්දහස් අටසිය අනූව දශකයේ මැද භාගයේ දී මධ්‍යම ඇමෙරිකාවේ හා ජැමෙයිකාවේ විශාල ඉඩම් ප්‍රමාණයක් හිමි කරගෙන සිටි ඇමෙරිකානු ආයෝජකයෙකු වූ මයිනර් ජේ. කීත් සැන්ටා මාර්තා නගරය අවට ද ඉඩම් මිල දී ගැනීමට පටන් ගත්තේය. ඉක්බිති, 1899 දී ප්‍රධාන කාර්යාලය බොස්ටන් නුවර ද, ප්‍රධාන නාවික වරාය නිව් ඕර්ලියන්ස්හි දී ද ස්ථාපිත කරමින්, එම වසරේ දී ඔහු එක්සත් පලතුරු සමාගම ආරම්භ කළේය. ඉඩම් මිල දී ගන්නා අතරතුරේදීම ඔහු සැන්ටා මාර්තා දුම්රිය සමාගමේ කොටස් ද මිල දී ගත්තේය. අවසානයේ දුම්රිය මාර්ග පමණක් නොව, දුම්රිය සමාගම් කොටස් 60,000ක් 25,000ක්ම එක්සත් පලතුරු සමාගම සතු විය.

කොළොම්බියාව තුළ මයිනර් කීත්ගේ සමාගම් කොටස් 'මුහුදු කොල්ලකරුවකුගේ ප්‍රඥප්තියක් වැනි' වී යැයි දේශපාලන විචාරකයෙක් සඳහන් කරයි.

නවසිය විසි ගණන්වන විට කලාපය ලෝකයේ තුන්වන කෙසෙල් අපනයනකරු බවට පත් විය.

එක්සත් පලතුරු සමාගමට අයත්, සැන්ටා මාර්තා වරායේ වාෂ්ප ගබඩාවලින් අවුරුද්දකට කෙසෙල්කැන් දශලක්ෂයක් පමණ නැව්ගත කෙරිණි. සමාගමට අයත් දුම්රිය මාර්ග සැන්ටා මාර්තාහි සිට ෆන්ඩේසියොන් නුවර දක්වා දිව ගියේ අතරමඟ නැවැතුම් පොළවල් 32ක් පසු කරමිනි. ඉඩම්, වාරිමාර්ග පද්ධති, මුහුදු අපනයනය, සැන්ටා මාර්තාවල සිට සියෙනගා ග්‍රෑන්ඩ් හරහා පැතිරුණු ටෙලිග්‍රාෆ් පද්ධති, සිමෙන්ති, මස් සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අයිස්, ද්‍රරකථන ආදිය නිෂ්පාදනය පිළිබඳ ඒකාධිකාරයක් තරමටම එක්සත් පලතුරු සමාගම බලසම්පන්න වී සිටියේය.

ප්‍රදේශයේ වගාවතුවල හා දුම්රිය මාර්ගවල අයිතිය මගින්, පලතුරු සමාගම ප්‍රදේශයේ නගර නවයක පාලනය සියතට ගෙන සිටියේය. එය වක්‍රාකාරයෙන් ප්‍රදේශයේ පොලීසිය ද, දේශපාලනඥයන් ද, පොලීසිය ද, පුවත්පත් ද පාලනය කළේය. එක්සත් පලතුරු සමාගමට අයත්, සැවිලා ගඟබඩ, ගුවාකමායාල් දිස්ත්‍රික්කයේ අක්කර 135ක් පුරා පැතිරුණු එක් වතු යායක් මැකොන්ඩෝ නමින් හැඳින්විණි.

සැන්ටා මාර්තාවේ විසූ පාලක පන්තියේ ප්‍රභූ පිරිස් නිව්යෝර්ක්, ලන්ඩන් හා පැරිස් යන නගර සමඟ සබඳතා පැවැත්වූ සංස්කෘතිමය වශයෙන් විචක්ෂණශීලී පිරිසක් වුව ද, දේශපාලනමය වශයෙන් සාම්ප්‍රදායික මත දැරුවෝ වූහ. එහෙත්, දැන් එක්සත් පලතුරු සමාගමේ මහා ධවල නෞකා පද්ධතිය මගින් දෛනිකව ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ ද, යුරෝපය හා සෙසු කැරිබියානු රටවල් සමඟ ද, සෑම කෙනෙකුටම සම්බන්ධතා පවත්වාගෙන යා හැකි විය. මේ අතර, ගුවාජිරා අර්ධද්වීපයේ ද, බොලිවාරයේ වහලුන් විසූ ප්‍රදේශවලින් ද, ලොව සෙසු පළාත්වලින් ද, කොලොම්බියාවෙහි වෙනත් ප්‍රදේශවල සිට සංක්‍රමණය වූවෝ ද, කෙසෙල් වතු ආශ්‍රිත රැකියා සඳහා පැමිණියහ. ඔවුහු වතුයාය සහ ඒවායෙහි වැඩ කළ කම්කරුවන් සඳහා කුඩා ව්‍යාපාර පවත්වාගෙන ගියහ. මෙසේ කම්කරුවෝ, වෙළෙන්දෝ, යාත්‍රිකයෝ, ගණිකාවෝ, රෙදි අපුල්ලන්නියෝ, සංගීතඥයෝ සහ අවන්හල් පවත්වාගෙන යන්නෝ මතු වූහ. අභිගුණ්ඨිකයෝ ද, ආවෝ ගියෝය. එහෙත්, සැබෑම අරුතින් ගතහොත්, එකල කෙසෙල් වතු කලාපයේ පදිංචිව සිටි සියල්ලෝම අභිගුණ්ඨිකයෝය. මෙසේ වර්ධනය වෙමින් පැවැති විවිධ ප්‍රජා කොට්ඨාස සිය එදිනෙදා භාණ්ඩ සඳහා ජාත්‍යන්තර වෙළෙඳ පොළ හා සම්බන්ධ වූහ. සතියකට චිත්‍රපට දෙකතුනක් මාරු කළ සිනමා සල්, මොන්ට්ගුමෙරි වෝඩ් භාණ්ඩ, ක්වේකර් ඕට්, වික්ස්බ් වේපර්රබ්, ඉනෝ ෆෘට් සෝල්ට්, කෝල්ගේට් දන්තාලේප -සැකෙවින් ඒ වනවිට නිව්යෝර්ක් ලන්ඩන් වැනි නගරවල සුලභ වූ වෙළෙඳ භාණ්ඩ-මෙම ප්‍රජා කොට්ඨාස අතර ද භාවිතයට ගැනුණේය.

වසර 1900 දී දහසකටත් අඩුවෙන් සිටි අරකටාකාවේ ජනගහනය විසිරී පැතිරී සිටි අතර, වැඩි දෙනා ගංගා ඉවුරුවල රොක්ව සිටියහ. එක්දහස් නවසිය දහතුන වනවිට, ජනගහනය තුන්දහසක් දක්වා වර්ධනය වී, නවසිය විසි ගණන් වන විට දසදහසක් පමණ දක්වා වර්ධනය වී සිටියහ. අරකටාකාව, කලාපයේ වැඩිම උණුසුම හා වැඩිම ආර්ද්‍රතාව සහිත ප්‍රදේශය වූ බැවින්, සරු කෙසෙල් පලදාවක් ලැබුණේ ද මේ ප්‍රදේශයෙනි. කෙසෙල් නිෂ්පාදනය සඳහා කම්කරුවෝ දෛනිකව මහත් ශ්‍රමයක් වැගිරිය යුතු වූහ. ඊට හේතුව වූයේ අරකටාකාවේ උණුසුම වැඩි වී විවේක ගැනීමට නිදා ගැනීමට හෝ වැඩක් නොකර නිකරුණේ සිටීම හෝ අති දුෂ්කර වූ හෙයිනි.

කර්නල් පවුල 1910 දී අරකටාකාවට පැමිණෙන විට, සැන්ටා මාර්තාවෙන් ඇරඹුණු දුම්රිය මාර්ගය සියෙනාගා සහ අරකටාකා පසුකොට ෆන්ඩේසියොන් දක්වා දීර්ඝ වී තිබුණේය. සැතැපුම් හැටක් පමණ දක්වා දුම්රිය මඟ දෙපස පැතිරුණේ කෙසෙල් වතු යායයි. වෙළෙඳ වාසි හේතුවෙන් දියුණු වෙමින් පැවැති, ඒ නිසාම ප්‍රබෝධයෙන් පිරි නගරයක් බවට අරකටාකාව පත්ව තිබිණි. ඉරිදා දිනවල දී ලොතරැයියක් පවත්වන ලදී; නගර චතුරස්‍රයෙහි සෑම ඉරිදාවකම සංගීත කණ්ඩායමක් සෙල්ලම් කළහ. ප්‍රථම වරට 1915 දී අරකටාකාහි පවත්වන ලද සංගීත සන්දර්ශනය හා සැණකෙළිය සුවිශේෂ තැනක් ගත්තේය. වාර්ෂිකව තාවකාලිකව අටවා ගත් ආහාර වෙළෙඳ සල්, වෙළෙඳ කුටි, නැටුම් වේදිකා, වෙළෙඳුන්, වෙදුන්, ඔසු පැළැටි විකුණන්නන්, වර්ණවත් ඇඳුමින් හා වෙස්මුහුණුවලින් සැරසුණු කාන්තාවන් කාකි කලිසම් හා නිල් පැහැ කමිසවලින් සැරසී සුරුට්ටු දුම් වලාකුළු අහසට යවමින් උඩඟු ලෙස එහා මෙහා ගමන් කළ පිරිමින්ගෙන් සියෙනාගා ග්‍රෑන්ඩ් සිට ලවණ සුළඟේ හමා ආ රම් හා දහදිය ගඳින් නගර චතුරස්‍රය පිරී ගියේය. එම ස්වර්ණමය අවුරුදු කිහිපයේ දී සෑම දෙයක්ම, සෑම තැනින්ම ගලා ආ වෙළෙඳ භාණ්ඩ පමණක් නොව, නැටුම් සගයන්, දේශපාලන ඡන්ද, යක්ෂයා සමඟ ඇති කරගන්නා ගිවිසුම් ඈ සෑම දෙයක්ම අලෙවිය සඳහාම වූ බව කියැවේ.

මෙවන් දියුණු අඩියක දී වුව ද අරකටාකා නගරය, වීදිය දෙපස පිහිටි ගොඩනැගිලි පද්ධති දහයකට වඩා විශාල නොවීය. දැවෙන උණුසුම නිසා නොවන්නට, සෞඛ්‍ය සම්පන්න පුද්ගලයකුට විනාඩි විස්සකට අඩු කාලයක් තුළ නගරය කෙළවරට ඇවිද යා හැකි විය.

මෝටර් රථ තිබුණේ අතළොස්සකි. එක්සත් පලතුරු සමාගමේ කාර්යාල කර්නල් නිකලස් මර්කෙස්ගේ නිවෙසට හරි කෙළින්, ඔහුගේ සමීපතම සගයා වූ වෙනිසියුලානු වෛද්‍ය ඇල්ෆර්ඩෝ බාර්බෝසාගේ ඖෂධ වෙළෙඳ සල ආසන්නයේ පිහිටියේය. දුම්රිය මාර්ගය අනෙක් පැත්තේ තවත් ප්‍රජාවක් විසූහ. ඔවුහු ඇමෙරිකානු සමාගමේ පරිපාලකයෝය. ඔවුන්ගේ නිවාස, සමාජ ශාලාව හා ක්‍රීඩා සඳහා වූ තණබිම්, ටෙනිස් පිටි හා පිහිනුම් තටාක මෙහි පිහිටියේය. "සිනිඳු කපු පිළියෙන් සැරසී, ගනකම් දැල් රෙද්දෙන් නිම වූ හිස්වැසුම් පැලඳි සියුමැලි තරුණ කාන්තාවෝ රන්වන් කතුරුවලින් මෙහි ගෙළුයන්වල මල් ඉති කපනු දැකිය හැකි විය." (Living to tell the Tale)

කෙසෙල් යුගයේ දී අරකටාකාව දෙවියන්ට හෝ නීතියට හෝ සීමිත ගෞරවයක් දැක්වූ අඩවියක්ව පැවැතිණි. ප්‍රදේශයේ වැසියන්ගේ ඉල්ලීමක් මත, සැන්ටා මාර්තා දියෝකසිය මඟින් පෙද්රෝ එස්පෙජෝ රියා කචාවේ සිට අර්ධකාලීන පදනම යටතේ අරකටාකාවේ ප්‍රථම පාදිලිවරයා ලෙස පත්කර එවන ලදී.

වසර විස්සක් පුරා ගොඩනැගුණු පත්තුවේ මුල්ම දේවස්ථානය සඳහා මුල්ම ගොඩනැගිල්ල තනවන ලද්දේ ඔහු විසිනි. දේව පූජාව අතරතුර, සෘද්ධි බලයෙන් ඉහළ අහසේ පාවීම පිළිබඳව ද ඔහු ප්‍රකටය. මර්කෙස් ඉගුවාරන් පවුලේ සමීප මිතුරෙකු බවට පත් වූ ඔහු, අරකටාකාවට පැමිණි සෑම අවස්ථාවකම මර්කෙස් ඉගුවාරන් නිවසේ නවාතැන් ගත්තේය. වසර ගණනාවකට ද පසු අද ද, පැරැණි මන්දිරය පිහිටි වීදිය 'එස්පෙජෝ මහත්තයාගේ වීදිය' නමින් හැඳින්වේ.

එක්දහස් නවසිය විසිඅට අවසාන භාගයේ දී අරකටාකාවේ ස්වර්ණමය යුගය බිහිසුණු අවසානයකට පැමිණියේය. දුම්රිය මාර්ග එළීමට ද, වාරි ඇළවල් තැනීම පිණිස ද, භූමිය එළිපෙහෙළි කිරීම, පැළ සිටුවීම, අස්වැන්න නෙළීම හා ඒවා ගෙන යෑම පිණිස



*එක්සත් පලතුරු සමාගමේ කෙසෙල් යායක්*

දුම්රියවලට පැටවීම පිණිස ද ශ්‍රමය අවශ්‍ය විය. මුල දී, කම්කරුවන් අතර බෙදීම් ඇතිකොට ඔවුන් පාලනය කිරීම පහසු වුව ද, නවසිය විසිග ණන් වන විට කම්කරුවෝ කෙමෙන් වෘත්තීය සමිති පිහිටුවා ගනිමින් සංවිධානය වෙමින් සිටි අතර, 1928 නොවැම්බරයේ දී වැඩි වැටුප්, කෙටි වැඩ දින, හා වැඩ කිරීමට වඩා යහපත් තත්ත්වයන් සඳහා වතු සේවකයෝ ඉල්ලීම් රැසක් ඉදිරිපත් කළහ. වතු කළමනාකාරිත්වය විසින් මෙම ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලද අතර, 1928 නොවැම්බර් 12 වැනිදා කෙසෙල් වතු කලාපය පුරා කම්කරුවන් තිස්දහසකගේ වැඩ වර්ජනයක් ප්‍රකාශයට පත් කරන ලදී. (එවිට ගර්සියා මර්කෙස්ගේ වයස අවුරුද්දයි මාට අටකි.)

වර්ජකයෝ එදිනම වතුවලට පැමිණ ලැගුම් ගත්හ. කොන්සර්වැටිව් පාක්ෂික ජනාධිපති මිගුවෙල් අබෙදියා මෙන්දෙස් මීට ප්‍රතිචාර දැක්වූයේ සිවිල් හා හමුදා පාලකයා ලෙස ජනරාල් කාලෝස් කෝටෙස් වර්ගාස් 1,800ක හමුදාවක් ද සමග කඳුකරයේ සිට වතුකරයට එවීමෙනි. කෝටේස් වර්ගාස් සිය හමුදාව ද රැගෙන සැන්ටා මාර්තා වෙත ළඟා වූ විට එක්සත් වතු සමාගමේ කළමනාකාරිත්වය විසින් කලාපය පුරා වූ වතු සමාගමට අයත් සේවා නිවාස හා බඩු ගබඩා ගොඩනැගිලිවල ඔවුන් නවත්වන ලදි. එක්සත් පලතුරු වතු සමාගමේ නිලධාරීන් හමුදාව සඳහා අසංවර හා සෝෂා සහගත සාද පැවැත්වී යැයි ද මේ සාදවල දී ප්‍රදේශයේ කාන්තාවන් අපයෝජනයට ලක් කරන ලද්දේ යැයි ද, ගණිකාවන්ට නිරුවතින් අසුන් පිට යැමට ද, වතු සමාගම අයත් වාරි ඇළවල්වල නිරුවතින් නාන්නට ඔවුන්ට බල කළ බව ද කියැවේ.

1928 දෙසැම්බර් 5 වැනිදා, හිමිදිරි යාමයේ කම්කරුවන් තුන්දහසක් නගර චතුරස්‍රය අත්පත් කර ගැනීමට සියෙනාගාවට ගියහ. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ සියෙනාගාව සියතට ගෙන පළාතේම දුම්රිය මාර්ගවලින් සිදු වූ සන්නිවේදනයන් නතර කිරීමය. සියෙනාගාව



ළදරු මර්කෙස්

හැරුණු විට අරකටාකාවෙන් ද, වැඩ වර්ජනයට විශාල සහයෝගයක් ලැබුණි. සියෙනාගාවේ වෙළෙඳ ප්‍රජාව මෙන්ම පළාතේ බඩු ගබඩා හා ඉඩම් හිමියෝ ද වර්ජකයන්ට අවශ්‍ය කළමනා සපයමින් අවසන් මොහොත දක්වාම සහයෝගය දුන්හ.

කම්කරු වෘත්තීය සංගම් සමඟ යහපත් සබඳතා පවත්වාගෙන ගිය වැදගත් හාම්පුතෙකු ලෙස ජනරාල් හොසේ රොසාරියෝ දුරාන් ප්‍රසිද්ධියක් ඉසිලුවේය. බොහෝ කොන්සර්වැටිව් පාක්ෂිකයන්ගේ අදහස වූයේ ඔහු පමණ ඉක්මවා 'සමාජවාදීන්' සමඟ මිත්‍රශීලී බවය. මුළු පළාතේම 'ලිබරල්' නායකයා ලෙස හමුදා නිල නිවේදනවල සඳහන් වන ජනරාල් දුරාන්, ආණ්ඩුකාර නුනෙස් රෝසාගේ උපකාරය ද ඇතිව, කම්කරුවන් හා පලතුරු සමාගම අතර මැදහත් පුද්ගලයකු ලෙස කටයුතු කරමින් තත්ත්වය සමථයකට පත් කිරීම පිණිස, තමාට ද තම සගයන්ට ද සැන්ටා මාර්තාවට යෑම සඳහා දුම්රියක් එවන ලෙස ඉල්ලමින් සැන්ටා මාර්තාවට විදුලි පණිවුඩයක් යැවීය. අකැමැත්තෙන් වුව ද කෝටේස් වර්ගස් ඊට එකඟත්වය පළකොට දුම්රියක් එවන ලදී. දුරාන් ද, කර්නල් නිකලස් මර්කෙස් ද ඇතුළු ජනරාල් දුරාන්ගේ දූත පිරිස ද ගත් දුම්රිය එදා රාත්‍රී නවය වනවිට සියෙනාගාවට ළඟා වූහ. කම්කරුවන් විසින් දූත පිරිස ප්‍රීති ඝෝෂා පවත්වා පිළි ගන්නා ලදි. සාකච්ඡා කොට ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම පිණිස කම්කරුවෝ දූත පිරිස ද සමඟම සැන්ටා මාර්තා වෙත ගියහ. එහි දී වර්ජකයන් සිරභාරයට ගැනිණි.

කොන්සර්වැටිව් පරිපාලනය ද, එක්සත් පලතුරු සමාගම ද, කොළොම්බියානු යුද හමුදාව ද, කම්කරුවන්ට පාඩමක් ඉගැන්වීම සඳහා ආචාරශීලී ලෙස රුධිරය ගලා යෑමට සැලැස්වීම අපේක්ෂා කළා විය හැකිය.

සියෙනාගාවේ දී හමුදාවට මුහුණ ලා සිටි පිරිස 3000කට අධිකය. සෑම සොල්දාදුවෙක්ම රයිෆලයක් ද, බයිනෙත්තුවක් ද දරා සිටියහ. දුම්රිය නැවැතුම්පොළ ඉදිරියේ මැෂින් තුවක්කු තුනක් සවිකොට තිබිණ. හොරණෑවක් හැඬවීමෙන් අනතුරුව, හමුදා නිලධාරියෙකු වූ කපිතාන් ගරවිටෝ ඉදිරියට පැමිණ 1 වන ආඥාව හඬ නගා කියවීය.

හමුදා තත්ත්වයක් බල පැවැත්වෙයි. ඇඳිරි නීතිය ක්‍රියාත්මකය. සිව්දෙනකු හෝ ඊට වඩා වැඩි පිරිසක් එක් ස්ථානයක රැඳී සිටීම සපුරා තහනම්ය. පිරිස විසිර නොගියහොත් වෙඩි තැබීමට හමුදාවට බලය තිබේ.

මුල දී හමුදාව වෙත ජයගොස නගා, දේශාභිමානී ගී ගායනා කළ පිරිස දැන් හූ තබන්නට ද, නින්දා බස් කියමින් කෑ ගසන්නට ද වූහ. මඳ වේලාවක් ඉක්ම ගිය පසු කෝටේස් වර්ගාස් ඉදිරියට පැමිණ විසිර යන ලෙස

පිරිසගෙන් අයැදිමින්, එසේ නොයන්නේ නම් ඔවුනට වෙඩි කන්නට සිදුවනු ඇතැයි කියා සිටියේය. ඔහු ඔවුනට තවත් විනාඩියක් කල් දුන්නේය. ඒ අවස්ථාවේ දී, 'සියක් වසක් හුදෙකලාවේ' කෘතියෙන් සදාතනිකත්වයට පත්ව ඇති, පිළිතුර වන "උඹලාට පුළුවනි, අනෙක් විනාඩිය අපට පාවිච්චි කරන්න" කියා පිරිස කෑ ගැසූහ. "වෙඩි තබන්න" කෝටේස් වර්ගාස් අණ දුන්නේය. මැෂින් තුවක්කු තුනෙන් දෙකක් ද, (අනෙක ක්‍රියාවිරහිතව තිබිණි) රයිෆල් දෙසීයක් හෝ තුන්සීයක් පමණ ද, චතුරස්‍රය වටා නින්නාද නැංවීය. බොහෝ පිරිසක් බිම ඇද වැටුණහ. දුව ගත හැකි වූ පිරිස දිව ගියහ. වෙඩි මුරය තත්පර කිහිපයක් පැවැතුණු බව කෝටේස් වර්ගාස් පසු කලෙක හෙළි කළේය. නගර චතුරස්‍රයට යාබද සිය නිවසෙහි සිටි ජනරාල්ගේ පුත් සැල්වදෝර් දුරාන් පැවසුවේ හරියටම විනාඩි පහක් පුරා වෙඩි ඇල්වුණු බවය; ඉන් පසුව සියල්ල සන්සුන් වූ අතර, කාමරය තුළ මදුරුවන්ගේ ගුමු ගුමුව පවා ඔහුට පැහැදිලිව ඇසී ඇත. හමුදාව, තුවාලකරුවන්ට බයිනෙත්තුවලින් ඇන ඉවරයක් කර දැමූහ. සිය ආඥාව පිළි නොපැද්දහොත් මරා දමන බව දුරාන් සොල්දාදුවන්ට එදා රාත්‍රියේ දී තර්ජනය කළ බව කියැවේ. බලධාරීන් මළ සිරුරු ඉවත් කරන ලද්දේ පසුවදා උදේ හයටය. නවදෙනෙක් මියගොස් තිදෙනෙක් තුවාල ලද බව නිකුත් කරන ලද නිල නිවේදනයෙන් කියැවිණි.

කී දෙනෙක් මිය ගියේ ද? සතළිස් වසරකට පසු, ගාර්සියා මර්කෙස් සිය 'සියක්වසක් හුදෙකලාවේ' කෘතියෙහි, මියගිය සංඛ්‍යාව 3000ක් යැයි ලියයි. පාඨකයෝ මෙය ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගතිති. 1929 මැයි 19 වැනිදා බොගෝටාවේ එල් එක්ස්පෙක්ටඩෝර් (El expectador) පුවත්පත, දහසකට වැඩි පිරිසක් මියගිය බව සඳහන් කරයි. බොගෝටාවේ ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිත ජෙෆර්සන් කැෆ්රි 1929 ජනවාරි 15 දාතමින් ලියන ලද ලිපියක, දහසකට වැඩි දෙනා මිය ගිය බව එක්සත් පලතුරු සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ තෝමස් බ්‍රැඩ්ෂෝ පැවසී යැයි සඳහන් වුව ද, මේ ලිපිය පිළිබඳව දැන ගන්නට ලැබෙන්නේ තවත් වසර ගණනාවකට පසුවය. සංහාරයේ දී 410ක් ද, ඉන් පසු ගෙවී ගිය සති කිහිපයේ දී දහසකට වැඩි පිරිසක් ද මිය ගියේ යැයි, 1955 දී එක්සත් පලතුරු සමාග මේ උප සභාපති විසින් සමීක්ෂකයකුට පවසා තිබේ. අදටත් මේ සංඛ්‍යාව පිළිබඳ වාද විවාද පවතී.

ගබ්රියෙල් එලිජියො ගර්සියා බැරන්කියුලාවේ රැකියාවේ යෙදී සිටි අතර, සිය පවුල සමඟ තොරතුරු හුවමාරු කරගත නොහැකිව පසු වූයේය. එහෙත්, අරකටාකාවේ විසූ ටෙලිග්‍රාෆකරුවා, සියලු දෙනා සුරක්ෂිතව සුවෙන් සිටින බව ඔහුට කියා යැවීය. ලුයිසාට ලුයිස් එන්රික් ලැබී තිබුණේ මෑතකදීය.



තරුණ මර්කෙස්



ගබ්රියෙල් එලිජියෝ ඔවුන් බැරන්ක්‍යුලාවට ගෙන්වා ගැනීමට උත්සාහ දරමින් සිටියේය. ඔහු හැමවිටම ආණ්ඩුවේ ගණන් බැලීම්වලට එකඟ විය. වෙනකක් තබා එක් පුද්ගලයකු හෝ අතුරුදන් වී නැතැයි සියෙනාගාහි වෙසෙන ගැබිටෝගේ මිත්තණියකගේ සැමියා පවසා තිබුණු බැවින්, තුවාලකරුවන් කිහිපදෙනෙකුට වඩා නොසිටි බව කියමින් ඔහු කෝටේස්ගෙන් සමාව භජනය කළේය.

සංහාරයෙන් දින කිහිපයකට පසු සිරභාරයට ගත් පිරිස් මරා දමන ලදී. එක්සත් පලතුරු සමාගම විසින් මෙහෙයවන ලද එක් හමුදා භට ඛණ්ඩයක් සෑම තැනටම ද, සෑම දෙනාටම ද වෙඩි තබමින් අරකටාකාව පුරා සැරිසැරූහ. එක් රැයක දී අරකටාකාවේ කම්කරුවන් 120ක් අතුරුදහන් වී තිබිණි. සොල්දාදුවෝ අන්ගරීටා පියතුමා අවදි කර, ඔහු වෙත වූ කනත්තෙහි යතුරු ලබා ගත්හ. ඊළඟ දින රාත්‍රිය පුරාම පියතුමා නොනිදා සිටියේ තවත් සිරකරුවන් 79 දෙනෙකු මරණයෙන් මුදා ගැනීමටය.

සංහාරයෙන් පසු ගෙවී ගිය තෙමසක කාලය තුළ, ප්‍රහාරය සිදු කරන විට හමුදාව ඉතා නිවැරැදි ආකාරයට ක්‍රියා කළේ යැයි ද, ඔවුන් ප්‍රජාවගේ සුභසිද්ධිය අරභයා කටයුතු කළා යැයි ද සඳහන් කරමින් ලිපි ලියා එවන්නට බලධාරීන් ද, අරකටාකාවේ ප්‍රභූ නේවාසිකයන් ද, භාණ්ඩාගාරික නිකලස් ආර්. මාර්කේස් සහ ඔහුගේ සගයන් වූ ඖෂධවේදී ඇල්ෆ්‍රාඩෝ බාර්බඩෝසා ද, රටෙන් පිටව සිටි වැනිසියුලානු ජනරාල් මාර්කෝ ෆ්‍රෙයිටෙස් ද නගර සභාවේ සියලු සාමාජිකයන් ද කැමැති කරවා ගන්නා ලදි. මේ බොහෝ දෙනෙකුට මෙය ඔවුන්ගේ සදාචාරය කරණම් ගැස්සීමක් මෙන්ම ඉවසාගත නොහැකි තරමේ නින්දාවක් වන්නට ඇත. ප්‍රහාර තෙමසක් පුරා සිදු විය.

වැඩ වර්ජනය ද ඉන් පසු හට ගත් අමිහිරි සිදුවීම් ද කලාපයට විශාල කැළලක් ඇති කළ අතර, මෙය කොළොම්බියානු ඉතිහාසයේ වඩාත්ම විවාදයට තුඩු දුන් සිද්ධියක් ලෙස රැඳී පවතී.

1929 දී ජෝග් එලියර් ගයිටාන් නම් විසිහය හැවිරිදි තරුණයෙක් රජයට, හමුදාවට හා එක්සත් පලතුරු සමාගමට එරෙහිව පාර්ලිමේන්තුව තුළ ව්‍යාපාරයක් ගෙන යමින් 'බොගොටාසෝ' නම් සිවිල් කැරැල්ල දියත් කළේය. ඝාතනය සිදුවූ ස්ථානයට ගොස්, බොහෝ දෙනාගෙන් කරුණු විමසා රැස්කොට ඔහු බොගෝටා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළේය. 1929 සැප්තැම්බර් මාසයේ දින හතරක් ඔහු පාර්ලිමේන්තුවේ දී මේ සම්බන්ධයෙන් කතා කළේය. ඔහු ඉදිරිපත් කළ සාක්ෂි අතර, බෙහෙවින්ම අනපේක්ෂිත උද්වේග




කර කොටස වූයේ ළදරුවකුගේ හිස් කබලක කැල්ලක් සහ අන්ගරීටා පියතුමා දෝෂාරෝපණ සහිතව ලියන ලද ලිපියකි. මේ සිද්ධියෙන් තවත් මාස කිහිපයකට පසු ගර්සියා මර්කෙස් බෞතීස්ම ලබන්නේ ද මේ පියතුමාගෙනි. ගයිටාන්ගේ ආන්දෝලනාත්මක සාක්ෂිය නිසා සියෙනාගාවේ කම්කරුවන්ට පනවා තිබුණු සිර දඬුවම් අහෝසි විය. ලිබරල්වාදීන් තවත් අසංවිධානාත්මක, ජාතික වශයෙන් දුබල පක්ෂයක් වුව ද, ඔවුහු ක්‍රියාත්මක වීමට පටන් ගත්හ. ක්‍රමයෙන් දේශපාලන වශයෙන් බලසම්පන්න වූ ඔවුහු 1930 දී බලයට පත් වූහ. මේ කාල පරිච්ඡේදය අවසන් වන්නේ 1948 ගයිටාන්ගේ ඝාතනයත් සමඟය. මෙය විසිවැනි සියවසෙහි කොළොම්බියානු ඉතිහාසයෙහි සිදු වූ වැදගත්ම සිද්ධියයි.

එක්සත් පලතුරු සමාගම හා එහි සේවකයන් අතර සම්බන්ධතාවයේ පිරිහීම හා කෙසෙල් කලාපයට සංහාරයෙන් ඇති වූ බලපෑම, සමස්ත කලාපයම ද, ජගත් වාණිජ පද්ධතියම ද ගිල ගන්නා මහා ආර්ථික අවපාතය (Great Depression) නිසා යටපත්ව යයි. ආර්ථික අවපාතය පලතුරු සමාගමේ ක්‍රියාකාරකම් බෙහෙවින් සංකෝචනය වීමට බලපෑවේය. සමාගමෙහි විධායකයෝ ද පරිපාලකයෝ ද යන්නට ගියහ. අරකටාකාවේ ද නොනැවැත්විය හැකි වූ දීර්ඝ පරිහානිය ඇරඹිණි. මේ යුගය ද ගර්සියා මර්කෙස්ගේ ළමා අවධිය හා ඔහුගේ සීයාගේ අවසාන කාලය හා සමපාත වේ.

*(ජෙරල්ඩ් මාටින් විසින් රචිත ගබ්රියෙල් ගර්සියා මර්කෙස්ගේ චරිතාපදානයෙන් උපුටා ගැනුණු කොටසකි)*

පරිවර්තනය

**මන්තිකා**

# සයිබර් අවකාශයේ අපේ කවිය

නූතන ම සිංහල කවිය සමග සිය සෞන්දර්ය අභ්‍යාසය දියත් කොට ඇති නූතන ම සිංහල කවිකිවිඳියෝ තමා අතින් ලියැවෙන අලුත් ම කවිය සහෘද පර්ෂද වෙත දායාද කිරීමේ දී මීට දශක දෙකකට ප්‍රථම අත්දුටු යථාවට වඩා වෙනස් යථාවකට සම්මුඛ වෙමින් සිටිති. අලුතෙන් ලියැවෙන කවිය පුවත්පත් කවි පිටුවක් වෙත යවා සිය ප්‍රතිභාව උරගා බැලූ සමය නිම වී නවකවි පළ කර ගැනීමට නවතම ප්‍රකාශන මාධ්‍ය නූතන ම කවියා අබිමුව විවට වී ඇත. අන්තර්ජාලයීය වෙබ් අඩවි, මුහුණු පොත, බ්ලොග් රචනා ඇතුළු අන්තර්ජාලගත සෞන්දර්ය ප්‍රකාශන ශානර අතලොස්සක් ශීඝ්‍රයෙන් ජනප්‍රිය වන යුගයකි මෙය. මෙම ප්‍රවණතාව හා ආබද්ධ චර්යා හා නිරීක්ෂණ කිහිපයක් මඳ කලෙක සිට සාකච්ඡාවට බඳුන් වෙමින් පවතී. මෙම ක්ෂුද්‍ර ලේඛනය මගින් ද ප්‍රයත්න දරනුයේ තද් නිරීක්ෂණාක්ෂිය ම සහිත ව ප්‍රස්තුතය දෙස අවලෝකනයක් කිරීමට ය.

## සිංහල කවියේ මුහුණුපොත් අවධිය:

Face book හෙවත් මුහුණු පොත අද්‍යතනය වන විට සිංහල කවිය පිණිස දොඩමලු වැඩබිමක් බවට පත් ව ඇති ක්ෂේත්‍රයකි. මුහුණු පොතෙහි පළ වන සිංහල කවි පිළිබඳ එල්ල වී තිබූ චෝදනාව නම් ඇති විමසීමක්, සංස්කරණය හෝ වාරණයක් රහිත ව ශීඝ්‍ර ලෙස තමතමාගේ මුහුණු පොත් ගිණුම් මත කවි මුදා හැරීම නිසා එකවිහි ව්‍යක්තතාම මඳ බව ය. මේ චෝදනාව සම්බන්ධ වලංගුතාව 50% එලෙස ම පවතින බව අදට ද මගේ හැඟීම යි. එහෙත්, ඉතිරි 50% පිළිබඳ ව අද අප වඩා විවෘත මනසින් සාකච්ඡා කළ යුතු තැනකට පැමිණ ඇති බව නව ප්‍රවණතාවක් ලෙස මතු ව ඇත.

මුහුණු පොතෙහි පළ කරන කාව්‍ය නිර්මාණවල ප්‍රමිතිය ඉහළින් තබාගත යුතු ය යන මතය දැන් දැන් නිර්මාණකරුවන් අතර ශීඝ්‍ර ව පැතිර යයි. ආවාට ගියාට නිර්මාණ මුදාහළ නොයුතු බව ඔවුන් ම පිළිගෙන ඇත්තා සේ ය. දැන් දැන් පළ වන නිර්මාණ රසයෙන් ගුණයෙන් බොහෝ විට ප්‍රමිතිගත ය. හොඳ නිර්මාණවලට ලැබෙන උසස් ප්‍රතිචාර හුදු Like ඉක්මවූ යමක් බවට ඔවුනතර ම එකඟතාවක් ඇති සේ ය. රසහීන නිර්මාණ පසුපස 'මුනිච්ඡාවට' දමන Like විනා සත්‍ය විචාර අවධානයක් ගොඩ නොනැඟෙන බවට රහස් ගිවිසුමක් දැන් එළිපිට ඇත.

රුවන් බන්දුජීව, සමිත බී, අටුවබැන්දෑල, රුවන් නෙලූ, රුවන් නන්දික, රුවන් වීරතුංග, කපිල එම්. ගමගේ, ධනුෂ්කා නිෂාධි කුලරත්න, ප්‍රසාද් වීරසිංහ, සුරේඛා සමරසේන, කසුන් මහේන්ද්‍ර හීනටිගල, සඳුන් ප්‍රියංකර විතානගේ, හෂාන් විරංග බඹරබොටුව, ළහිරු කිතලගම, සදර්ශී කුසුම්වර්ෂා රණසිංහ, නිරාශ ගුණසේකර, නුවන් තොටවත්ත, සුසන්ත රණවීර, ජනක ගොඩෙවිතාන, භාතිෂ අකලංක, හෂාන් අබේගුණරත්න

ඉතා ම ඉක්මනින් මතකප්‍රාප්ත වූ මේ නම්වැල ඉක්මනින් ම ලියාගෙන ගියෙමි. මේ සයිබරයේ සිංහල කවිකිවිදියන් අතළොස්සක් පමණි. මගේ මිතුරු ජාලයේ සෘජු ව ම හා ගැවී නොගැවී සැරිසරන අතළොස්සකි. රුවන් බන්දුජීවගේ මිතුරු ජාලයේ අයමවිතර මෙයට වඩා පෘථුල විය හැකි ය. අනෙක් අයට ද එසේ ම ය.

සයිබරය, බුකිය වැනි වදන් මේ අවකාශය නාමකරණයට භාවිත වෙයි. බුකියේ ඉස්සර ජොකියන් සිටිය ද දැන් එහි කවියන් විසීම සතුටට ම කරුණු වේ. සිංහල කවියේ සෞන්දර්ය තැපැල් කන්තෝරුව පුවත්පත් කවි පිටුව පමණක් වූ යුගයේ තිඹිරියාගම බණ්ඩාර, මහින්ද කුමාර දළුපොත, කේ.පී.ඩබ්. ප්‍රියන්ත ජයලත්, එන්.ඩබ්.පී. ලාල්, ලක්මාලි හේවාවසම්, පියංකාරගේ බන්දුල ජයවීර, සාමිනාදන් විමල්, නිලාර් එන්. කාසිම්, දඹෙගොඩ ජිනදාස, පරගම්මන නන්ද, ඊ.එම්.ඩී. උපාලි වැනි කවිකිවිදියෝ කවමුතු, යොවුන් පහන්වැට, පද්මතටාකය ආදියට බහුල ව ලියූහ. මේ ඇතැම් අය මුහුණු පොතට පිවිසි අතර ඇතැම්හු ඊට ප්‍රවේශ වූයේ නැත. ලක්මාලි හේවාවසම්, රුක්ෂිලා වෙත්තමුණි, හෙන්රි වර්ණකුලසූරිය, සුනිල් ගෝවින්නගේ වැනි අය විදේශ ගත ව වාසය කරන බැවින් මේ මග වහා ගත්හ. මංජුල වෙඩිවර්ධන වැන්නෝ විදේශගත කර කොහොමටත් නිහඬ කළ නොහැක්කෝ ම වෙති.

රෝහණ පොතුලියද්ද, ටිම්රාන් කීර්ති, නදුන් යසිත, සුහර්ෂණී ධර්මරත්න, ගැමුණු පී. දසනායක, ඉදුරු ප්‍රසංග, සුනන්ද කරුණාරත්න, විපුලි හෙට්ටිආරච්චි, අනුරාධා නිල්මිණී, ඉසුරු චාමර, සුමින්ද කිත්සිරි, දමිත් සඳනුවන් කීර්ති, ධර්මසිරි ගුණවර්ධන, චූලානන්ද සමරනායක මුහුණු පොතට ගොඩ වන්නේ කලාතුරකිනි. ලක්ශාන්ත අතුකෝරළ, අනිල් නිශාන්ත ලොකුගමරාළ වැන්නෝ නිහඬ වී ඇතිදැයි බිය සිතේ.

පරිගණකය බණවා මෙල්ල කර සිංහල අක්ෂර මගින් සිය කවි සියතින් ම upload කර ගැනීමේ දුෂ්කරතා නිසා ද ඇතැම්හු සයිබරයේ වගා නො කරති. අතින් ලියූ සිංහල කවි Scan පිටපත් ලෙස බුකිගත වෙන අවස්ථා ද ඇත.

Like දැමීම හා Comment (කොමෙන්ටු) දැමීම මුහුණු පොතේ සාමාන්‍ය විචාර-ප්‍රතිචාර පාන අයුර වුව ද ඒවා කිසිවිටෙක පූර්ණ කාව්‍ය විචාර නොවේ. එසේ බාර ගැනීම කවීහු ද නො කරති. ඇතැම් තැනෙක දිගු අදහස් දැක්වීම් කෙරෙයි. මේ ප්‍රතිචාරවල විශේෂය නම් පුවත්පත ලෙස නොව, සමමත හා ප්‍රතිවිරුද්ධ මත එසැණ ආවලියක් සේ දමමින් සංවාදය සජීවී ලෙස ගොඩනැගීමේ ශක්‍යතාව යි. එහෙත්, එම පහසුකම ව්‍යක්ත ලෙස භාවිතයට ගන්නා බවක් ද නොපෙනේ.

මුහුණු පොතේ කවියක් පළ වූ පසු තමතම හිතෛෂීන් දමන like වලින් උද්දාමයට පැමිණියෝ උසස් පල නොලද්දෝ වෙති. එහෙත්, ඇතැම් අංකුර කවියෙකුගේ නව නිර්මාණයක් සඳහා තම සයිබර් ගමන් සගයන් හෝ සමීප පොකුරේ මිතුරු දනව්වට පිටින් ආරාධිත මට්ටමේ වැඩිහිටියෙකු නිර්මාල් රංජිත්, ලියනගේ අමරකීර්ති, බුද්ධදාස ගලප්පත්ති බඳු ශාස්ත්‍රාලයීය සාමාජිකයකු දමන like එක

හෝ කොමෙන්ටුව සුවිශේෂ විවරණයක් සේ හඟින යොවුනෝ සිටිති. එහි වරදක් ද නැත. එබඳු බරපතළකමක් සහිත පරිණත විචාරකයන්ගේ අවධානයට සිය නිර්මාණය පාත්‍ර වීම ම සිය කවියේ කිසියම් මිම්මක් හඳුනා ගැනීමට යොවුන් කවියාට ලැබෙන ඉඟියකි. ගුණදාස අමරසේකර, නන්දන වීරසිංහ, ආරියවංශ රණවීර, රත්න ශ්‍රී විජේසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු, එරික් ඉලයප්පාරච්චි, කුමාර හෙට්ටිආරච්චි බඳු දෙටු කවීන් මුහුණු පොත හා සජීවී ව අදහස් පළ නොකිරීම, සමාජ ජාලා වෙබ් අඩවි සමීප ව ඇසුරු නොකිරීමේ අවාසිය තුරුණු අංකුර කවිකිවිඳියන් වෙත ඇත. එතැන දී ලියනගේ අමරකීර්ති බඳු පරිණත විචාරකයන්ගේ බැලුමසක් පවා ආධුනිකයන්ට මහමෙරකි.

තමාගේ නවකවිය පළ කෙරුමට අමතර ව නූතන ම සිංහල කවිය හා තදන්තර ව බැඳි යථාවත් කේන්ද්‍ර වී ජනිත ඇතැම් සංවාද ද මුහුණු පොත් කවිකලාව මගින් දියත් වී ඇත. ගිලන් ව සිටින ධර්මසිරි රාජපක්ෂ කිවිඳු මුල් වී දිගේලි ව ගිය සංවාදය එබඳු ය. කවියා බලන්නට යාමට තුරුණු කවියෝ ගොනු වූහ. අවකාශ නොලද්දෝ මිතුරු ජාල ප්‍රතිචාර මගින් සිය අදහස්, සංවේග පළ කළහ. තොරතුරු යාවත්කාලීන කර ගත්හ. දිගු කලක් විදෙස්ගත ව සිටි ධර්මසිරිගේ කිවියාව හොඳින් දත් වැඩිහිටි මිතුරෝ ළෙහි අත්ගසාගෙන තොරතුරු Share කළහ. හෂාන් බඹරබොටුව වැනි කවීහු ධර්මසිරි නම් නිහඬ පුරාවත ගැන අලුතෙන් ම කවි ලියූහ.

මුහුණු පොත් කවි පළ වී එහි ක්ෂණික මිතුරු ප්‍රතිචාරවලින් වශී නොවී ඉවසීම හා අනවරත අභ්‍යාසය පුහුණු කිරීමට යොවුනන්ට ඇරයුම් කළ යුතු ය. රුවන් බන්දුජීව, ඉන්දික ගුණවර්ධන, සෞම්‍ය සඳරුවන් ලියනගේ, කසුන් මහේන්ද්‍ර හීනටිගල, ධනුෂ්කා නිශාධී කුලරත්න හා හරිත විශ්වජිත් මනමේන්ද්‍ර

**සිය අනන්‍යතාව සැඟවීම, වෙනත් අනන්‍යතාවකින් හෝ අනන්‍යතා කීපයකින් එකවර පෙනී සිටීම මුහුණු පොතෙහි පහසුකම් ය. මේවා කවියේ දී නම් සුබපල නොදීමට ඉඩ ඇත. ඇතැම් අයගේ කටුක විචාර (විචාර නොවූ) පහර දීම්, අධෛර්යයට පත් කිරීම් අංකුර කවියන් නොමඟ යැවීමට අවකාශ ඇත. (කාව්‍ය විචාර නොවන ක්ෂේත්‍රවල නොහොත් සිංහල බෞද්ධ බව ජාතිකත්ව සංකල්පය බඳු ඉසව්වල පළ කෙරෙන උද්වේගී, පෞද්ගලික (ඔහුට හෝ ඇයට අනුව) සමාජීය ප්‍රතිචාර මෙතැන දී අදහස් නොවේ.) එක ම කවියා ගිණුම් දෙකකින්, නම් දෙකකින් නිර්මාණ ජනගත කර සමාන්තර ලෙස ජීවිත දෙකක පැවැත්ම සාදාගත් අවස්ථා ද ඇත. වර්ග දෙකක කවි එක ම වකවානුවක ලියා විචාර ප්‍රතිචාර වර්ග දෙකකින් ලබා ගනියි. විචාරකයෝ හා රසිකයෝ මුළා වෙති. තමාට තමාගේ අනන්‍යතාව යළි යළි ප්‍රතිසම්මුඛ කරගත හැකි මේ සයිබරය අනන්‍යතා වංකගිරියකි.**

වැන්නෝ සයිබරය මගින් රසික පදනමක් සඳාගෙන සිය මංගල කවිපොත ජනගත කළහ. බන්දුජීව ලද සාර්ථකත්වය හැමට ම ලද නොහැක. එබැවින් ඉවසීම, වරණය හා යළිදු ඉවසීම අවශ්‍ය ය. කවි කල් දැමිය යුතු ය. නඩු කල් දමනවා සේ ය. සියලු උපමා, රූපක, ශබ්ද ධ්වනි ඇතුළු ආනුෂංගික සාක්ෂ්‍යකරුවන්ට

කවියාගේ සන්තානය නම් අධිකරණයේ තවත් තෙමසකින් පසු පෙනී සිටීමට අණ කළ යුතු ය.

මුහුණු පොත යනු යාන්ත්‍රික ප්‍රතිනිෂ්පාදනයේ විස්මිත ම අවධියකි. (වෝල්ටර් බෙන්ජමින් ගෞරවයෙන් සිහි කරමු.) එක් මිතුරු කොමෙන්ටුවක් ඊළඟ මිතුරු ජාල වෙත එසැණ පැතිරේ. එක් අයෙකු Share කළ විට ස්වයංසිද්ධ ව විශාල පිරිසක් කරා පැතිරේ. මෙබඳු පහසුකම් නොතිබි යුගයක එම සීමාසහිත බව ම ඇතැම් විට ආශීර්වාදය විය. පිටපත් බෝ වීම ආලෝක ප්‍රවේගයෙන් සිදුවීම ඇතැම් විට ඉවසීම, තැන්පත් බව අහිමි කරවන්නක් ද විය හැකි ය. කවිය නම් ක්ෂේත්‍රයේ ආවේණික හුදකලාව අහිමි කරන යථෝක්ත තාක්ෂණික පැවැත්ම පිළිබඳ කවියා ද විචාරකයා ද විවේක බුද්ධිය යෙදවුව මනා ය.

අපේ සරසවි අධ්‍යයන අවධියේ හිරු, නිදහස, ගිනිසිළුව ආදී පුවත්පත්වල කවි පිටු හරහා නිතර ඇවිද ගියෙමු. එහෙත්, අපේ කවියක් දිවයින කව්මුතු තීරයේ හෝ රාවය පද්ම තටාකයේ පිපුණු දවස් අතිශය විරල විය. කව්මුතු යනු එකල කවියේ අමාරු ම කඩඉම යි. එහි කවියක් පළ වීම අපට නම් නියත විවරණ ලැබීමකි. මුහුණු පොතේ ද එබඳු චර්යාවක් සැඟ ව ඇත. එනම් බූන්දි වෙඩ් අඩවියට උසස් වීමක් ලැබීම යි. බූන්දිය යනු සයිබරයේ කව්මුතු තීරය යි. 'ඒක ටිකක් අමාරු' බව බුකියේ ජනයා දනිති. මෙම අමාරු බව යනු තෝරා ගැනීම යි. වරණය යි. දුලබ බව යි. මගේ අදහස නම් සයිබරයේ බූන්දිය හෝ ඊටත් වඩා ව්‍යක්ත ප්‍රමිතිගත කවි කඩයිම් පවත්වාගත යුතු ය. සයිබරය නියාමනය කළ යුතු ය.

සිය අනන්‍යතාව සැඟවීම, වෙනත් අනන්‍යතාවකින් හෝ අනන්‍යතා කීපයකින් එකවර පෙනී සිටීම මුහුණු පොතෙහි පහසුකම් ය. මේවා කවියේ දී නම් සුබපල නොදීමට ඉඩ ඇත. ඇතැම් අයගේ කටුක විචාර (විචාර නොවූ) පහර දීම්, අධෛර්යයට පත් කිරීම් අංකුර කවියන් නොමග යැවීමට අවකාශ ඇත. (කාව්‍ය විචාර නොවන ක්ෂේත්‍රවල නොහොත් සිංහල බෞද්ධ බව ජාතිකත්ව සංකල්පය බඳු ඉසව්වල පළ කෙරෙන උද්වේගී, පෞද්ගලික (ඔහුට හෝ ඇයට අනුව සමාජීය ප්‍රතිචාර මෙතැන දී අදහස් නොවේ.) එක ම කවියා ගිණුම් දෙකකින්, නම් දෙකකින් නිර්මාණ ජනගත කර සමාන්තර ලෙස ජීවිත දෙකක පැවැත්ම සාදාගත් අවස්ථා ද ඇත. වර්ග දෙකක කවි එක ම වකවානුවක ලියා විචාර ප්‍රතිචාර වර්ග දෙකකින් ලබා ගනියි. විචාරකයෝ හා රසිකයෝ මුළා වෙති. තමාට තමාගේ අනන්‍යතාව යළි යළි ප්‍රතිසම්මුඛ කරගත හැකි මේ සයිබරය අනන්‍යතා වංකගිරියකි. අවසානයේ 'එබඳු කවියෙකු' හෝ 'එබඳු විචාරකයෙකු' ද සත්‍ය ලෙස ම නොසිටිය හැකි ය. බය යනු එය ය. සිම්යුලේෂණ මරු කතරක් ව ඇති මුහුණුපොත් කවිය සාධනීය වැඩබිමක් කර ගැනීමේ වගකීම ඒ පහසුකම් විඳින්නෝ ම සතු ය. කෙසේ වුව ද නූතන ම සිංහල කවියේ මුහුණුපොත් අවධිය මග හැර යා නොහැකි ය. එය එහි ධාරක සමය අවසන් කර නව යොවුන් වියට පියවර ඔසවමින් සිටියි. සතුට යනු එය ය.



**ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි**

*සබරගමු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. සිනමා, සාහිත්‍ය කලා විචාරකයෙකි. ලේඛකයෙකි.*

# ලංකා පොකුණ

ලංකාවේ හැඩය ගත් පොකුණක් ය උයන් තෙර
ඈ සමඟ පෙම් සිහිනයක් දුටුව තැනකි මේ
ඒ කිසිදු දිනෙක අප නොදුටු දසුනක් ය අද
පුතුගෙ අත ගෙන පැමිණ විඳින්නේ මා මෙතන

පොකුණ මැද වතුර මල පිහිටි සමනොළ ගිරෙන්
නොවිසිරේ මල් වතුර සිව් දිගට සම විලස
පල් වතුර සැදූ සෙවලෙ නිල් මහනෙලක් පමණි
නව දියක් ඉල්ලමිනි සියල් සලකුණු ම මෙහි

දණ වටක් බැස දියේ පොකුණ සෝදයි යමෙක්
නාදන් ය ඔහු තව ම සේවකය උයනෙහි ම
රිවි තැවුලෙ මැළ මලක් මා පුතුට ගෙනත් දී
ඒ සිනාවෙන් තුටු ව උරයි ඔහු බීඩියක්

වැඩි දැනුම අවැසියෙන් පුතුගෙ පාසල් වැඩට
ලංකා සිතියම දකින සැරිසරකි පොකුණ වට

බොකු, කලපු ළඟ අහෝ! දුක් ගෙන ය සුදු කොකුන්
වරින් වර අහස් විමනින් බසිති පිළිහුඩුන්
නාගදීපෙට ඇදෙන දිය නයෙකි යාපනේ
ගෙඹි වීර ගී ඇසෙයි දිවි ගැලව ගඟ දෙසින්

තාත්තේ! තාත්තේ! අපි දිනූ තැන කොතැන
හමුදාවෙ මාමලා කොටි නැසූ තැන කොතැන
කලපුවේ ඔබ ඔබා කොඩි ගැසූ තැන කොතැන
විමසමින් පුතු සොයයි නන්දිකඩාල් ලකුණ

අතරමං වී සෙදින් බැලුණි වටපිට එවිට
එ දෙස වෙත සුරත පෑ නාදන් ය පොකුණ මැද
සියල් ආගම් පිදෙන සාදු සමනොළ බඳෙයි
කළු සෙවල සූරමින් ඔහු තවම පොකුණෙ වැඩ



සුමින්ද කිත්සිරි
ගුණරත්න

තරුණ කවියෙකි. චක්කරං කොටුව (1996), ඇහැළි (2000), නා රජ සහ වේ රජ (2010) යන කාව්‍ය සංග්‍රහයන් ද, ජී.බී. සේනානායක කාව්‍ය විමර්ශන (2001) සහ ආරියවංශ පතිරාජ ප්‍රතිරාව (2008) නම් විචාර ග්‍රන්ථ දෙකක් ද ලියා පළකොට ඇත. මෙහි පළ වන්නේ ඔහුගේ නවතම කාව්‍ය සංග්‍රහය 'ලංකා පොකුණ' පොතෙහි කවි පෙළකි.

# ජඩ සාහිත්‍යය හා සම්භාව්‍ය සාහිත්‍යය

සිංහල සමාජ සම්ප්‍රදායන් වෙනස් කිරීම උදෙසා වෙහෙසුණ මිෂනාරීන් ආගමික සාහිත්‍යයක් මෙන්ම ජන සාහිත්‍යයක්ද ගොඩනැංවීමට වෙහෙස දරා තිබේ. ආගමික සාහිත්‍ය රටවැසියා දිනා ගැනීමටය. ජන සාහිත්‍ය නිර්මාණ සිංහල සමාජ සම්ප්‍රදායන් උපහාසයට හා අවමානයට ලක් කිරීමේ ජඩ පරමාර්ථයකිනි. එම ජඩ සාහිත්‍ය ව්‍යාපාරය වර්තමාන අවධියේ සම්භාවනීය සාහිත්‍ය ව්‍යාපාරයක් බවට පත් වී තිබේ.

සිංහල ජනකථා, ජනප්‍රවාද, ප්‍රස්තාව පිරුළු, උපමා ලෙසින් අප සලකන ජනශ්‍රැති රාශියක ප්‍රබන්ධකයින් සිංහලයින් විය නොහැකි යයි සිතීමට අනුබල දෙන සාක්ෂ්‍යයෝ බොහෝය. මේ ජනශ්‍රැති සිංහල සමාජය හෝ සමාජ සංස්ථා අවමානයට ලක් කිරීම ආත්මකොට උපන් ඒවා වෙති. ඒවා පැරණි සාහිත්‍යයේ දක්නට නොලැබේ. පුරාණ සිංහල ගම්මානවල පැතිරී නැත. ඉංග්‍රීසි ආණ්ඩුවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලාවන්හි කියවීම් පොත්වල දක්නට පුළුවන. වඩාත් ජනප්‍රිය වී භාවිත කෙරුවන් යටත් විජිත ආණ්ඩුවේ අධ්‍යාපනය ලැබූ ගුරුවරුන් හා උගතුන්ම වෙති.

මෑත කාලීන නාට්‍ය රචකයින්, ප්‍රබන්ධ කතාකරුවන් ප්‍රයෝජනයට ගත් මහදැනමුත්තා සහ ගෝල පිරිසගේ කතා කීපයකි. 1987 නොවැම්බර් කල්පනා සඟරාවෙහි ආචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා පැවැත්වූ කතාවක සම්පිණ්ඩනයක් ඇත. එහි මහදැනමුත්තා කතා ගැනද විස්තරයක් ඇතුළත් වේ.

"අපේ බහුශ්‍රැත පඬිවරයෙකු වන අතිගරු එඩ්මන්ඩ් පීරිස් බිෂොප්තුමා මහදැනමුත්තා ගැන පර්යේෂණයක් කරල තිබෙනව. එතුමාගේ අදහසේ හැටියට මහදැනමුත්තා ලංකාවේ කෙනෙකු නොවෙයි. ඉන්දියාවේ මහගුරුවින් කතා අනුසාරයෙන් මහදැනමුත්තාගේ කතා බිහි වූ වගයි කියවෙන්නේ. නමුත් පින්ලන්තයේ ළමා පොත් ආයතනයේ විශ්ව ළමා කතා සූචිය පෙරළා බැලුවම ඒ වගේ කතා තවත් බොහෝ රටවල තිබෙන බව දැන ගන්ට ලැබෙනව. උදාහරණයක් වශයෙන් මහදැනමුත්තාගේ කතා ස්වායිහිලී රටේත් තිබෙනව. නමුත් ඒ ඒ රටවල කතාවල වෙනස්කම් ඒ ඒ සංස්කෘතිය

හා පරිසරය අනුව සිදු වුණත් මූලාශ්‍රය එකමයි. ඒ පොදු උරුමය දනවන ජනශ්‍රැතියයි."

දැන් මහදැනමුත්තාගේ කතා ලංකාවේ පැතිරවූ කාලය නිරවුල් කර ගත යුතුය. ඉංග්‍රීසීන් ලංකාව යටත් කර ගන්නා කාලයේ ලංකාවේ ගම් පාලනය වූයේ ගම්සභා නමැති ප්‍රජාතන්ත්‍රීය ආයතන මගිනි. මේවායේ ආකෘතිය පැහැදිලි කිරීමට ජෝන් ඩොයිලිගේ පටන් මෑතකාලීන සමාජ විද්‍යාඥයින් දක්වා බොහෝ උගතුන් වෙහෙසී ඇත. III උදය රජුගේ සෙල්ලිපියකින් සාක්ෂි දක්වන මහචාර්ය සෙනරත් පරණවිතාන මහතා ගම්සභාව ලිච්ඡවි කාලයේ පැවති අෂ්ඨකුලක සභාවට සමාන බවක් පෙන්වයි. පෝල් ඊ. පීරිස් මහතා විදානේ, ගණකයා, මහන්නා, ලියන්නා හා උණ්ඩියාගෙන් සැදුම් ලත් ඉන්දියාවේ පංචායත් ආයතනවලට සමාන කරයි.

සිංහල ගම්සභාව හඳුනා ගැනීමට හොඳම සාක්ෂිය යටත්විජිත කාලයේ පවා නුවර කලාවිය ආදී පෙදෙස්වල හුදකලා වනාන්තර ගම් පාලනය වූ තොවිල් පහ විභාග කිරීමයි. තොවිල් පහ යටතේ ගම් පාලනය කර ගත් අවසාන ගැමි පරපුරේ කිහිප දෙනෙක් තවමත් ජීවත් වෙති. තොවිල් පහට අයත් වූවන් පන්සලේ හාමුදුරුවෝය, වෙදාණෝය, විල්ලඹුආතාය, හේන මාමාය, වතුරමංකඩය.

සිංහල ගම්සභාවේ ආකෘතිය හඳුනා ගත් පසු මහදැනමුත්තා කතා ගොතා ඇත්තේ කවුරුන් නිරූපණය කිරීමටදැයි පැහැදිලි වේ. ඉංග්‍රීසි ආණ්ඩුවේ පාලනයට හිසරදයක් වූයේ ගමයි, ගම්සභාවයි.

නිෂ්පාදනය සිදු වූයේ ගමෙනි. ගොවිතැන ප්‍රධාන විය. ගොවිතැන් කටයුතුවලදී ගමට නායකත්වය දුන් බහුශ්‍රැතයෙක් වූයේය. එතුමා ගමරාල නමින් හැඳින්වුණි. එබැවින් ගමරාල නින්දාවට හා හාස්‍යයට ලක් කිරීම අර්ථසහිත කාර්යයකි. ගමයා බෙල්ලේ වැල දා ගත් හැටි, ගම හාමිනේගේ කැකිරි දොළදුක, ගමයා සිල්ගත් හැටි, ගමයාගේ පියවර මැනීම, නපුරු මන්තරය ආදී ලෙසින් මෝඩ ගමරාල ගැන කියැවෙන කතා ගණනාවක් ප්‍රබන්ධ කර තිබේ. මේ කතාවල නායකයා ගමරාල හෙවත් ගමයා කරන්නේම තකතීරුකම්ය. ඔහු බියසුල්ලෙකි. ඔළමොට්ටලයෙකි.

ගම සැදුණේ ශිල්පීය ශ්‍රේණි ඒකාබද්ධ වීමෙනි. ශ්‍රේණි නායකත්වයෙන් ගම්සභාව සැදුණි. ශිල්පීය ක්‍රමය කුල භේදයක් බවට පෙරළූ ජඩ සාහිත්‍ය ප්‍රබන්ධකයින් ගමට උසස් මෙහෙයක් කළ කුල නායකයින් නින්දාවට ලක් කළෝය. ගමෙන්ම බුලත් හුරුලූ ලබන රිදී නැන්දාව හා ගමරාලව සිනාවට ලක් කිරීම සඳහා ගොතා ඇති ගමරාල දිව්‍ය ලෝකයට ගිය හැටි කතාව නිදර්ශනයකි. කුල භේද කර ඒ ඒ ශ්‍රේණීන්ට ගැරහුම් කරන උපමා ආප්තෝපදේශ කොතරම් වපුරා ඇත්ද?

යුරෝපය හා යුරෝපීයයන් උතුම්ය, ආදර්ශවත්ය යන චින්තනය පැතිර වීම ජඩ සාහිත්‍ය ව්‍යාපාරයේ මීළඟ පරමාර්ථයයි. සුද්දගෙ වැඩ වගේ, සුද්දගෙ වෙලාව වගේ, සුද්දගෙ නීතිය වගේ කියුම්වලින් ධ්වනිතවත් වූයේ යුරෝපීයාගේ ඍජු සහ අවංක භාවයයි. සිංහලයාගේ වැඩ, සිංහලයාගේ වෙලාව එහි විරුද්ධාර්ථයයි. සිංහලයා මෝඩයා කැවුම් කන්න යෝධයා විය. ගමේ වැලේ මල් ගෙඩි හැදෙත්දිත් පාටට, යසට, සැදුණේ රට ඒවායෙහිය. අනික්වා එළ හෝ සිංහලයි.

කළු පැහැය මරණයේ සංකේතය වූයේ යක්ෂයා කළු පාටයයි යුරෝපීයයා ඇඳුනූ නිසාය. උපදින සිංහල දරුවන් සුදු පුතාලා, සුදු බබාලා කියමින් සුරතල් කළ යුතු වූයේය. අදත් කතෝලිකයින් මළවුන් වෙනුවෙන් ශෝක වීම උදෙසා කළු රෙදි හඳිති. බැනර්වල ආර්.අයි.පී. අකුරු ලියන්නේ කළු පාටිනි. වර්ණභේදය හෙවත් කළු පහත් කොට සැලකීමෙන් ඉවත ලෑමට සිදු වූ ජනකවි, දරු නැළවිලි ගී රාශියකි.

ජඩ සාහිත්‍ය ව්‍යාපාරයේ ප්‍රතිඵලය වූයේ සිංහලකම නින්දාවක් ලෙස සලකන්නන් රැළක් රට වැසියන් අතරින් බෝවීමයි. මොවුන්ගේ නිවෙස්හි මෙහෙකරුවන් බණ්ඩලා වූහ. මෙහෙකාරියන් මැණිකලා වන්හ. පංතියක් වශයෙන් සංවිධානය වූ මොවුන් පරගැති අර්ථක්‍රමයක්, සමාජ ක්‍රමයක් රටේ තහවුරු කළෝය. ඊට අනුබල දෙන අධ්‍යාපනයට රටම ගොදුරු කළෝය.

පරගැති අධ්‍යාපනයේ විපාක වශයෙන් සිංහලකම නුරුස්සන ජඩ උගතුන් ඇති වුණි. මොවුන්ගෙන් සමහරෙක් සරසවි ඇදුරන් වූහ. සාහිත්‍යකරණයට බටහ. නාට්‍ය, චිත්‍රපටි හා ජනසන්නිවේදන හසුරුවන්නන් ආදී ලෙසින් විවිධ තනතුරු අරක් ගත්හ. තවත් සමහරෙක් විදේශීය අධ්‍යාපන ආයතනවල රැකියා ලැබ ගියෝය.

මේ හැම සුද්දන් මෙන් ජීවත් වීමට ප්‍රිය කරන පිරිසකි. ඔවුන්ගේ අඩුවැඩි ලෙසින් පිහිටා ඇති හැසිරීම් ලක්ෂණ කිහිපයකි. මුදලට ගිජු වෙති. සුඛෝපභෝගී භාණ්ඩවලට කෑදරය. යුරෝපයේ විසීම, විදේශීය සංචාරය පරම සැපක් ලෙස සලකති. අඹුවන් පාවා ගැනීම උදෙසා ආත්මය වුවත් පාවා දීමට පසුබට නොවෙති.

ජඩ උගතුන්ගේ සාහිත්‍ය ව්‍යාපාරය ආරම්භ වූයේ බටහිර සාහිත්‍ය විචාර, සාරධර්ම උසස් බැව් රට පුරා පතුරුවාලීමේ ව්‍යාපාරයකිනි. ඊට නම් යටත්විජිත භාවයෙන් නිදහස ලබා ගැනීම උදෙසා ජනතාව පුබුදු කළ කවීන්, ලේඛකයින්, නාට්‍යකරුවන්, දේශප්‍රේමීන්, ජාතික වීරයින්, නූගතුන් බවට පමුණුවාලිය යුතු වූයේය. සිංහලයින්ගේ වංශකතා ගජබින්න බවට තර්ක පෑවෝය. සිංහල සංස්කෘතිය, සාරධර්ම, බෞද්ධ ගුණධර්ම අවඥාවට හෝ හාස්‍යයට ලක් කිරීම සඳහා ඉදිරිපත් වූවෝය.

ලංකාව නව යටත්විජිතයක් වීමට පුල පුලා කටයුතු කරන විදේශීන් මෙහෙයවන සංවිධාන ජඩ උගතුන්ව පෝෂණය කරති. ආත්මාර්ථකාමී දේශපාලනඥයෝ ඔවුනට සම්මාන, ප්‍රශංසා, පලඳවන්නෝය. ජඩ උගතුන් පෙරහැර ඉදිරියට පැන කස පුපුරවන්නන් අයුරින් සිංහල ජාතියට නින්දා කරති. ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධයින් වර්ගවාදීහු වෙති. ගෝත්‍රවාදීහු වෙති. පැසිස්ට්වාදීහු වෙති යයි විදේශිකයින්ට පැහැදිලි කර දීම සඳහා ලිපි ප්‍රබන්ධ රචනා කරති.

විදේශීය ආධාර ලබන මිත්‍ර සංගම්, සංස්කෘතික සංවිධාන, ආගමික කේන්ද්‍ර, සම්මන්ත්‍රණ කව, ආයතන හතු පිපෙන්නාක් මෙන් බිහි වී ඇත. ඒවායින් උත්තේජනය ලැබූවෝ පොත්, සඟරා ප්‍රසිද්ධ කරති. ලංකාවේ විදේශීය උරුමය ගැන පර්යේෂණාත්මක ලිපි සකස් කරති. සුළු ජාතිකයින්ට යුක්තිය, සාමය, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ලබා දීමේ සටන් පාඨ සෙවණේ ආරූඪ වූ කපුවෝ පරිද්දෙන් අඩවි අල්ලති.

බ්‍රිතාන්‍යයින් ලංකාවේ පුරා වස්තු විනාශ කිරීම වැළැක්වීම සඳහා ආඥා පනත්, නීති සෑදුවෝය. ඒවා නොතකන්නවුන්ට සුළු දඬුවම් ද ලැබිණ. එනමුත් බ්‍රිතාන්‍යයෝ ලංකාවේ නිදහස හා සිංහල ජාතියේත්, බුද්ධ ශාසනයේත් ආරක්ෂාව වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ඓතිහාසික වීරයින්ගේ, ජාතික නායකයින්ගේ චරිත ඝාතන කරන්නවුන්ට උගතුන් ලෙසින් සලකා සම්මාන පුද කළෝය. මේ නිසා ඉතිහාසය තැනූවන් විනාශ කිරීමේ නිදහස ශ්‍රී ලංකාවේ තිබේ.

**කොලට් සේනානායක**

*(1988 ජනවාරි 'කාලය' සඟරාවෙනි.)*



# අසිරිමත් කළු කිවිඳිය මායා ඇන්ජලෝ

මායා ඇන්ජලෝ (මාගරට් ඇනී ජොන්සන් 1928.04.04 - 2014.05.28) ඇමෙරිකාව තුළ සිවිල් අයිතිවාසිකම් අරගල දියත් වූ, වියට්නාම් යුද්ධයට එරෙහි උද්ඝෝෂණ ඇමෙරිකාව හා යුරෝපය පුරා පැතිර ගිය විසිවන සියවස මැද භාගයේ දී සමකාලීන කළු බුද්ධිමතුන්ගේ හා කලාකරුවන්ගේ ගමන් මඟ පිළිබිඹු කළ අසිරිමත් චරිතයයි. ඕ සම්මානනීය කිවිඳියක්, ලේඛිකාවක්, ඉතිහාසඥවරියක්, සිනමා ශිල්පිනියක්, නාට්‍ය ශිල්පිනියක්, ගායිකාවක්, රංගන ශිල්පිනියක්, ගුරුවරියක් හා සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකාරිනියක් ද වූවාය. සමේ වර්ණය හා සම්භවය නිසා වෙනස්කොට සලකනු ලැබීම, අන්ත දුගීභාවය හා ප්‍රචණ්ඩත්වය අභිභවමින්, සාම්ප්‍රදායික අප්‍රිකානු-ඇමෙරිකානු පවුල තුළ සුරැකුණු අගයන් හා විශ්වාසයන් උකහා ගනිමින් සුබවාදී ආකල්පයකින් හා ආදරයෙන් ජීවිතය හා ලෝකය දුටු, ප්‍රෝත්සාහී වීර චරිතයකි.

I Know Why the Caged Bird Sings නම් වූ, ඇයට ඉමහත් කීර්තියක් අත්කර දුන් පොතෙන් ඇරඹී ඇගේ තවත් පොත් හතරක්: The Heart of

a Woman, Gather Together In My Name, Singing and swingin and Getting Merry Like Christmas සහ All God's Children Need Travelling Shoes පුරා ලියැවී ඇත්තේ ඇගේ ජීවිතයයි. ඒ හැරුණු විට ඇය පද්‍ය සංග්‍රහයන් ගණනාවක් ද ළමා පොත් ද ලියා පළකොට ඇත.

ඇගේ ගද්‍ය මෙන්ම පද්‍ය බස ද ගීතවත්ය. රූපකාර්ථවලින් පිරී ඇත. එහෙත්, බැලූ බැල්මට එය ඉතාමත් සරල සාමාන්‍ය කටවහරයි.

දහතුන්වැනි වියේ දී ශිෂ්‍යත්වයක් ලැබ සැන් ෆ්‍රැන්සිස්කෝ නුවර කම්කරු පාඨශාලාවෙන් නාට්‍ය හා රංග කලාව හදරන ඇය පාසල් ජීවිතයට සමු දෙන්නේ ප්‍රථම අප්‍රිකානු-ඇමෙරිකානු කේබල් රථ නියාමකවරිය ලෙස රැකියාවක් ලබමිනි. ගැටවර වියේදීම මවක් වන ඇය සිය දරුවා පෝෂණය කිරීම පිණිස ආපනශාලා සේවිකාවක ලෙස ද, කෝකිවරියක ලෙස ද වැඩ කරයි. එහෙත්, සංගීතයට, නැටුමට, රඟපෑමට හා කවියට ඇති ඇල්ම හා උවමනාව ඇය අත් නොහරියි.

1954-1955 දී Porgi and Bess ගීත නාටකය නිෂ්පාදනය කරන ඇය නාට්‍ය කණ්ඩායම සමඟ යුරෝපයේ සංචාරයක යෙදෙයි. සුප්‍රකට නූතන නැටුම් ශිල්පිනියක වූ මාර්තා ග්‍රෙහැම්ගෙන් නැටුම් ඉගෙන ගැනීමට ද ඇයට අවස්ථාවක් ලැබේ. රූපවාහිනී නාට්‍යවල ද පෙනී සිටියි. ඇගේ ප්‍රථම ගී ඇල්බමය වන 'කැලිප්සෝ ලේඩි' නිකුත් වන්නේ 1957 දීය. ඉන් පසු නැවත නිව්යෝර්ක් නුවරට පැමිණෙන මායා ඒ වනවිට විප්ලවීය නිර්මාණ එළි දක්වමින් සිවිල් අයිතිවාසිකම් අරගලයට සම්බන්ධ වී සිටි කළු ලේඛකයන් සමඟ එකතු වෙයි. ප්‍රංශ නාට්‍යකරුවකු වන ෂා ෂෙනේගේ (Jean Jenet) 'කල්ලෝ' නාට්‍යයේ ද, Cabret for Freedom නාට්‍යයේ ද රඟපාන්නට ඇයට අවස්ථාවක් ලැබෙයි. නවසිය හැට වසරේ දී ඇය ඊජිප්තුව බලා යන්නේ කයිරෝ නුවර The Arab Observer පුවත්පතේ කතුවරිය ලෙස වැඩ භාර ගැනීමට වුවද එම තාවකාලික පත් වීමට සමු දෙමින් ඕ ඊළඟ වසරේ දී ඝානාව බලා පිටත් වෙයි. ඝානා සරසවියේ සංගීත හා නැටුම් අංශයේ

ගුරුවරියක ලෙස සිය ගැටවර සිසු-සිසුවියන්ට ශිල්ප දෙනවිට මුලදීම ඇය දුන් උපදේශය වූයේ, "කියවන්න. හඬ නඟා කියවන්න. ඔබ කියවන දෙයෙහි ස්වරය, ගීතවත් බව, අරුත ඔබේ ආත්මයට ඇතුළු වන තුරු කියවන්න" කියාය. අසා සිටින්නන් ඇද බැඳ ගැනීමේ ගැඹුරු, හැඟීම් මුසු, කාව්‍යමය බසක් ඇය සතු විය. උපමා රූපකවලින් පිරි, ප්‍රබල ගීතවත් භාෂා ශෛලිය ඇයට උරුම වූයේ බයිබලය කියවීමෙනි. ඉංග්‍රීසි බසෙහි ප්‍රබල බව හා සුන්දරත්වය පිළිබඳ ඇගේ උදාහරණ ද බයිබලයයි.






ගුරුවරියක ලෙස පත් වීමක් ලබන ඇය, ඒ අතරම කළු ජනයාගේ විප්ලවීය සඟරාවක් ලෙස ප්‍රකට The African Review හි විශේෂාංග කතුවරිය ලෙස ද කටයුතු කරයි. The Ghanian Times පුවත්පතට ද ලිපි සපයයි.

එතෙර ගත කළ කාලය තුළ ඇය ප්‍රංශ, ස්පාඤ්ඤ, ඉතාලි, අරාබි හා අප්‍රිකානු 'පැන්ටි' භාෂාව ද හැදෑරුවාය. 'අප්‍රිකානු-ඇමෙරිකානු සමඟිය' නමින් සංවිධානයක් පිහිටුවා ගනිමින්, වාර්ගික එදිරිවාදිකම් තුරන් කිරීම සඳහා ජීවිතය කැප කළ මැල්කම් එක්ස් (Malcom X) ඇයට මුණ ගැසෙන්නේ ඝානාවේදීය. ඔහුගේ සංවිධානයට සහය වීම පිණිස ඇය නැවත අමෙරිකාව බලා පැමිණෙන්නීය. ඇමෙරිකාවට පැමිණි නොබෝ දිනකින් මැල්කම් එක්ස් බිහිසුණු ලෙස ඝාතනය කෙරේ.

අප්‍රිකානු-ඇමෙරිකානු සංවිධානය විසිරී යයි. කළු ජනයාට සිවිල් අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කළ මාටින් ලූතර් කිං ඇගේ සහයෝගය අපේක්ෂා කරන්නේ ඔහුගේ සංවිධානයෙහි සමායෝජකවරියක ලෙස කටයුතු කිරීමටය. ඇගේ හතළිස් වන උපන් දිනය යෙදෙන්නේ ද මාටින් ලූතර් කිංගේ ඝාතනය සිදු වන්නේ ද එකම දිනයකදීය. ඝාතනයෙන් අතිශයින් කම්පනයට පත් වුව ද, කළු ජනයාගේ සිවිල් අයිතිවාසිකම් සඳහා කළු ජනයා ගෙන ගිය අරගලයෙන් ඕ ඉවත් නොවුණාය.

ඇයට ඉමහත් කීර්තියක් ගෙන ආ ස්වයං චරිතාපදානය ඇය ලියන්නට පෙලඹෙන්නේ ඉන් පසුවය. I Know Why the Caged Bird Sings ඇගේ ළමා කාලයේ ජීවිතය මෙන්ම නිදහස සඳහා අරගල කරන කළු ජනයාගේ කතාවය. Caged bird හෙවත් කූඩුවේ ලූ කුරුල්ලා වහලාය. කුරුල්ලා ගී ගයන්නේ, නොඑසේ නම් කළු මිනිසා අරගල කරන්නේ සමාන ලෙස සලකනු ලැබීම හා නිදහස සඳහාය. ලිවීමට ඇය දිරි ගන්වන්නේ සුප්‍රකට අප්‍රිකානු-ඇමෙරිකානු ලේඛක ජේම්ස් බෝල්ඩ්වින්ය.

මිය යනවිට ඇගේ නමින් පළව තිබුණු ගද්‍ය හා පද්‍ය නිර්මාණ සංඛ්‍යාව තිහකට වැඩිය.

ඕ ඇමෙරිකානු සමාජය තුළ ගෞරවයට පාත්‍ර වූ කාන්තාවකි. ජනාධිපති හෙන්රි ෆෝඩ් විසින් ඇය ඇමෙරිකානු විප්ලවයෙහි ද්විශතවාර්ෂික කොමිසමේ සාමාජිකාවක ලෙස පත් කරන ලද අතර, ජනාධිපති ජිමී කාටර් යටතේ ඇය ජාත්‍යන්තර කාන්තා වර්ෂය පිළිබඳ අන්තර්ජාතික කොමිසමේ සාමාජිකාවක වූවාය. ජනාධිපති ක්ලින්ටන් එම තනතුරේ ප්‍රථම වරට දිවුරුම් දුන් උත්සවයේ දී, ඔහුගේ ඉල්ලීම පරිදි ඇය විසින් පබඳා ඇය විසින්ම කියවනු ලැබූ 'On the pulse of morning' නම් දීර්ඝ පද්‍යය ලොව පුරා ප්‍රශංසාවට ලක් විය. වසර 2008 දී ලින්කන්

පදක්කම ප්‍රදානය කරනු ලැබීමෙන් බුහුමනට පාත්‍ර වූ ඇයට ඇමෙරිකානු පුරවැසියෙකුට ලැබෙන ඉහළම සම්මානය වන 'නිදහස පිළිබඳ ජනාධිපති සම්මානය' ජනාධිපති බැරැක් ඔබාමා විසින් ප්‍රදානය කරන ලදි. මේ හැරුණු විට ඇමෙරිකාව පුරා උසස් විද්‍යාස්ථාන මගින් ඇයට ප්‍රදානය කර ඇති ගෞරව උපාධි ගණන පනහකට අධිකය.

මායා ඇන්ජලෝ ජීවිතය මැදින් හමා ගිය සෑම සැඩ කුණාටුවක්ම මඳ සුළඟක් මෙන් සැහැල්ලුවෙන් වැළඳ ගත් ස්ත්‍රියකි.




ඇමෙරිකාවේ මිසුරි ප්‍රාන්තයේ සැන්ට් ලුවිස් නුවර දී බේලි ජොන්සන් හා විවියන් බැක්ස්ටර් යන කළු දෙමහල්ලන්ගේ දෙවන දරුවා ලෙස උපත ලද ඇයට සිටියේ වැඩිමහලු සොහොයුරෙකු පමණි. ඔවුන්ගේ මුත්තණු මිත්තණියෝ බටහිර අප්‍රිකාවේ සිට යදමින් බැඳ, නැව්වල පටවා කපු වතුවල වැඩට ගෙන ආ වහල්ලුය. අවාසනාවන්ත ලෙස මවුපියන්ගේ විවාහය දෙදරා යෑමෙන් පසු, පියාගේ මිත්තණිය වෙත දරුවන් දෙදෙනා යැවෙන විට මායාගේ වයස අවුරුදු තුනකි. පියාගේ මව, මුනුපුරන් ප්‍රතික්ෂේප කරමින් ඔවුන් හරවා යැව්වාය. ඔවුහු මව වෙත ගෙන එන ලදි. මව අසල්වැසි කළු ජනයා සඳහා සිල්ලර වෙළෙඳසලක් පවත්වාගෙන ගියාය. ඒ යුගයේ දී කල්ලන් හා සුදු මිනිසුන් එකිනෙකාගෙන් කොතරම් දුරස්ව වෙන්ව ජීවත් වුණා ද යත් මිසුරි වැනි දකුණේ ප්‍රාන්තයක දී කළු දරුවෙකුට, දැරියකට සුදු මිනිසෙකු දැකීම අහම්බයක් විය.

සත් හැවිරිදි වයසේ දී සිය මවගේ පෙම්වතාගෙන් දූෂණය වන මායා, බියෙන් එය රහසක් ලෙස තබා ගැනීමට වෑයම් කළ ද, වැඩිහිටියනට රහස හෙළි වීමත් සමඟ දූෂකයා රහසේම මරණයට පත් වෙයි. සිය හෙළිදරව්ව මිනිසකුගේ මරණයට හේතු වීය යන සිතුවිල්ලෙන් කම්පනයට පත්ව ගොළු බවට පත්වන දැරියට නැවත කථන හැකියාව ලැබෙන්නේ වයස අවුරුදු දහතුනේදීය. ගොළු වී සිටි මෙම වසර කිහිපයේ දී ඇය පොතපතට බෙහෙවින් නැඹුරු වූවාය.

නිවසේ එකම පොතක් පතක් නැති වුව ද, ඇය ප්‍රදේශයේ පුස්තකාලයෙන් පොත් ලබා ගෙන කියවූවාය. ශේක්ස්පියර්ගේ නාට්‍ය කියවීමට ඇය අතිශයින් රුචි කළත්, මවුපස මිත්තණිය ඇය අධෛර්යවත් කළේ ශේක්ස්පියර් 'සුදු' මිනිසෙකු බව පෙන්වා දෙමිනි. බයිබලයේ භාෂා ශෛලියේ ගීතවත් සරල බව ඇගේ සිත් ගත්තේය. පසු කලෙක ගුරුවරියක ලෙස සිය ගැටවර සිසු-සිසුවියන්ට ශිල්ප දෙනවිට මුලදීම ඇය දුන් උපදේශය වූයේ, "කියවන්න. හඬ නඟා කියවන්න. ඔබ කියවන දෙයෙහි ස්වරය, ගීතවත් බව, අරුත ඔබේ ආත්මයට ඇතුළු වන තුරු කියවන්න" කියාය. අසා සිටින්නන් ඇද බැඳ ගැනීමේ ගැඹුරු, හැඟීම් මුසු, කාව්‍යමය

බසක් ඇය සතු විය. උපමා රූපකවලින් පිරි, ප්‍රබල ගීතවත් භාෂා ශෛලිය ඇයට උරුම වූයේ බයිබලය කියවීමෙනි. ඉංග්‍රීසි බසෙහි ප්‍රබල බව හා සුන්දරත්වය පිළිබඳ ඇගේ උදාහරණ ද බයිබලයයි.

මිය යන තෙක්ම ඇය වසර ගණනාවක් උතුරු කැරොලිනාවේ වේක් ෆොරස්ට් සරසවියේ මහාචාර්යවරියක ලෙස සේවය කළාය. මේ ඇගේ කවකි.

### තනිය

වැතිරී කල්පනාවේ ගැලී
ඉඳිද්දී පෙර දා රෑ යාමයේ
නිවහනක් සොයනු කෙලෙසදැයි
මගේ ආත්මයට

ජලය පිපාසය නොව
පාන් ගෙඩියක් ගලක් නොවන

මට ආවා විසඳුමක්
මා වැරදියි විශ්වාස කරන්නේ නෑ මම

කිසිවෙකුට, කිසිම කිසිවෙකුට
මෙහෙ ඉන්න බෑ තනිවෙලා

තනිවම, තට්ට තනිවම
කිසිම කිසිවෙකුට
මෙහි දිවි ගෙවන්න බෑ.

සිය ධනය වියදම් කළ නොහෙන
ලක්ෂපතියෝ සිටිත්
බිරින්දෑත් උන්ගේ, දිවියත්
මරණයේ පෙරනිමිති ගෙන එන
භූතාත්ම වගේ.

ගයත් 'නිල්' ගී
ඔවුන්ගේ දරුවෝ
ඔවුන්ගේ ගල් හදවත් සුව කරන්නට
සිටිත් අධික මිල අය කරන වෙදැදුරෝ.

දැන් ඔබ අහගෙන ඉන්නවා නම්
ඕනෑකමින් මා මේ කියන දේ
මම කියන්නම් මා දන්නා දේ
කුණාටු වලා රොක් වේ
සුළං හමන්නට සැරසේ
දුක් විඳිති මිනිස් වග
මට ඇසෙයි කෙඳිරිය

මන්ද, කිසිවෙකුට
කිසිම කිසිවෙකුට
මෙහි ඉන්න බෑ තනිවම

තනිවම, තට්ට තනිවම

මායා ඇන්ජලෝ

මා මුලින්ම මර්කෙස් කියවන විට කිසිදු ලතින් ඇමෙරිකානු රටක සංචාරය කර නොතිබුණෙමි. එහෙත් ඔහුගේ පිටු අතර මා හොඳින් දැන සිටි යථාර්ථය හමු විය. ඉන්දියාව හා පකිස්තානය ඇසුරින් මම එය දුටුවෙමි. මර්කෙස්ගේ කර්නල්වරුන් හා ජනරාල්වරුන්, අඩු තරමින් ඔවුන්ගේ ප්‍රතිරූප මම දැන සිටියෙමි. ඔහුගේ බිෂොප්ලා මගේ මුල්ලාවරු ය. ඔහුගේ කඩවීදි මගේ වෙළෙඳපොළවල් ය. ඔහුගේ ලෝකය ස්පාඤ්ඤ බසට නැගුණු මගේ ද ලෝකය විය. මම ඊට ආදරය කළෙමි. ඔහුගේ ඉන්ද්‍රජාලයට නොවේ; එහි යථාර්ථයටය.

ඉන්දු-බ්‍රිතාන්‍ය ලේඛක සල්මන් රුෂ්ඩී

# කලාවට නිදහස!

පටු කල්පනා ඇති නිලධාරින්ගෙන්
කලා ශාස්ත්‍රාලය ඉල්ලා සිටි විට
කලාත්මක ප්‍රකාශනයේ නිදහස
අවට ඇතිවුණා ලොකු කලබලයක්
මහ ගෝසාවක්.
එහෙම වුණත් ඒ හැමටම ඉහළින්
කම්හල් සීමාවට එපිටින් ආවා
කන් පුපුරා යන අත්පොළසන් හඬ
එය ගොරහඬ නැගුවා, "නිදහස! නිදහස!!"
කලාකරුවන්ට නිදහස.
හැම තැනටම නිදහස, හැම දෙනටම නිදහස
සූරා කන්නන්ට නිදහස! යුද වැද්දන්ට නිදහස!!
නිපැයුම් සැපයුම් සන්ධානවලට නිදහස!
මා සබඳිනි, පරෙස්සමෙන්.
කලාකරුවන් හඹා එනවා මිත්‍ර ද්‍රෝහීකම
එය දිව එනමා කම්කරුවන් පසු පස
පෙට්‍රල් බෝතලයක් සඟවාගෙන
ගිනි තබන්නා ළංවෙනවා හොරෙන්, හොරෙන්
කලා ශාස්ත්‍රාලයට.
අප ඉඩකඩ ඉල්ලා සිටියා
ගොසින් ඔහු වැළඳ ගන්නට නම් නොවෙයි ඒ,
ඒ ජරා අතින් බෝතලය වට්ටන්නටයි.
සාමය සුරකින පුංචිම මනසකුත්
වටිනවා කලාවට,
යුද කලාවට පෙම් බැඳ සිටින
කලාකරුවකුට වඩා

බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(1898.02.10 - 1956.08.14)
ලෝ ප්‍රකට නාට්‍යවේදියෙකි. ජර්මානු කවියෙකි.

# පොතක වත




**මොනිකා රුවන් පතිරණ**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
පිටු 112
මිල: රු. 250/-




**ප්‍රියන්ත කොඩිප්පිලි**
සේරි ප්‍රකාශන
පිටු: 207
මිල: රු. 275/-




**කසුන් මහේන්ද්‍ර හීනටිගල**
සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන
පිටු 84
මිල: රු. 250/-




**පර්ල් ආර්. කංකානම්ගේ**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
පිටු: 136
මිල: රු. 350/-




**ඩබ්ලිව්. ජයසේන පෙරේරා**
සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන
පිටු 136
මිල: රු. 250/-




**තිස්ස කාරියවසම්**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
පිටු: 152
මිල: රු. 350/-




**නෝබට් අයගමගේ**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 436
මිල: රු. 550/-




**සේනානි ධර්මරත්න**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 386
මිල: 500/-



**හෙන්රි වර්ණකුලසූරිය**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 312
මිල: 475/-




**ශ්‍රීමා ලාලනී**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 172
මිල: රු. 350/-




**රෝහිත මුණසිංහ**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 214
මිල: රු. 375/-




**පියසිරි පී. මීගොඩ**
ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සාමාගම
පිටු: 136
මිල: රු. 300/-




**පුෂ්පා රම්ලනී**
ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්
පිටු: 142
මිල: රු. 300/-




**බණ්ඩාර වැවගෙදර**
පිටු: 72
මිල: රු. 200/-




**ඇම්. නිශ්ශංක ද සිල්වා**

සරසවි ප්‍රකාශකයෝ

පිටු: 275

මිල: 760/-




**I. Junaideen**

Publisher : Cinthani Vattam

Pages: 161

Rs: 360/-




**Nanthi**

Publishers : Punivakam, 39, 36th Lane. Colombo - 06.

Pages: 460

Rs.: 1200/-




**So Sivathas**

Publisher : Vavuniya Mental Health Society

Pages: 120

Rs: 200/-




**S. Sivalingaraja**

Publisher : Kumaran Book House

Pages: 201

Rs: 550/-




**Buddhist Publication Society**

Printed by Samayawardhana Printers




**K. Thilaganathan**

Publisher : Kumaran Book House

Pages: 96

Rs: 350/-




**Yasas V. Abeywickrama**

Dharshana Publishers

Pages: 224

Rs: 520/-

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/23

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/10/23

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*